ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

பொருளாதார அபிவிருத்தி அமைச்சு

Ministry of Economic Development

# 2013

# කාර්යසාධන වාර්තාව

# செயலாற்றுகை அறிக்கை

# PERFORMANCE REPORT

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

# කාර්යසාධන වාර්තාව

# 2013

මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව මඟින්
2002 සැප්තැම්බර් 12 දින නිකුත් කරන ලද අංක 402 දරණ රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය පරිදි
මෙම වාර්ෂික කාර්යසාධන වාර්තාව ප්‍රකාශයට පත් කරන ලදි.

මෙම වාර්තාව දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ටද පරිවර්තනය කර ඇත.

# මහින්ද චින්තන ඉදිරි දැක්ම

ඔබ සැමගේ සිතුවිලි කැටිකොට

මිනිසා ගොඩ නඟා පවුල
රකින්නටත්

පවුල ගොඩ නඟා ගම රකින්නටත්

ගම ගොඩ නඟා රට රකින්නටත්

රට ගොඩ නඟා ලොව දිනන්නටත්

''මහින්ද චින්තන'' නම් වූ

මාගේ වැඩ පිළිවෙල

ඉදිරිපත් කළෙමි.....

මගේ සිහිනය නිවහල් ජාතියකි

නිල්ල පැතිරුණු රටකි

අටුකොටු පිරුණු හෙටකි

දැහැමි මිනිසෙකි

# නායකත්වය හා මඟ පෙන්වීම

ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා
ආර්ථික සංවර්ධන අමාත්‍ය

ගරු එස්. එම්. චන්ද්‍රසේන මැතිතුමා
ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය



ගරු ආර්. මුත්තුසිවලිංගම් මැතිතුමා
ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය

ගරු එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලා මැතිතුමා
ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය

ගරු සුසන්ත පුංචිනිලමේ මැතිතුමා
ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය

## කාර්යය මණ්ඩලය

**ලේකම්**

පී.බී.ජයසුන්දර

**අතිරේක ලේකම්වරුන්**

| | | |
|---|---|---|
| චන්ද්‍රා වික්‍රමසිංහ මිය | - | විශේෂ ප්‍රජා මූලික ව්‍යාපෘති |
| හේමා ධර්මවර්ධන මිය | - | පාලන |
| ශාන්ත බණ්ඩාර | - | දිළිඳුකම අවම කිරීම හා ග්‍රාමීය සංවර්ධනය |
| ප්‍රියන්ත මායාදුන්නෙ | - | සංවර්ධන ව්‍යාපෘති හා ගොවිජන සේවා |

**අධ්‍යක්ෂ ජනරාල්වරුන්**

| | | |
|---|---|---|
| සරෝජා සිරිසේන මිය | - | විදේශීය සබඳතා |
| සුනන්ද මද්දුම බණ්ඩාර | - | සන්නිවේදන |
| ධම්ම දිසානායක | - | ප්‍රජා කේන්ද්‍රීය මූලෝපායන් සහ දිවිනැඟුම / ජනසභා |
| බී.එස්. ගුණරත්න | - | ප්‍රවර්ධන |

**ප්‍රධාන ගණකාධිකාරී**

ඩබ්. විමලසේන

**ප්‍රධාන මූල්‍ය නිලධාරී**

| | | |
|---|---|---|
| ඩබ්. ඒ. සරත් කුමාර | - | ගණකාධිකාරී |

**ප්‍රධාන අභ්‍යන්තර විගණක**

එච්. චන්ද්‍රසේන

**අධ්‍යක්ෂවරුන්**

| | | |
|---|---|---|
| ආර්. ඩී. අනුර රණසිංහ | - | අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන හා අධීක්ෂණ) |
| එච්.එම්. ජේ. හේරත් | - | අධ්‍යක්ෂ (දිවිනැගුම ) |
| එන්.ඒ.පී. නිශ්ශංක මිය | - | අධ්‍යක්ෂ (ස්වයං රැකියා) |
| එම්.සී.කේ. ධම්මිකා මිය | - | අධ්‍යක්ෂ (ගම නැගුම) |
| සී.ආර්. සූරියආරච්චි මිය | - | අධ්‍යක්ෂ (දිළිඳුකම අවම කිරීම හා සාක් වැඩසටහන) |
| එම්.අයි.ඒ. වහබ්ඩීන් | - | අධ්‍යක්ෂ (විමධ්‍යගත අයවැය) |
| එන්.බී. මොන්ටි රණතුංග | - | අධ්‍යක්ෂ (ප්‍රාදේශීය සංවර්ධන, පුරනැගුම) |
| ආර්.එච්.ඩබ්.ඒ. කුමාරසිරි | - | අධ්‍යක්ෂ (ලෝක ආහාර වැඩසටහන) |
| එච්.සී.එස්. ගුණතිලක | - | අධ්‍යක්ෂ (ඉංජිනේරු) |
| උමා නිරංජනන් මිය | - | අධ්‍යක්ෂ |
| ජයවදනී නවරත්නම් මෙය | - | අධ්‍යක්ෂ |
| ජී.ඩී.ඩී. කුමාර | - | අධ්‍යක්ෂ |

**ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරුන්**

| | | |
|---|---|---|
| කේ.එන්. කුමාරි සෝමරත්න මෙය | - | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් |
| වි. ප්‍රේමචන්ද්‍රන් | - | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් ( වැ.බ. ) |

**ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරීවරුන්**

| | | |
|---|---|---|
| එස්.යූ. චන්ද්‍රකුමාරන් | - | ගණකාධිකාරී |
| එච්.පී. ලලිත් කුමාර | - | ගණකාධිකාරී |
| පී.ආර්.එල්. වසන්ත | - | ගණකාධිකාරී |

# පෙරවදන

ආර්ථික සංවර්ධන අමාත්‍යංශය මඟින් ග්‍රාමීය, නාගරික, පළාත් හා ජාතික මට්ටමින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් රාජ්‍ය ප්‍රතිපත්ති රාමුව වන මහින්ද චින්තන ඉදිරි දැක්ම මඟින් නිරූපිත සමස්ත සංවර්ධන ක්‍රමෝපායන් උද්දීපනය කරනු ලබයි. එම උපායමාර්ගයන්ට අනුකූලව ක්‍රියාවට නංවන ලද ඵලදායි සංවර්ධන ක්‍රියාදාමයේ සංක්ෂිප්ත සටහනක් මෙහි අන්තර්ගත කර ඇත.

**සවිබල ගැන්වූ ගෘහ ආර්ථිකයක්** තුලින් සෞඛ්‍ය සම්පන්න හා පෝෂණයෙන් සපිරි ජනතාවක්, දිළිඳුකමින් තොර ඉහළමැදි ආදායම්ලාභී ආර්ථිකයක් සහ පාරිසරික සුරක්ෂිත බවින් සපිරි රටක් ගොඩනැඟීමේ අභිප්‍රායන් පෙරදැරිව ක්‍රියාත්මක වන **දිවි නැඟුම ජාතික වැඩසටහනේ පස්වැනි අදියර** 2013 වර්ෂයේදී ක්‍රියාත්මක විය. දිවි නැඟුම ජාතික වැඩසටහනින් අපේක්ෂිත අරමුණු වඩාත් ප්‍රතිඵලදායී හා විධිමත්ව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සංවිධාන ජාලය ස්ථාපිත කිරීම සඳහා දිවි නැඟුම සංවර්ධන දෙපාර්තමේන්තුව ආරම්භ කිරීමේ මූලික කටයුතු 2013 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලදි.

ග්‍රාමීය ප්‍රජාවගේ ජීවනෝපාය කටයුතු සඳහා අවශ්‍ය වන ග්‍රාමීය ආර්ථික හා සමාජීය යටිතල පහසුකම් සංවර්ධනය, සාරධර්ම වර්ධනය උදෙසා විවිධ වැඩසටහන් **ගම නැඟුම වැඩසටහන** යටතේ 2013 වර්ෂයේදී ද ක්‍රියාත්මක විය. ඒ යටතේ විදුලිය, ජලය, සුළු වාරිමාර්ග, ග්‍රාමීය සෞඛ්‍ය හා සනීපාරක්ෂක පහසුකම්, ප්‍රාථමික අධ්‍යාපන පහසුකම් මෙන්ම ග්‍රාමීය ජීවනෝපාය හා අධ්‍යාත්මික සංවර්ධනය උදෙසා වූ ව්‍යාපෘතීන් ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් ක්‍රියාත්මක විය. ගම නැඟුම ව්‍යාපෘතීන් වඩාත් ඵලදායිව ක්‍රියාත්මක කිරීම උදෙසා නවක උපාධිධාරීන්, ආර්ථික සංවර්ධන නිලධාරීන් ලෙස සේවය සඳහා යොදවා ගන්නා ලදි.

ගමෙන් එපිට නාගරිකව ජීවත්වන ජනතාවට සංවර්ධනයේ ප්‍රතිඵල වඩාත් ඵලදායිව භුක්ති විඳීමට අවශ්‍ය නාගරික පහසුකම් සපුරාලීම සඳහා වූ **පුර නැඟුම වැඩසටහන** 2013 වර්ෂයේදී ක්‍රියාත්මක කෙරිණි. ඒ යටතේ ශාරීරික සුවතා මංතීරු, ක්‍රීඩා පිටි හා මහජන උද්‍යාන, විධිමත්ව සැකසූ නාගරික මාර්ග පද්ධති සහ පදික වේදිකාවන් ඉදිකිරීමත්, නිරෝගිමත් ජනතාවක් හා සෞඛ්‍ය සම්පන්න ඉදිරි පරපුරක් බිහිකිරීමේ ප්‍රාර්ථනයෙන් මාතෘ සායන මධ්‍යස්ථාන වැනි නාගරික පහසුකම් ඇතිකිරීමත් මෙම වැඩසටහන යටතේ ක්‍රියාත්මක විය.

සියළුම පළාත් ආර්ථික වර්ධනයට සක්‍රීය ලෙස දායක කර ගැනීමේ පරමාර්ථයෙන් පළාත් 9 තුළම සංවර්ධන වැඩසටහන් 09ක් ක්‍රියාත්මක කෙරිණි. මෙම **ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන්** යටතේ විශේෂිත වෙළෙඳ මධ්‍යස්ථාන, නාගරික සම්බන්ධතා මෙන්ම යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක විය. විශේෂයෙන්ම ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා පළාත් මාර්ග හා අන්තර් පළාත් මාර්ග ජාලය ශක්තිමත් කිරීම මෙම වැඩසටහන් යටතේ ක්‍රියාවට නංවන ලදි.

දේශීය පෞද්ගලික ආයෝජන දිරි ගැන්වීම මෙන්ම **සංචාරක ක්ෂේත්‍රයේ සංවර්ධනය**ද ජාතික ආර්ථික තලයේදී ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයට අනුබද්ධ විෂයයන් වේ. විශේෂයෙන්ම සංචාරක ක්ෂේත්‍රය තුළ ඇති වූ ප්‍රසාරණය ප්‍රශංසනීය වේ. ඒ සඳහා අවශ්‍ය වූ මඟ පෙන්වීම හා නෛතික පසුබිම ස්ථාපිත කිරීමට කටයුතු කරන ලදි. නිසි මඟ පෙන්වීම තුළ සංචාරක නිෂ්පාදන, සංචාරක ප්‍රවර්ධනය හා සංචාරක ක්ෂේත්‍රයට අවශ්‍ය මානව සම්පත් සංවර්ධනය උදෙසා අමාත්‍යාංශය විසින් තමන් යටතේ වූ සංචාරක ක්ෂේත්‍රයට අදාළ ආයතන මෙහෙයවන ලදි. පෞද්ගලික ආයෝජන පෙළඹවීම මඟින් ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීමට අවශ්‍ය වැඩපිළිවෙළ හා මඟ පෙන්වීමද අමාත්‍යාංශය විසින් ඉටු කරනු ලැබීය.

# නැගී එන ආර්ථිකය සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යංශයේ මැදිහත්වීම



# පටුන


| | පිටු අංක |
|---|---|
| **1. දිවි නැගුම - සවිබල ගෘහ ආර්ථිකයක්** | **1 - 16** |
| 1.1 කෘෂිකර්ම අංශය | 2 - 3 |
| 1.2 පශු සම්පත් අංශය | 4 |
| 1.3 ධීවර අංශය | 5 - 6 |
| 1.4 ව්‍යවසාය සංවර්ධන අංශය | 6 - 10 |
| 1.5 දිවිනැගුම වැඩසටහනේ බලපෑම | 11 |
| 1.6 දිවිනැගුම වැඩසටහනේ ජයග්‍රහණ | 12 |
| 1.7 සමාජ ආරක්ෂණය - සමෘද්ධි වැඩසටහන | 14 - 16 |
| **2. ගම නැගුම - සවිබල ගැන්වුන ප්‍රජාවක්** | **17- 43** |
| 2. ගම නැගුම වැඩසටහන- සවිබල ගැන්වුන ප්‍රජාවක් | 17 - 19 |
| 2.1 ග්‍රාමීය මාර්ග සංවර්ධනය | 20 |
| 2.2 සුළු පරිමාණ වාරිමාර්ග සංවර්ධනය | 21 |
| 2.3 නිරෝගී පරපුරක් බිහිකිරීම උදෙසා ප්‍රජා ජල සම්පාදනය | 22 |
| 2.4 මාතෘ හා ළමා සෞඛ්‍ය සායන පහසුකම් සැලසීම | 23 |
| 2.5 බුද්ධිමත් ක්‍රියාශීලී දරු පරපුරක් උදෙසා පෙර පාසල් සංවර්ධනය | 24 |
| 2.6 ග්‍රාමීය ගොඩනැගිලි පහසුකම් සංවර්ධනය | 25 |
| 2.7 ක්‍රීඩා පිටි /උද්‍යාන පහසුකම් සංවර්ධනය | 26 |
| 2.8 ජයග්‍රහණ, අභියෝග හා විසඳුම් | 27 |
| 2.9 සංවර්ධනය උදෙසා ග්‍රාම සභා | 28 - 29 |
| 2.10 විමධ්‍යගත අයවැය වැඩසටහන | 30 - 32 |
| 2.11 මහින්ද චින්තන ඉදිරි දැක්ම - පුනර්ජීවන වැඩසටහන යටතේ ප්‍රාථමික පාසල් 5000ක් සංවර්ධනය කිරීමේ වැඩසටහන | 33- 36 |
| 2.12 ප්‍රජා අවශ්‍යතා හඳුනා ගැනීමේ ජනතා සත්කාරය හා ජංගම සේවා | 37 - 40 |
| 2.13 සමාද්ධිමත් ගමක් උදෙසා බල මුළු ගැන්වූ තරුණ ජවය | 41 - 43 |
| **3. පුර නැගුම - පරිසර හිතකාමී නාගරික පරිසරයක්** | **44-49** |
| 3.1 නිරෝගී පරපුරක් බිහිකිරීම උදෙසා ළමා හා මාතෘ සායන මධ්‍යස්ථාන සංවර්ධනය | 45 - 46 |
| 3.2 අලෙවි/පාරිභෝගික දෙපාර්ශවයටම ප්‍රතිලාභ සැලසෙන සති පොළ සංවර්ධනය | 46 - 48 |
| 3.3 සමබර ශාරීරික හා මානසික සෞඛ්‍ය සංවර්ධනයට සුවතා මංතීරු | 48 - 49 |
| 3.4 සුන්දර විවේකයක් ගතකිරීමට දියත උයන | 49 |
| **4. ප්‍රාදේශිය වර්ධන මධ්‍යස්ථාන - පැතිරුනු සංවර්ධනයක්** | **50 - 80** |
| 4.1 ගම හා නගරය යා කරමින් ක්‍රියාත්මක වන මාර්ග හා පාලම් සංවර්ධන වැඩසටහන් | 51 - 57 |
| 4.2 අත්හැර දමන ලද හෝ අසම්පූර්ණ රජයේ දේපළ ප්‍රතිසංස්කරණය මගින් ප්‍රජාවට ප්‍රතිලාභ | 58 - 59 |
| 4.3 කෘෂිකර්මය | 59 - 64 |
| 4.4 සෑම පවුලක් සඳහාම නිවසක් | 64 - 65 |
| 4.5 නීරෝගී ප්‍රජාවක් වෙනුවෙන් ජල සම්පාදනය හා සනීපාරක්ෂාව | 66 - 68 |
| 4.6 විදුලිය හා බලශක්ති | 68 |
| 4.7 සිවිල් පරිපාලනය ශක්තිමත් කිරීම | 69 |
| 4.8 සමාජීය යටිතල පහසුකම් සංවර්ධනය | 70 - 73 |
| 4.9 ජීවනෝපාය සංවර්ධනය | 74 - 75 |
| 4.10 ධාරිතා සංවර්ධනය | 76 |
| 4.11 බිම් බෝම්බ ඉවත්කිරීමේ වැඩසටහන | 77 - 79 |
| 4.12 සංවර්ධනය සඳහා ලෝක ආහාර වැඩසටහනෙහි දායකත්වය | 80 |
| **5. උපාය මාර්ගික මූලාරම්භයන් - නැගී එන ආර්ථිකයක්** | **81 - 91** |
| 5.1 සංචාරක පහසුකම් සංවර්ධනය | 82 - 85 |
| 5.2 සංචාරක කටයුතු ප්‍රවර්ධනය | 85 - 90 |
| 5.3 සංචාරක ක්ෂේත්‍රයේ මානව සම්පත සංවර්ධනය කිරීම | 91 |
| **6. ගිණුම , මූල්‍ය, අභ්‍යන්තර විගණන හා මානව සම්පත්** | **92 - 109** |
| **7. විගණකාධිපති විමසුම් හා නිරීක්ෂණ** | **110 - 112** |

# 1

# දිව් නැඟුම - සම්බල ගෘහ ආර්ථිකයක්

# 1. දිවි නැඟුම ජාතික වැඩසටහන

රජයේ සංවර්ධන වැඩපිළිවෙල වන මහින්ද චින්තන ඉදිරි දැක්ම යතාර්ථයක් බවට පත් කරමින් ක්‍රියාත්මක වන සංවර්ධන වැඩසටහන් අතර "ඉසුරුමත් නිවහනක් - අසිරිමත් මව්බිමක් "යන තේමාව මත පදනම්ව 2011 වර්ෂයේදී ගෘහ ආර්ථික ඒකක දසලක්ෂයක් ඉලක්ක කරගනිමින් ආරම්භ කරන ලද දිවිනැඟුම වැඩසටහන ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රධාන ජාතික සංවර්ධන වැඩසටහනක් ලෙස 2013 වසරේදීද සාර්ථකව ක්‍රියාත්මක කරන ලදී.




## දිවිනැඟුම වැඩසටහන පැමිණි ගමන්මග

**පළමු අදියර**
- 2011.03.12
- ගෘහ ඒකක 1,000,000

**දෙවන අදියර**
- 2011.10.27
- ගෘහ ඒකක 2,100,000

**තෙවන අදියර**
- 2012.04.05
- ගෘහ ඒකක 2,500,000

**සිව්වන අදියර**
- 2012.10.22
- ගෘහ ඒකක 5,000,000

**පස්වන අදියර**
- 2013.10.11
- ගෘහ ඒකක 2,500,000

ගෘහ ඒකක සවිබල ගැන්වීම උදෙසා වූ මෙම දිවි නැඟුම ජාතික වැඩසටහන මේ වන විට අදියර 05 ක් යටතේ ක්‍රියාත්මක කර ඇත. කෘෂිකාර්මික, පශු සම්පත් , ධීවර හා ව්‍යවසාය සංවර්ධන යන ක්ෂේත්‍ර යටතේ ගෘහ ඒකක සඳහා ප්‍රතිලාභ ලබා දී ඇති අතර කෘෂිකාර්මික ක්ෂේත්‍රය යටතේ පමණක් එක් අදියරකදී රෝපණ ද්‍රව්‍ය ලබා දුන් ප්‍රතිලාභින් සඳහා නැවතත් එම ප්‍රතිලාභ ලබා දීමට කටයුතු කර ඇත.

2012 වසරේදී සියලුම පවුල් ඉලක්ක කර ගනිමින් දිවි නැඟුම ජාතික වැඩසටහන ක්‍රියාත්මක කරන ලද අතර පෙර වසරවලදී ලද අත්දැකීම් පාදක කර ගෙන 2013 වසරේදී තෝරාගත් ප්‍රතිලාභින් සඳහා පමණක් වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී.

## ආවරණය වන ප්‍රධාන ක්ෂේත්‍ර

කෘෂිකාර්මික අංශය

පශු සම්පත් අංශය

ධීවර අංශය

ව්‍යවසාය සංවර්ධන අංශය

2013 අයවැය මඟින් සමස්ථ දිවිනැඟුම ජාතික වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා රු.මි. 2,350.0 ක ප්‍රතිපාදන ලබා දී ඇත. 2013.12.31 දිනට සමස්ථ වියදම රු.මි. 2349.04 කි. දිවි නැඟුම වැඩසටහනට අදාළ රේඛීය අමාත්‍යාංශ, අනෙකුත් ආයතන හා පෞද්ගලික අංශයේ ද සහාය හා තාක්ෂණික මඟපෙන්වීම ඇතිව 2013 වසරේ අපේක්ෂිත වැඩසටහන් අදාල ක්ෂේත්‍ර යටතේ සාර්ථකව නිම කරන ලදී.

### 1.1 කෘෂිකාර්මික අංශය

2013 වර්ෂය සඳහා අදාල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කෘෂිකාර්මික අංශය සඳහා රු.මි. 900.0 ක ප්‍රතිපාදන ලබා දී ඇත.

**කෘෂිකාර්මික අංශයේ ප්‍රගතිය - 2013.12.31 දිනට**

වගු අංක 1.1.1

| බෙදා දුන් ද්‍රව්‍ය | සංඛ්‍යාව |
|---|---|
| බීජ කට්ටල | 1,423,930 |
| මිටි මුරුංගා පැල | 741,446 |
| පොල් පැල | 2,071,714 |
| පළතුරු පැල | 4,735,624 |
| සුළු අපනයන භෝග පැල | 1,490,161 |
| වැවිලි බෝග පැල | 1,534,225 |
| වෙනත් පැල | 8,140 |
| ආරක්ෂිත දැල් ගෘහ | 421 |
| මී මැසි පාලන ව්‍යාපෘති | 279 |
| විසිතුරු මල් වගා ව්‍යාපෘති | 211 |
| ආදර්ශ ගෙවතු | 109,991 |
| බිම්මල් වගා ව්‍යාපෘති | 75 |
| සුළු අපනයන බෝග - ගෘහස්ථ /වාණිජ වගා ඒකක, | 1,414 |

**සමස්ථ වියදම රු.මි. 796.21**

## දිවි නැඟුම පස්වන අදියර ක්‍රියාත්මක කරමින්

පොල් පැල බෙදාදීම
හබරාදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය,
ගාල්ල දිස්ත්‍රික්කය

දිවි නැඟුම පස්වන අදියරේ සමාරම්භක
උත්සවය සමරමින් බීජ වගා කිරීම
වවුනියා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය,
වවුනියා දිස්ත්‍රික්කය

**ගොවියාට හා පාරිභෝගිකයාට සහනයක් සැපයීමේ අපේක්ෂාවෙන්**
**ලොකු ඒෑණු ගබඩා ඉදිකිරීම.**
**විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය, මාතලේ දිස්ත්‍රික්කය**

### මාතලේ දිස්ත්‍රික්කය
### 2013.12.31 දිනට ප්‍රගතිය

වගු අංක 1.1.2

| ප්‍රදේශීය ලේකම් කොට්ඨාශය | වෙන් කරන ලද ප්‍රතිපාදන (රු.මි.) | ඉලක්ක ගත ව්‍යාපෘති සංඛ්‍යාව | නිම කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව | 2013.12.31 දිනට වියදම (රු.මි.) |
|---|---|---|---|---|
| විල්ගමුව | 0.4 | 4 | 4 | 0.4 |
| ගලේවෙල | 2.2 | 22 | 19 | 1.9 |
| දඹුල්ල | 3.7 | 37 | 34 | 3.4 |
| නාඋල | 3.5 | 35 | 29 | 2.9 |
| ලග්ගල | 0.2 | 2 | 2 | 0.2 |
| **එකතුව** | **10.0** | **100** | **88** | **8.8** |

## 1.2 පශු සම්පත් අංශය

පශු සම්පත් සංවර්ධනය දිවි නැඟුම ජාතික වැඩසටහනේ තවත් වැදගත් අංගයකි. ශ්‍රී ලංකාවේ ළමා පරපුර අතර පවතින මන්ද පෝෂණය හා ප්‍රෝටීන ඌනතාවය අවම කිරීම මෙමඟින් අපේක්ෂා කරන ලදී. ඒ අනුව පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය හරහා ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක කළ අතර එමඟින් රටේ ආර්ථික සංවර්ධනයටද සෘජු දායකත්වයක් ලබා දී ඇත.

2013 වර්ෂයේදී පශු සම්පත් සංවර්ධනය සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය රු.මි. 356.7 ක ප්‍රතිපාදන ලබා දී ඇත.

### පශු සම්පත් අංශයේ ප්‍රගතිය - 2013.12.31 දිනට

වගු අංක 1.2.1

| ක්‍රියාකාරකම | සංඛ්‍යාව | වියදම රු.මි. |
|---|---|---|
| කිකිළි පැටවුන් බෙදා දීම | 358,193 | 136.94 |
| කිරි ගවයින් ලබා දීම | 279 | |
| එළුවන් බෙදා දීම | 529 | |
| ගවගාල් සකස් කිරීම | 1077 | |
| ඌරන් පාලනය | 90 | |
| සත්ත්ව ආහාර හා තෘණ වගා ව්‍යාපෘති | 395 | |

*දිවි නැඟුම වැඩසටහන යටතේ කුකුළු පැටව් ලබා දීම*
*හබරාදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය, මාතර දිස්ත්‍රික්කය*

### නැවුම් දියර කිරි ප්‍රචලිත කිරීමේ විශේෂ ව්‍යාපෘතිය

උසස් තත්ත්වයෙන් යුත් දේශීය කිරි නිෂ්පාදන සැකසීම, දියර කිරි භාවිතය ජනතාව හා පාසල් ළමුන් අතර ප්‍රචලිත කිරීම, පෝෂණය ඉහළ නැංවීම සහ කිරි නිෂ්පාදකයින්ගේ ආදායම් වර්ධනය කිරීමේ අපේක්ෂාවෙන් ප්‍රංශ රජයේ අනුග්‍රහය යටතේ කිරි නිෂ්පාදකයින්ගේ සමිති සඳහා අඩු පොළී ණය පදනම මත උපකරණ ලබාදීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන ලදී.

තවද සත්ව පාලනයට ලැදි දිවි නැඟුම ප්‍රතිලාභින් පුහුණු කිරීම සඳහා ප්‍රයෝජනයට ගැනීමේ අපේක්ෂාවෙන් සබරගමුව විශ්වවිද්‍යාලයේ පශු සම්පත් ඒකකයේ යටිතල පහසුකම් සංවර්ධන කටයුතු සඳහා රු.මි. 1.8 ක ප්‍රතිපාදන ලබා දී ඇත.

*දිවි නැඟුම වැඩසටහන යටතේ ක්‍රියාත්මක වන එළු පාලන ව්‍යාපෘතියක්*
*වවුනියා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය, වවුනියා දිස්ත්‍රික්කය*

## 1.3 ධීවර අංශය

ධීවර ක්ෂේත්‍රය ආශ්‍රිත ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම දිවි නැඟුම ජාතික ව්‍යාපාරයේ තවත් ප්‍රධාන අංශයක් වේ. මත්ස්‍ය නිෂ්පාදන හරහා රටේ ජනතාවගේ පෝෂණ මට්ටම ඉහළ නැංවීමත්, එම නිෂ්පාදන අලෙවිය හරහා ආර්ථිකය ශක්තිමත් කිරීමත් මින් අපේක්ෂා කෙරේ .

2013 වර්ෂයේදී ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් ධීවර අංශය සඳහා රු.මි. 143.33 ප්‍රතිපාදන ලබා දී ඇති අතර 2013.12.31 දිනට වියදම රු.මි. 111.95 කි.

### ධීවර අංශයේ භෞතික ප්‍රගතිය - 2013.12.31 දිනට

වගු අංක 1.3.1

| ව්‍යාපෘතිය | ව්‍යාපෘති ආරම්භ කර ඇති ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|
| විසිතුරු මත්ස්‍ය වගාව (නව) | 966 |
| විසිතුරු මත්ස්‍ය වගාව (වැඩිදියුණු කිරීම) | 478 |
| පොකුණු තුළ ආහාර පිණිස මත්ස්‍ය වගාව | 669 |
| ඒකාබද්ධ මත්ස්‍ය වගාව | 138 |
| පොකුණු තුළ ඇසිත්තන් ඇඟිල්ලන් දක්වා වර්ධනය කිරීම | 5 |
| මොදා මසුන් වගාව | 121 |
| මිරිදිය දුම් කරවල නිෂ්පාදනය | 84 |
| වතු ජලාශවල මත්ස්‍ය වගාව | 11 |
| කාලීන ජලාශවල මත්ස්‍ය වගාව | 160 |
| **එකතුව** | **2632** |

දිවි නැඟුම වැඩසටහන යටතේ ධීවර ව්‍යාපෘති ආරම්භ කිරීමෙන් පසු දේශීය කරවල නිෂ්පාදනය මෙ.ටො. 6000 කින් පමණ වැඩි වී ඇත. එමෙන්ම දිවි නැඟුම ජල ජීවී වැඩසටහන යටතේ පසුගිය වසර 03 තුළදී ව්‍යාපෘති 6,629 ක් සඳහා ප්‍රතිලාභීන් 13,100 ක් දායක කරගෙන ඇත. පොකුණු තුල මිරිදිය මසුන් වර්ධනය කිරීමෙන් පැටව් මිලියන 38.62 ක් ද විසිතුරු මත්ස්‍ය වගාවෙන් පැටව් මිලියන 21.96 ක් ද, නිපදවීමෙන් වටිනාකම අනුපිළිවෙලින් රු.මි. 72.53 ක් හා රු.මි. 12.45 න් ජාතික ආර්ථිකයට එක් කර ඇත. පොකුණු තුළ මසුන් වගාවෙන් සහ කාලීන ජලාශවල මසුන් වගා කිරීමෙන් මෙ.ටො.10,573 ක මත්ස්‍ය නිෂ්පාදනයක් සිදු කිරීමෙන් සමස්ථ මිරිදිය ජාතික නිෂ්පාදනයට 15% ලබා දී ඇත. දිවි නැඟුම ජල ජීවී වැඩසටහන තුළින් ජාතික ආර්ථිකයට රු.මි. 1,613 ක ආදායමක් ප්‍රතිලාභින් විසින් ලබා ගෙන ඇත.

ඒකාබද්ධ මත්ස්‍ය වගාව
වලල්ලාවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය
කළුතර දිස්ත්‍රික්කය



දුම්කරවල නිෂ්පාදන ව්‍යාපෘතියක්
තණමල්විල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය
මොණරාගල දිස්ත්‍රික්කය

## 1.4 ව්‍යවසාය සංවර්ධන අංශය

ගෘහස්ථ කර්මන්ත ආරම්භ කිරීමට අනුබල දීමෙන් හා ප්‍රවර්ධනය කිරීමෙන් අඩු ආදායම්ලාභී පවුල් වල ආදායම් මට්ටම් ඉහළ නංවා රටේ ආර්ථික අභිවෘද්ධිය ගොඩනැගීම සඳහා සුවිශේෂී කාර්යභාරයක් ව්‍යවසාය සංවර්ධන අංශය මගින් ඉටු කරන ලදී.

### ගෘහ කර්මාන්ත සංවර්ධන වැඩසටහන

ගෘහස්ථ කර්මාන්ත ආරම්භ කිරීම හා ප්‍රවර්ධනය කිරීම මගින් පවුලේ ආර්ථිකය ඉහළ නැංවීමේ අපේක්ෂාවෙන් ව්‍යවසායකයින් සංවර්ධනය කිරීමට අවශ්‍ය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම සඳහා අමාත්‍යාංශය විසින් 2013 වසරේදී රු.මි. 50.0 ප්‍රතිපාදන ලබා දී ඇත. එමගින් පහත සඳහන් කර්මාන්ත වල නියැලී සිටින ව්‍යවසායකයින් හා නව ව්‍යවසායකයින් හඳුනාගෙන ඔවුන්ගේ ව්‍යවසායකත්වය සංවර්ධනය කිරීමට අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

- ඇඟළුම් නිෂ්පාදනය
- බතික් කර්මාන්තය
- පොල් ආශ්‍රිත නිෂ්පාදන
- ආහාර පාන නිෂ්පාදන
- අභ්‍යාස පොත්
- කඩදාසි නිෂ්පාදන
- තල් ආශ්‍රිත නිෂ්පාදන
- සම් ආශ්‍රිත නිෂ්පාදන
- කිතුල් ආශ්‍රිත නිෂ්පාදන

2013 වර්ෂයේදී ප්‍රතිලාභීන් 4,251 ක් පුහුණු කර ඇති අතර 6,246 දෙනෙකුට ඔවුන්ගේ කර්මාන්ත සඳහා අවශ්‍ය යෙදවුම් ලබා දී ඇත. මේ සඳහා 2013.12.31 දිනට රු.මි. 47.8 ක් වැය කර ඇත.

දිවි නැඟුම ව්‍යාපෘතිය යටතේ කර්මාන්ත
ආරම්භ කරීම සඳහා උපකරණ ලබා දීම
වවුනියා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය
වවුනියා දිස්ත්‍රික්කය

දිවි නැඟුම ව්‍යාපෘතිය යටතේ කර්මාන්ත
ආරම්භ කිරීම සඳහා උපකරණ ලබා දීම.
හබරාදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය,
ගාල්ල දිස්ත්‍රික්කය

## අවිධිමත් ආර්ථික ක්‍රියාකාරකම්වල යෙදෙන්නන් විධිමත් කර දිවි නැඟුම ව්‍යවසායකයින් බවට පත්කිරීම

මෙම වැඩසටහන යටතේ දිවයින පුරා බස් රථ, බස් පර්යන්ත, දුම්රිය හා දුම්රිය ස්ථාන ආශ්‍රිතව අවිධිමත් ලෙස ජංගම වෙළඳාමේ යෙදෙන සුළු වෙළඳුන් 2050 ක් දැනුවත් කිරීමට හා ඔවුන්ට හැඳුනුම් පත් සහ නිල ඇඳුම් ලබා දී ඔවුන්ගේ ආර්ථික ක්‍රියාකාරකම් විධිමත් කිරීමට කටයුතු කර ඇත. මේ වන විට දැනුවත් කිරීමේ වැඩමුළු 4 ක් පවත්වා ඇත.

*අතිගරු ජනාධිපතිතුමා විසින් ජංගම සුළු වෙළඳුන් වෙත හැඳුනුම්පත් හා නිල ඇඳුම් බෙදා දීම*

දිවි නැඟුම වැඩසටහනට සමගාමීව ක්‍රියාත්මක ජංගම වෙළඳ රථ ලබා දීමේ වැඩසටහන යටතේ 2013 වර්ෂයේ දී ලොරි රථ 20 ක් ලබා දී ඇත. ඒ අනුව 2011 වර්ෂයේ සිට 2013.12.31 දින වන විට ජංගම වෙළඳ රථ 441 ක් ලබා දී ඇත. මෙම රථලාභින් ඒ ආශ්‍රිතව විවිධ ස්වයං රැකියාවල නිරත වන අතර එම වැඩසටහන ඔවුන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමට හේතු වී ඇත.

*දිවි නැඟුම ප්‍රතිලාභීන්ගේ අතිරික්ත නිෂ්පාදන අලෙවි කර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද පොළක්, අඹගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය, නුවරඑළිය දිස්ත්‍රික්කය*

## රණවිරු දිවි නැඟුම ස්වයං රැකියා විශේෂ ණය යෝජනා ක්‍රමය

රණවිරු දිවි නැඟුම වැඩසටහන යටතේ 2013 වර්ෂය සඳහා රු.මි. 175.0 ක් වෙන් කර ඇති අතර අමතර මුදල ප්‍රතිපූරණය කර ගැනීමේ පදනම මත 2013.12.31 දින වන විට මෙම වැඩසටහන යටතේ 480 දෙනෙකු සඳහා රු.මි. 213.74 ක ණය මුදලක් ප්‍රාදේශීය සංවර්ධන බැංකුව මඟින් ප්‍රදානය කර ඇත.

### ස්වයං රැකියා විශේෂ ණය යෝජනා ක්‍රමයේ ප්‍රගතිය - 2013.12.31 දිනට

වගු අංක 1.4.1

| | නව ස්වයංරැකියා ආරම්භ කිරීම | ස්වයංරැකියා වැඩි දියුණු කිරීම |
|---|---|---|
| ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 260 | 220 |
| ලබා දුන් ණය මුදල (රු.මි.) | 118.16 | 95.58 |

## කිතුල් නිෂ්පාදන සංවර්ධන වැඩසටහන

සම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය මඟින් ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ සහාය ඇතිව කර්මාන්ත සඳහා විභවතාවයක් පවතින රත්නපුර, කෑගල්ල, මහනුවර, නුවර එළිය, මාතලේ, බදුල්ල, මොණරාගල, කළුතර, මාතර, හම්බන්තොට, අම්පාර, ගම්පහ, ගාල්ල හා කුරුණෑගල යනාදී දිස්ත්‍රික්ක 14 ක කිතුල් කාර්මාන්තයේ නියැලෙන්නන් හා කිතුල් ව්‍යවසායකයන් සංවර්ධනය කිරීම මෙම වැඩසටහන මඟින් අපේක්ෂා කරන ලදී.

## කිතුල් නිෂ්පාදන වැඩසටහනේ ප්‍රගතිය - 2013.12.31 දිනට

වගු අංක 1.4.2

| ක්‍රියාකාරකම | භෞතික ප්‍රගතිය (ඒකක/ප්‍රතිලාභීන්) | වියදම (රු.මි) |
|---|---|---|
| ආරක්ෂිත බඳපටි ලබා දීම | 1500 | 4.96 |
| අඩු වියදම් ලිප් ලබා දීම | 200 | 5.02 |
| තාච්චි ලබා දීම | 200 | 2.66 |
| පුහුණු හා ආරක්ෂිත උපකරණ | 235 | 0.97 |

*කිතුල් ව්‍යවසායකයින් නගාසිටුවීම සඳහා අඩු වියදම් ලිප් ලබාදීම. පාලින්ද නුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය, කළුතර දිස්ත්‍රික්කය*

*කිතුල් ව්‍යවසායකයින් සඳහා ලබාදුන් ආරක්ෂිත බඳපටි හා උපකරණ පැළැඳ කිතුල් කර්මාන්තයේ නියැලීම. පාලින්දනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය, කළුතර දිස්ත්‍රික්කය*

*කිතුල් ආශ්‍රිත නිෂ්පාදනයක් ලෙස විනාකිරි නිෂ්පාදනය සහ දිවිනැගුම ව්‍යාපෘතිය යටතේ කිතුල් කර්මාන්තකරුවන්ගේ සමිතිය මගින් පවත්වාගෙන යනු ලබන කිතුල් නිෂ්පාදන අලෙවි මධ්‍යස්ථානය. මාගෙදර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය, ගාල්ල දිස්ත්‍රික්කය*

## දිවි නැඟුම ව්‍යවසායකත්ව ගම්මාන සංවර්ධනය කිරීම

ගම්පහ දිස්ත්‍රික්කයේ අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වීරගුල ගම්මානයේ මැටි අඹරන යන්ත්‍රයක් ස්ථාපනය කරන ලදී. 2013.12.31 දිනට වියදම රු.මි.0.59 කි.

හම්බන්තොට දිස්ත්‍රික්කයේ තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී වසම් පහක ප්‍රතිලාභීන් 43 දෙනෙකු සඳහා ලණු ඇඹරීමේ යන්ත්‍ර 43 ක් ලබා දී ඇත. 2013.12.31 දිනට වියදම රු.මි. 0.43 කි.

## අත්යන්ත්‍ර රෙදිපිළි ගම්මාන වැඩසටහන

අත්යන්ත්‍ර රෙදිපිළි ගම්මාන නඟා සිටුවීමේ වැඩසටහන සඳහා 2013 වසරේ දී රු.මි. 30.0 ක ප්‍රතිපාදන ලබා දී ඇත. ඒ අනුව බදුල්ල, අනුරාධපුරය, කෑගල්ල, පුත්තලම, කුරුණෑගල, ගාල්ල, කලුතර, මඩකලපුව, මහනුවර, සහ මුලතිව් යන දිස්ත්‍රික්ක වල අත්යන්ත්‍ර පේෂකර්මාන්ත මධ්‍යස්ථාන නවීකරණය කිරීම, අත්යන්ත්‍ර උපකරණ, අමුද්‍රව්‍ය මිලදී ගැනිම, සේවා අවස්ථා පුළුල් කරලීම උදෙසා නව ශිල්පීන් බඳවා ගැනිම යනාදී කටයුතු සිදු කිරීම සඳහා 2013.12.31 දිනට රු.මි. 17.4 ක් වැය කර ඇති අතර මඩම්පැල්ල පේෂකර්ම ව්‍යාපෘතියට රු.මි. 1.22 ක් වටිනා අමුද්‍රව්‍ය සපයා ඇත.

## රැකියා විරහිත කාන්තාවන් සඳහා ඉන්දියානු සාරි එම්බ්‍රොයිඩර් පුහුණුව ලබා දීම.

මෙම වැඩසටහන යටතේ ගම්පහ දිස්ත්‍රික්කයේ රැකියා විරහිත කාන්තාවන් සඳහා ඉන්දියානු සාරි, කුර්තා, බ්ලවුස් හා අබායා එම්බ්‍රොයිඩර් කිරීමේ පාඨමාලා පවත්වා ඇති අතර රැකියා විරහිත කාන්තාවන් 60 දෙනකු අඛණ්ඩව මෙම පුහුණුව සඳහා සහභාගී වී ඇත. මෙම වැඩසටහන සඳහා 2013 වසර්දී රු.මි. 3.86 ක ප්‍රතිපාදන ලබා දී ඇති අතර 2013.12.31 දිනට රු. මි. 3.31 වැය කර ඇත.

### රැකියා විරහිත කාන්තාවන් සඳහා පුහුණු ලබා දීමේ ප්‍රගතිය - 2013.12.31 දිනට

වගු අංක 1.4.3

| විස්තරය | නිපදවීමට එකඟ වූ ඒකක ගණන | මේ වන විට නිපදවා ඇති ඒකක ගණන |
|---|---|---|
| ඉන්දියානු සාරි මෝස්තර නිර්මාණය | 400 | 300 |
| කුර්තා බ්ලවුස් නිර්මාණය | 1000 | 750 |
| අබායා ඇඳුම් නිර්මාණය | 300 | 150 |

- **දිවි නැඟුම ක්ෂුද්‍ර මූල්‍ය ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම**

2013.01.01 දින සිට 2013.12.31 දින දක්වා දිවි නැඟුම ක්ෂුද්‍ර මූල්‍ය ණය යෝජනා ක්‍රමය යටතේ බැංකු මඟින් ලබා දී ඇති ණය මුදල් පිළිබඳ සාරාංශය පහත දක්වා ඇත.

**දිවි නැඟුම ක්ෂුද්‍ර මූල්‍ය ණය යෝජනා ක්‍රමයේ ප්‍රගතිය- 2013.12.31 දිනට**

වගු අංක 1.4.4

| අංශය | ව්‍යාපෘති / ණය සංඛ්‍යාව | වටිනාකම රු.මි. |
|---|---|---|
| කෘෂිකර්මාන්තය | 113,652 | 10,135.3 |
| ධීවර | 3,811 | 605.3 |
| පශු සම්පත් | 50,377 | 1,048.3 |
| ගෘහ කර්මාන්ත | 53,850 | 3,702.9 |
| සේවා හා වෙනත් | 91,484 | 8,915.4 |
| **එකතුව** | **313,174** | **24,407. 2** |

**අඩු ආදායම්ලාභී පවුල් මූලික කර ගත් විශේෂිත වැඩසටහන්**

පසුගිය දශකය තුළ වැඩි දියුණු වූ ආර්ථික පහසුකම් ද භාවිතයට ගනිමින් දැනට ක්‍රියාත්මක සංවර්ධන වැඩසටහන් සමඟ ඒකාබද්ධ වෙමින් පවත්නා දරිද්‍රතා මට්ටම තවදුරටත් අඩුකිරීම රජයේ ඉලක්කය වී ඇත. ඒ අනුව ඒකාබද්ධ ප්‍රවේශයක් තුළින් එම ඉලක්කය සපුරා ගැනීමට කටයුතු කරන ලද අතර හඳුනාගත් අඩු ආදායම්ලාභී පවුල් කෘෂිකාර්මික, පශුසම්පත්, ධීවර හා ව්‍යවසාය සංවර්ධන යන අංශ යටතේ ආදායම් උත්පාදන ව්‍යාපෘති ආරම්භ කිරීමට යොමු කරන ලදී.

2013.12.31 දිනට දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා රු.මි. 28.23 ක් වැය කර ඇත. 2013.12.31 දිනටසවිබල ගන්වන ලද පවුල් සංඛ්‍යාව 52,879 ක් වන අතර ඒ සඳහා රු.මි.117.04 ක් වැය කර ඇත

## 1.5 දිවි නැඟුම වැඩසටහනේ බලපෑම

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය මඟින් සිදු කරනු ලබන වෙළඳ මිල සමීක්ෂණයට අනුව 2012 වර්ෂයේ මිල ගණන් වලට සාපේක්ෂව 2013 වර්ෂයේ සහල්, එළවළු, පළතුරු මිළගණන් හි අඩුවීමක් පෙන්නුම් කරයි. සමහර ද්‍රව්‍යයන්හි මිළ වැඩිවීමක් පෙන්නුම් කළද පසුගිය වර්ෂයන් හා සැසඳීමේ දී විශාල වෙනසක් සිදු වී නැත. දිවි නැඟුම ජාතික වැඩසටහන මඟින් ඇති වූ පිබිදීම නිසා බොහෝ දෙනෙක් තම ගෙවත්තේ වගා කිරීමට යොමුවීම මේ සඳහා ප්‍රභල ලෙස බලපා ඇත.




මූලාශ්‍රය - හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීම් ආයතනය




මූලාශ්‍රය - හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීම් ආයතනය

### 1.6 දිවි නැඟුම වැඩසටහනේ ජයග්‍රහණ

වර්තමානය වන විට ශ්‍රී ලංකාව දැවැන්ත සංවර්ධන තත්ත්වයක් කරා ගමන් කරමින් සිටින බව හැඟෙන හා දැනෙන කරුණකි. මේ සඳහා දිවි නැඟුම ජාතික වැඩසටහනේ ක්‍රියාකාරීත්වය ද විශාල පිටුවහලක් වී ඇති බව නොරහසකි. දිවිනැඟුම ජාතික වැඩසටහන වසරින් වසර නව මුහුණුවරකින් සහ නව ව්‍යාපෘති හා ක්‍රියාකාරකම් එකතු කරමින් ඉතා පුළුල් වැඩසටහනක් ලෙස දීප ව්‍යාප්තව සාර්ථකව ක්‍රියාත්මක වෙමින් පවතී. ලොව කිසිදු රටකට ගැති නොවී ජීවත්වීමට නම් අප රට සෑම අතින්ම ස්වයංපෝෂිත කිරීම අත්‍යවශ්‍ය වන අතර ඒ සඳහා සියළු ජන කොටස්වල ජීවනෝපාය මෙන්ම අතිරේක ආදායම් මාර්ග ශක්තිමත් කිරීම ද කළ යුතු වේ.

එදිනෙදා පරිභෝජනය සඳහා අවශ්‍ය දේ ගෘහාශ්‍රිතව සපයා ගැනීමටත්, නිෂ්පාදනය වැඩිකිරීම තුළින් අතිරික්තය වෙළඳපලට යොමු කිරීමෙන් අමතර ආදායමක් උපයා ගැනීමටත්, තෝරා ගත් අඩු ආදායම්ලාභි පවුල් මූලික කර ගත් දුගීකම තුරන් කිරීමේ විශේෂිත වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළින් 6.5%ක් වන දරිද්‍රතා දර්ශකය 2016 වර්ෂයේදී 4% දක්වා අඩුකිරීමටත් අවශ්‍ය සානුබලය ලබා දීම දිවි නැඟුම වැඩසටහනේ අපේක්ෂාව වේ.

දිවි නැඟුම වැඩසටහන ක්‍රියාත්මක වීමත් සමඟ ශ්‍රී ලාංකීය ජන හදවත් තුළ ඇති වූ ආකල්පමය වෙනස මෙම වැඩසටහන තුළින් ලැබූ ඉහළම ජයග්‍රහණයකි. එදිනෙදා පරිභෝජනයට අවශ්‍ය සියලු දෑ වෙළඳපොළෙන් මිළට ගැනීමට පෙළඹී සිටින ජනතාව තමනට හැකි අයුරින් ගෙවත්තෙන්ම වගා කටයුතු කර ගැනීමට මානසික පෙළඹීමක් ලබා සිටී. ඒ අනුව වස විසෙන් තොර පිරිසිදු සහ නැවුම් එළවළු, පලා වර්ග, හා පළතුරු ආහාර වේලට එක්කර ගැනීම සඳහා තම ගෙවත්තේ වගා කිරීමටද, පිටි කිරි භාවිතය අඩුකර දියර කිරි භාවිතයටද යොමු වීමේ ප්‍රවණතාවයක් දක්නට ඇත. මේ අනුව වෙළඳපොළේ පළතුරු හා එළවළු මිළ පහත වැටීමේ ප්‍රවණතාවයක් දක්නට ඇති අතර එය මෙම වැඩසටහනින් ලද ජයග්‍රහණයකි. ව්‍යවසාය සංවර්ධනය යටතේ ස්වයංරැකියාවල නියුතු වීමට කැමති පුද්ගලයින්ට ඒ සඳහා පුහුණුව ලබා දී කුඩාකර්මාන්ත ආරම්භ කිරීම සඳහා අවශ්‍ය පහසුකම් හා පුහුණුව සපයා දෙන ලදී. එමගින් රැකියා විරහිතව සිටි ජනතාව රැකියාලාභීන් වී රටේ සේවා නියුක්තිය වැඩි වූ අතර ගෘහ ආශ්‍රිත කර්මාන්ත සංවර්ධනයත් සමඟ රැකියා විරහිතව සිටින කාන්තාවන්ගේ ශ්‍රමය හා කාලය ඵලදායීව රටේ දේශීය නිෂ්පාදනයට දායක කර ගත හැකි වීම මෙම වැඩසටහන ලද ජයග්‍රහණ ලෙස දැක්විය හැක.

## ..... දිවිනැඟුම සංවර්ධන දෙපාර්තමේන්තුව

ආර්ථික වශයෙන් සවිබල ගැන්වූ ගෘහ ඒකක පිහිටුවීම මඟින් පවුලේ ආර්ථිකය ශක්තිමත් කිරීම අරමුණු කර ගෙන ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය ක්‍රියාත්මක කළ දැවැන්තම ජීවනෝපාය සංවර්ධන වැඩසටහන. දිවිනැඟුම ජාතික වැඩසටහනයි. එම අරමුණු වඩාත් සුමට ආකාරයෙන් ඉටු කර ගැනීම සඳහා අමාත්‍යාංශය යටතේ දිළිඳුකම තුරන් කිරීම සඳහා ක්‍රියාත්මක වූ දෙපාර්තමේන්තු හා ආයතන කිහිපයක කටයුතු එක අරමුණක පිහිටුවමින් 2013 අංක 01 දරණ දිවිනැඟුම පනත යටතේ දිවිනැඟුම සංවර්ධන දෙපාර්තමේන්තුව නිල වශයෙන් පිහිටුවීමට අවශ්‍ය කටයුතු 2013 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලදී.

දිවිනැඟුම සංවර්ධන දෙපාර්තමේන්තු කාර්යභාරය තුළ ඒකාබද්ධ වූ ආයතන

- ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය
- ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරිය
- ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය
- සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
- උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුව

### දිවි නැඟුම සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවීමේ පරමාර්ථ

- දිළිඳුබව තුරන් කිරීම සහ සමාජ සාධාරණත්වය සහතික කරනු ලබන සමාජයක් බිහි කිරීම සඳහා අවශ්‍ය විය හැකි සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම
- පුද්ගල , පවුල , කණ්ඩායම් සහ ප්‍රජාව කේන්ද්‍ර කර ගත් ජීවනෝපාය සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම,
- එක් එක් පුද්ගලයා සහ පවුල වෙනුවෙන් ආහාර සුරක්ෂිතතාවය සහතික කිරීම,
- ජාතික සංවර්ධනය වේගවත් කිරීම සඳහා ජනතාව ඒකරාශී කිරීම හා සවිබල ගැන්වීම,
- ජනතාවගේ ජීවනෝපාය සංවර්ධනය ඉහළ නැංවීමේ කාර්ය සඳහා ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් සැපයීම,
- ජනතාවගේ ජීවනෝපාය සංවර්ධනය සඳහා අවශ්‍ය විය හැකි භෞතික සහ සමාජ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම,
- ජනතාවගේ ආර්ථික සහ සමාජ සංවර්ධනයට අවශ්‍ය විය හැකි අධ්‍යයන සහ පර්යේෂණ කටයුතු සිදු කිරීම,
- ජනතාවගේ ජීවන තත්වය නඟා සිටුවීම සඳහා මානව ප්‍රාග්ධනය සංවර්ධනය කිරීම
- සමාජ ආරක්ෂණයක් අවශ්‍ය පුද්ගලයන් සඳහා සමාජ ආරක්ෂණ ජාලයක් නිර්මාණය කිරීම

## 1.7 සමාජ ආරක්ෂණය - සමෘද්ධි වැඩසටහන

දරිද්‍රතා අනුපාතිකය 2005 වර්ෂයේදී 15.2% ක් විය. දරිද්‍රතා අනුපාතිකය 2016 වර්ෂය වන විට 4.2% ක් දක්වා අඩු කර ගැනිම උදෙසා ක්‍රියාත්මක වෙමින් පවතින විවිධ සංවර්ධන හා සුභසාධන වැඩසටහන් අතරින් මුළු දිවයින පුරා වෙසෙන අඩු ආදායම්ලාභීන් සඳහා ක්‍රියාත්මක වන සමෘද්ධි සමාජ ආරක්ෂණ වැඩසටහන, දරිද්‍රතාවය තුරන් කිරීමේ අදිටනින් ක්‍රියාවට නැඟෙන සහයක සුභසාධන වැඩසටහනක් ලෙස 2013 වර්ෂයේද ක්‍රියාත්මක විය.

අඩු ආදායම්ලාභි පවුල්වල ක්‍රය ශක්තිය ස්ථාවර මට්ටමක පවත්වාගෙන යාම සහතික කිරීම උදෙසා ඔවුන් මුහුණ දෙන හඳුනාගත් බාහිර සහය අවශ්‍ය අවස්ථාවන්වල දී එය ඔවුන් වෙත සහතික කිරිම සඳහා, ඔවුන් සමාජ, ආර්ථික, අධ්‍යාපනික හා ආධ්‍යාත්මික වශයෙන් සවිබල ගැනිවීම සදහා 2013 වර්ෂයේදී පහත වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි .




### සමෘද්ධි සහනාධාර වැඩසටහන

සමාද්ධි සහනාධාර වැඩසටහන දිවයින පුරා පැතිරී සිටින අඩු ආදායම්ලාභීන්ගේ ජීවන තත්වය ඉහළ නැංවීමේ අරමුණින් වර්ෂ 1995 සිට ක්‍රියාත්මක වේ. සමෘද්ධි සහනාධාර මුදල් මගින් 2013 වර්ෂයේදී ප්‍රතිලාභීන් 1,477,313 ක් සඳහා රු.මි.13,896 ක ප්‍රතිලාභ පහත සදහන් අගයන්ගෙන් ලබා දී ඇත.



එමෙන්ම සමෘද්ධි සහනාධාර වැඩසටහන තවදුරටත් පුළුල් කරමින් ප්‍රතිලාභීන් ඉතිරි කිරීමට හා ඒතුලින් ඉදිරි ආයෝජන කටයුතු උදෙස පෙළඹවීමේ අරමුණින් සමෘද්ධි මුද්දරය වෙනුවට ඔවුනට හිමි මුදල් සමෘද්ධි බැංකුවල ප්‍රතිලාභීන්ගේ ගිණුම්වලට බැර කිරීමේ ක්‍රමයක් 2012 අප්‍රේල් මස සිට හඳුන්වා දෙනු ලැබීය.

**සමෘද්ධි සහානාධාර වැඩසටහන යටතේ 2006-2013 වර්ෂය දක්වා ලබාදෙන ලද ප්‍රතිලාභ පිළිබඳ තොරතුරු**

වගු අංක 1.7.1

| වර්ෂය | පවුල් සංඛ්‍යාව | වටිනාකම රු.මි. |
|---|---|---|
| 2006 | 1,916,594 | 10,789 |
| 2007 | 1,844,660 | 9,200 |
| 2008 | 1,631,113 | 9,665 |
| 2009 | 1,600,786 | 9,274 |
| 2010 | 1,572,129 | 9,241 |
| 2011 | 1,541,575 | 9,044 |
| 2012 | 1,549,107 | 10,182 |
| 2013 | 1,477,313 | 15,256 |

මූලාශ්‍රය - සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

**මව්වරුන් සඳහා පෝෂණ වැඩසටහන (පෝෂණ මල්ල වැඩසටහන)**

1993 වර්ෂයේ ආරම්භ කරන ලද මෙම වැඩසටහන අද වන විට දිවයින පුරා ක්‍රියාත්මක වන වැඩසටහනකි. අඩු ආදායම්ලාභි පවුල්වල ගැබිණි හා කිරිදෙන මව්වරුන්ගේ පෝෂණ තත්ත්වය නංවාලිම උදෙසා ක්‍රියාත්මක වන මෙම වැඩසටහන යටතේ අලුතින් දරුවන් ලද මව්වරුන්ට පෝෂ්‍යදායක ආහාර වේලක් ලබා ගැනිම සඳහා පෝෂණ මුද්දරයක් ලබා දීම සිදු කරන අතර දැනට ක්‍රියාත්මක වන වැඩසටහන යටතේ ගැබිණි හා කිරිදෙන මව්වරුන් සඳහා මසකට රු. 500/= වටිනාකමින් යුක්ත මුද්දර 20 කින් සමන්විත මුද්දර පත්‍රිකාවක් ලබා දෙන අතර ඉන් මුල් මුද්දර 8 පූර්ව මාතෘ අවධිය සඳහා ද ඉතිරි මුද්දර 12 කිරි දෙන අවධිය සඳහාද වෙන් කර ඇත.

එමෙන්ම මෙම වැඩසටහන තවදුරටත් වඩා ඵලදායි අයුරින් ක්‍රියාත්මක කිරීමට විශේෂ පෝෂණ පැකේජයක් හඳුන්වා දීමද 2013 වසරේදි සිදුවුනි. මේ යටතේ කෘෂිකර්ම අමාත්‍යාංශයේ ආහාර ප්‍රවර්ධන මණ්ඩලය හා එක්ව පෝෂණීය ආහාර ද්‍රව්‍ය මල්ලක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් බෙදා හැරීමට කටයුතු කරන ලදි. පළමුව මොණරාගල දිස්ත්‍රික්කයෙන් ආරම්භ කරන ලද මෙම නව වැඩසටහන පිළිවෙලින් කෑගල්ල හා හම්බන්තොට දිස්ත්‍රික්ක සඳහාද හඳුන්වා දෙන ලදි.

**මව්වරුන් සඳහා පෝෂණ වැඩසටහන - 2008-2013**

වගු අංක 1.7.2

| වසර | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | වියදම රු.මි. |
|---|---|---|
| 2008 | 60,050 | 289.2 |
| 2009 | 76,620 | 505.00 |
| 2010 | 71,471 | 388.00 |
| 2011 | 43,252 | 360,00 |
| 2012 | 55,299 | 249.60 |
| 2013 | 40,404 | 203.00 |

මූලාශ්‍රය - සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

## සමාජ ආරක්ෂණ වැඩසටහන

මෙම වැඩසටහන මගින් සමෘද්ධි ප්‍රතිලාභියාගේ හෝ පවුලේ සමාජිකයන් ආර්ථික හා සාමාජික කාර්යයන්හි පූර්ණ ලෙස කැපවීමට අවශ්‍ය රැකවරණය, සමාජීය ආරක්ෂාව සහතික කෙරේ. ඒ සඳහා ස්වශක්තියෙන් නැඟිසිටීමට අවශ්‍ය වන උපකාර ලබාදීමේ අරමුණින් සමාජ ආරක්ෂණ වැඩසටහන ක්‍රියාත්මක වෙමින් පවතී. සමාජිකයින් දෙදෙනෙකුට වඩා සිටන පවුල් මෙම වැඩසටහනට දායක කර ගනු ලබන අතර දරු උපතකදී, විවාහයකදී, මරණයකදී, රොහල් ගතවීමකදි හා උසස් අධ්‍යාපනයේදී යනාදී විශේෂ අවස්ථාවන් සඳහා සමාජ ආරක්ෂණ වැඩසටහන මගින් ප්‍රතිලාභ ලබා දෙන ලදි.

### සමෘද්ධි සමාජ ආරක්ෂණ වැඩසටහන් - 2013

වගු අංක 1.7.3

| දිමනා හා ප්‍රතිලාභ | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | වියදම රු.මි. |
|---|---|---|
| උපත් | 6,826 | 34 |
| විවාහ | 22,667 | 102 |
| රෝග | 22,792 | 64 |
| මරණ | 22,895 | 229 |
| ශිෂ්‍යත්ව | 77130 | 77 |

මූලාශ්‍රය - සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉහත සඳහන් ප්‍රතිලාභ වලට අමතරව ඔවුන්ගේ ජීවන තත්වය නඟා සිටුවිම වෙනුවෙන් පහත සඳහන් සහනද ලබා දී ඇත.

- ජල හා විදුලි පහසුකම් ලබා ගැනීමේදි සහනදායී ගෙවීම් ක්‍රමයකට ලබා ගැනීම
- දිරිය පියස වැඩ සටහන යටතේ නිවාස ලබා දීම

# 2

## ගම නැඟුම - සවිබල ගැන්වුන ප්‍රජාවක්

## 2. ගම නැඟුම - සවිබල ගැන්වුන ප්‍රජාවක්

"මාගේ ජීවිතය විකසිත වූයේ කුරහන් හේන් පිස හමා ආ ගැමි සුවඳිනි. ඒනිසාම සොඳුරු බවින්, සෙනෙහසින් හා සෞන්දර්යයෙන් පිරුණු ගම පිළිබඳ මා දකින සිහිනය 'ගම නැඟුම' ලෙස යථාර්ථයක් බවට පත් කරමි. පසුගිය දශක ගණනාව තුළ අපේ දෑස් ඉදිරිපිටදීම පිරිහීමට ලක් වූ ගම පුනර්ජීවනය කරමි."

-මහින්ද චින්තන- පිටුව 22

2006 වර්ෂයේ සිට ඇරඹි "ගම නැඟුම" ජාතික සංවර්ධන වැඩසටහනේ මුඛ්‍ය පරමාර්ථය වනුයේ 2016 වර්ෂය වන විට රජයේ සංවර්ධන සැලසුම් වල කේන්ද්‍රය ලෙස ගම සංවර්ධනය කිරීමයි. සංවර්ධනයේ කේන්ද්‍රය වන ගම, "මහින්ද චින්තන" ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් පරිදි සොදුරු බවින්, සෙනෙහසින් හා සෞන්දර්යයෙන් පිරි ගමක් ලෙස ප්‍රතිනිර්මාණය කිරීමට අවශ්‍යය පසුබිම මෙම වැඩසටහන හරහා නිර්මාණය විය. ග්‍රාමීය අංශයේ ක්‍රියාකාරකම් සංවර්ධනය උදෙසා මෙන්ම දරිද්‍රතාවය පිටු දැකීමේ පරමාර්ථයෙන් ග්‍රාමීය හා කෘෂිකාර්මික ප්‍රවේශ මාර්ග සංවර්ධනය සඳහා ආයෝජනය, වාරිමාර්ග ව්‍යාපෘති, ජල සම්පාදන සහ ප්‍රජා ජල සැපයීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, ග්‍රාමීය මට්ටමේ විදුලි බල සැපයුම, සෞඛ්‍ය, අධ්‍යාපන ආදී සේවාවන්හි වර්ධනයට අදාළ වන ග්‍රාමීය අංශයේ යටිතල පහසුකම් සංවර්ධනය මෙම වැඩසටහන තුළින් සිදු කෙරිනි.



| ව්‍යාපෘති ක්ෂේත්‍රය | ප්‍රතිලාභ |
|---|---|
| ග්‍රාමීය මාර්ග සංවර්ධනය | • ගෘහ ආර්ථික ඒකක තුල නිපදවෙන භාණ්ඩ හා සේවාවන් බෙදාහැරීම සඳහා පුළුල් ප්‍රවේශයක් විවෘත වීම<br>• ග්‍රාමීය ප්‍රදේශවල නව කර්මාන්ත බිහිවීමට අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය වීම |
| සුළු පරිමාණ වාරිමාර්ග | • පුරන් කුඹුරු අස්වැද්දීමට විශාල රුකුලක් වීම<br>• ඇළ මාර්ග ශුද්ධ පවිත්‍ර කිරීම තුළින් පරිසර දූෂණය අවම වීම, ගංවතුර ආපදා හානි අවම වීම |
| ප්‍රජා ජල සම්පාදනය | • නිරෝගී දිවියකට මග සැලසීම<br>• ජලය රැස් කිරීම සඳහා ගතවන කාලය අඩුවීම |
| මාතෘ හා ළමා සෞඛ්‍ය සායන | • සෞඛ්‍ය සම්පන්න නිරෝගී මවුවරුන් හා දරු පරපුරක් බිහි කිරීමට හැකිවීම<br>• මවුවරුන් සෞඛ්‍ය සායන වලට සහභාගි වීමේ උනන්දුව වැඩිවීම |
| පෙර පාසල් සංවර්ධනය | • උසස් ප්‍රමිතියකින් යුක්ත පෙර පාසල් අධ්‍යාපනයක් ලබා දීම<br>• පෙර පාසල් වලට ඇතුළත් වීම සඳහා පෙළඹවීමක් ඇති කිරීම |
| ගොඩනැගිලි, ක්‍රීඩා පිටි,උද්‍යාන | • ග්‍රාමීය ප්‍රදේශ අංගසම්පූර්ණ සෞභාග්‍යමත් ප්‍රදේශ බවට පත්වීම<br>• ජනතාව සතු විවේකය වඩාත් ඵලදායී අයුරින් ගත කිරීම උදෙසා පහසුකම් සැලසීම |

**ග්‍රාමීය මග**

**පහසුකම් සපිරි සමෘද්ධිමත් ගමක්**

ගම නැගුම වැඩසටහන "එක ගමකට - එක වැඩක්" ලෙස නව එළඹුමක් වෙත යොමු වෙමින් උපරිම වශයෙන් රු.මි. 1.0 ක වටිනාකමින් යුත් සංවර්ධන ව්‍යාපෘතියක් සෑම ගමකම ක්‍රියාත්මක කිරීම සඳහා 2012 වර්ෂයේ සිට යොමු විය.

2013 වසර තුල "එක ගමකට - එක වැඩක් " වැඩසටහනෙහි ව්‍යාපෘති බෙදීගොස් ඇති ආකාරය



## 2.1 ග්‍රාමීය මාර්ග සංවර්ධනය ...

"ශ්‍රී ලංකාවේ සෑම ගමකම සියලුම ආකාරයේ මාර්ග කොන්ක්‍රීට් කරන්නෙමි. ගම්මාන 16000 තුළම සියලු යටිතල පහසුකම්, ජීවනෝපාය සහ සමාජ සංවර්ධනය තුළින් 2016 වන විට සම්පත් පිරුණු සමෘද්ධිමත් ගමක් නිර්මාණය කරමි."

-මහින්ද චින්තන ඉදිරි දැක්ම- පිටුව 17

"එක ගමකට - එක වැඩක් " වැඩසටහන යටතේ ප්‍රමුඛ අවධානයක් යොමුකරන ලද්දේ ග්‍රාමීය මාර්ග සංවර්ධනයටයි. එමඟින් ගොඩනැගෙන නව අන්තර් සම්බන්ධතා, ගෘහ ආර්ථික ඒකක තුළ නිපදවෙන භාණ්ඩ හා සේවාවන් බෙදාහැරීම සඳහා පුළුල් ප්‍රවේශයක් විවෘත වන අතර ග්‍රාමීය මාර්ග මෙන්ම කෘෂි මාර්ග සංවර්ධනය හේතුකොට ගෙන කෘෂි යෙදවුම් හා නිෂ්පාදන ප්‍රවාහනයට හා අලෙවියට ඇති අවස්ථා පුළුල් වීමෙන් ආදායම් තත්වය ඉහළ නංවාගැනීමට ගොවිජනතාවට හැකියාව ලැබිනි. මේ නිසාම ග්‍රාමීය ප්‍රදේශවල නව කර්මාන්ත බිහිවීමට අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය වීම සහ ගමත් නගරයත් අතර වූ සංවර්ධනයේ දුරස්ථභාවයන්, විෂමතාවයන් අවම කර ගැනීමට හැකිවිය. මෙය ලද සමාජ ආර්ථික ප්‍රතිලාභයක් වේ.

වගු අංක 2.1.1

| වර්ෂය | නිමකල ව්‍යාපෘති ගණන | වියදම (රු.මි.) |
|---|---|---|
| 2013 | 2,505 | 1,852.16 |

නිමකරන ලද ව්‍යාපෘති කිහිපයක්

ඉදිකරන ලද ඉතෑව පින්නපොලේගම මාර්ගය
කොටවෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය
කුරුණෑගල දිස්ත්‍රික්කය

ඉදිකරන ලද බඹරබැද්ද මාර්ගය
උඩුදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය
මහනුවර දිස්ත්‍රික්කය

## 2.2 සුළු පරිමාණ වාරිමාර්ග සංවර්ධනය ...

කෘෂිකාර්මික කටයුතු සඳහා අවශ්‍ය වන ජලය රඳවා ගැනීම, බෙදා හැරීම සඳහා වැව් අමුණු හා ඇළ මාර්ග ඉදිකිරීම, පිළිසකර කිරීම මේ යටතේ සිදුකළ අතර "එක ගමකට - එක වැඩක් " වැඩසටහන යටතේ සිදුකරනු ලැබූ මෙම සංවර්ධන ක්‍රියාකාරකම් තුළින් පුරන් කුඹුරු අස්වැද්දීමට විශාල රුකුලක් වූ අතර එමගින් ගොවි ප්‍රජාවගේ ආර්ථිකය සරුසාර වී ඔවුන්ගේ ජීවන තත්වය උසස් කිරීමට හේතු විය. තවද මෙමගින් රට ස්වයංපෝෂිත කිරීමේ ජාතික අරමුණ ඉටුකර ගැනීමෙහිලා ඉමහත් දායකත්වයක් සපයනු ලැබීය. අපද්‍රව්‍ය සහිත ඇළ මාර්ග ශුද්ධ පවිත්‍ර කිරීම තුළින් පරිසර දූෂණය අවම වීම, ඩෙංගු වැනි වසංගත රෝග මැඩලීමට හැකිවීම, ගංවතුර ආපදා හානි අවම කිරීමටද හේතු වී ඇත.

වගු අංක 2.2.1

| වර්ෂය | නිමකල ව්‍යාපෘති ගණන | වියදම (රු.මි.) |
|---|---|---|
| 2013 | 264 | 105.4 |

නිමකරන ලද ව්‍යාපෘති කිහිපයක්

ඉදිකරන ලද බරවාගොඩ යාය ඉහළ අමුණ
මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය
කොළඹ දිස්ත්‍රික්කය

ඉදිකරන ලද ගල්ටැම්මණ්ඩිය බතලකොටුවආර අමුණ
බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය
මොණරාගල දිස්ත්‍රික්කය

## 2.3 නිරෝගී පරපුරක් බිහිකිරීම උදෙසා ප්‍රජා ජල සම්පාදනය ...

ග්‍රාමීය ජනතාවට අවශ්‍ය වන පිරිසිදු පානීය ජලය ලබාදීම සඳහා ජල ටැංකි සැකසීම, පොදු ලිං සැකසීම, ජල නල එළීම "එක ගමකට - එක වැඩක්" වැඩසටහන තුළින් සිදු කරන ලදී. ඒ තුළින් නිරෝගී දිවියකට මග පෑදෙන අතර ජලය රැස් කිරීම සඳහා ගතවන කාලය අඩු වීම ලැබී ඇති විශේෂ ප්‍රතිලාභයන් බව සඳහන් කල හැකිය.

වගු අංක 2.3.1

| වර්ෂය | නිමකල ව්‍යාපෘති ගණන | වියදම (රු.මි.) |
|---|---|---|
| 2013 | 296 | 171.68 |

නිමකරන ලද ව්‍යාපෘති කිහිපයක්

ඉදිකරන ලද කම්බුවටවන ජල ටැංකිය

පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය

කුරුණෑගල දිස්ත්‍රික්කය

ඉදිකරන ලද ජල ටැංකිය

මහකුඹුක්කඩවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය

පුත්තලම දිස්ත්‍රික්කය

## 2.4 මාතෘ හා ළමා සෞඛ්‍ය සායන පහසුකම් සැලසීම ...

එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකට සියළු පහසුකම් වලින් සමන්විත එක් මාතෘ සායන මධ්‍යස්ථානයක් හෝ ස්ථාපිත කිරීමටත්, ග්‍රාමීය ප්‍රදේශවල තාවකාලික ස්ථාන වල පවත්වාගෙන යන සායන සඳහා ස්ථිර ගොඩනැගිලි පහසුකම් ඇතිකිරීමත්, දැනට පවතින අඩුපාඩුකම් සහිත මාතෘ හා ළමා සායන මධ්‍යස්ථාන සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම මගින් පිරිසිදු පානීය ජලය ලබාදීම, විදුලිය ලබාදීම, සුවපහසු ආසන පහසුකම් ලබාදීම, දරුවන්ගේ ඇඳුම් මාරුකිරීම සඳහා සුදුසු ස්ථාන පහසුකම් ඇතිකිරීම, දරුවන්ට ක්‍රීඩා කිරීමේ ස්ථාන, පිරිසිදු සනීපාරක්ෂක පහසුකම්, විදුලි පංකා හා රූපවාහිනී ආදී පහසුකම් ලබාදීම සිදුකරන ලදී.

වගු අංක 2.4.1

| වර්ෂය | නිමකල ව්‍යාපෘති ගණන | වියදම (රු.මි.) |
|---|---|---|
| 2013 | 113 | 59.94 |

නිමකරන ලද ව්‍යාපෘති කිහිපයක්

නවීකරණය කරන ලද කුරුණෑගල ළමා හා මාතෘ සායන මධ්‍යස්ථානය

කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය

කුරුණෑගල දිස්ත්‍රික්කය

ඉදිකරන ලද කහගොල්ල ළමා හා මාතෘ සායන මධ්‍යස්ථානය

මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය

මොණරාගල දිස්ත්‍රික්කය

## 2.5 බුද්ධිමත් ක්‍රියාශීලී දරු පරපුරක් උදෙසා පෙර පාසල් සංවර්ධනය ...

ගම නැගුම ජාතික වැඩසටහන යටතේ ග්‍රාමීය ප්‍රදේශවල පෙර පාසල් වියේ පසුවන ළමුන්ගේ අධ්‍යාපනික, ක්‍රීඩා හා සනීපාරක්ෂක අවශ්‍යතා සපුරාලීම සඳහා අවශ්‍ය වන පෙර පාසල් ගොඩනැගිලි ඉදිකිරීම හා ප්‍රතිසංස්කරණය, පෙර පාසල් සඳහා සෙල්ලම් මිදුල් හා ඉගැන්වීමේ උපකරණ ලබාදීම ආදිය සිදුකරන ලදී. මේ තුළින් උසස් ප්‍රමිතියකින් යුක්ත පෙර පාසල් අධ්‍යාපනයක් ලැබීම අවම පහසුකම් පවතින ප්‍රදේශ වල පවා සහතික කරමින් පෙර පාසල් වලට ඇතුළත් වීම සඳහා පෙළඹවීමක් ඇති කෙරෙන අතර පාසල් අධ්‍යාපනය කෙරෙහි දරුවන්ගේ උනන්දුවක්ද ඇති කෙරේ.

වගු අංක 2.5.1

| වර්ෂය | නිමකල ව්‍යාපෘති ගණන | වියදම (රු.මි.) |
|---|---|---|
| 2013 | 162 | 89.76 |

නිමකරන ලද ව්‍යාපෘති කිහිපයක්

*සංවර්ධනය කරන ලද දීප්ති පෙර පාසල*
*අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය*
*කුරුණෑගල දිස්ත්‍රික්කය*

*සංවර්ධනය කරන ලද ළමා මිතුරු පෙර පාසල*
*බලංගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය*
*රත්නපුර දිස්ත්‍රික්කය*

## 2.6 ග්‍රාමීය ගොඩනැගිලි පහසුකම් සංවර්ධනය ...

ග්‍රාමීය ජනතාවගේ අධ්‍යාත්මික හා සමාජ සංවර්ධනය මගින් යහපත් ජන සමාජයක් බිහිකරලීමේ අරමුණින් "එක ගමකට-එක වැඩක්" වැඩසටහන යටතේ ප්‍රජාශාලා, පුස්තකාල, බහු කාර්යය ගොඩනැගිලි පහසුකම් සංවර්ධනය කර ඇත.

වගු අංක 2.6.1

| වර්ෂය | නිමකල ව්‍යාපෘති ගණන | වියදම (රු.මි.) |
|---|---|---|
| 2013 | 320 | 199.45 |

නිමකරන ලද ව්‍යාපෘති කිහිපයක්

ඉදිකරන ලද දොළ මාවත ප්‍රජා ශාලාව
අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය
මාතර දිස්ත්‍රික්කය

ඉදිකරන ලද හොලිපිටිය ප්‍රජා ශාලාව
කිරිඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය
රත්නපුර දිස්ත්‍රික්කය

## 2.7 ක්‍රීඩා පිටි /උද්‍යාන පහසුකම් සංවර්ධනය ...

වඩාත් යහපත් ජන සමාජයක් ඇති කිරීමෙහිලා ක්‍රීඩාව සතු ශක්‍යතාවයන් ඉතා ඉහළ වැදගත් කමක් උසුලන බැවින් මෙන්ම, ජනතාව සතු විවේකය වඩාත් ඵලදායී අයුරින් ගත කිරීම උදෙසා පහසුකම් සැපයීමට ගම නැඟුම ජාතික වැඩසටහන යටතේ ක්‍රීඩා පිටි/උද්‍යාන පහසුකම් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක විය.

වගු අංක 2.7.1

| වර්ෂය | නිමකල ව්‍යාපෘති ගණන | වියදම (රු.මි.) |
|---|---|---|
| 2013 | 62 | 37.45 |

නිමකරන ලද ව්‍යාපෘති කිහිපයක්

ප්‍රතිසංස්කරණය කරන ලද මහවැව කලවැල්ගල ක්‍රීඩාපිටිය

සෙවනගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය

මොණරාගල දිස්ත්‍රික්කය

ප්‍රතිසංස්කරණය කරන ලද මාටුවාගල ක්‍රීඩාපිටිය

කිරිඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය

රත්නපුර දිස්ත්‍රික්කය

## 2.8 ජයග්‍රහණ, අභියෝග හා විසඳුම්

සෑම ග්‍රාම නිලධාරී කොට්ඨාශයකම යටිතල පහසුකම් වල සිදුකරන ලද සංවර්ධනය හේතුවෙන් නාගරික ග්‍රාමීය සංවර්ධන විෂමතා අවම වීම මෙම වැඩසටහන තුළින් ලද මූලිකම ජයග්‍රහණයකි.

නව කර්මාන්ත, නව නිෂ්පාදන, නව රැකියා අවස්ථා ග්‍රාමීය ප්‍රදේශවල උත්පාදනය කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ලබාදීම තුළින් ග්‍රාමීය ජනතාව ජාතික ආර්ථික වර්ධනයට දායක කරගැනීමට හැකිවීමද මෙම වැඩසටහන තුළින් ලද ජයග්‍රහණයකි.

මෙම වැඩසටහන තුළ ඇතැම් ව්‍යාපෘති නිසි ප්‍රමිතියකින් තොරව නිම කිරීම මෙන්ම යම් යම් ව්‍යාපෘති නිසි කලට වේලාවට නිම කිරීමට ඇතිවූ බාධාවන්ට මුහුණ දීමට සිදුවිය.

මෙම අත්දැකීම් පාදක කර ගනිමින් ඉදිරි සංවර්ධන ව්‍යාපෘති සැලසුම් කිරීමට හා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

## 2.9 සංවර්ධනය උදෙසා ග්‍රාම සභා

මහින්ද චින්තන ඉදිරි දැක්මේ සඳහන් වන පරිදි ගම සංවර්ධනය කිරීමේදී එහි වෙසෙන දිළිඳු ජනයා පමණක් නොව ගමේ සමස්ත ජනතාවම සක්‍රීයව සහභාගී කර ගැනීම අත්‍යවශ්‍ය කටයුත්තක් බව වටහා ගෙන ග්‍රාම සභා වැඩපිළිවල මෙම 2013 වසරේදීද ක්‍රියාත්මක කරන ලදී.

හම්බන්තොට දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 12 තුළ එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකින් ග්‍රාම නිලධාරී වසම් 5 ක් ආවරණය වන පරිදි තෝරාගන්නා ලද ග්‍රාම නිලධාරී වසම් 60 ක් තුළ නියමු වැඩසටහනක් ලෙස ග්‍රාම සභා පිහිටුවා ක්‍රියාත්මක කරන ලද අතර එහිදී මහ නගර සභාවක, නගර සභාවක හා ප්‍රාදේශීය සභා 10 ක මහජන නියෝජිතයින් සවිබල ගැන්වීම සිදුකරන ලදී.

### ග්‍රාම සභා වැඩපිළිවලේ ප්‍රධාන අරමුණු:-

- ජනතා සංවර්ධනයේ පදනම් ඒකකය ලෙස ගම සංවිධානය කිරීම හා සංවර්ධනය කිරීම.
- ග්‍රාමීය සංවර්ධනය සමස්තවාදී හා ඒකාබද්ධවාදී ප්‍රවේශයක් මත සිදු කිරීම.
- ජාතික පිරිවැය අඩුකිරීම සඳහා ගමෙහි කෘත්‍යයන් ප්‍රතිව්‍යුහගත කිරීම.
- ජාතික නිෂ්පාදනය හා ජාතික ආදායම ප්‍රසාරණය සඳහා ගම යොදාගැනීම.
- ගම තුළ දේශපාලන සංහිඳියාවකට පසුබිම සැකසීම.
- ගැටුම් අවම කරගනිමින් ජන සම්මුතිවාදී භාවිත සහ පුරුදු ගම තුළ ගොඩනැගීම.

මෙම අරමුණු ඉටුකරගැනීම පහසුවීම සඳහා දිස්ත්‍රික් ලේකම්වරුන් මඟින්, දිස්ත්‍රික් සැලසුම් අධ්‍යක්ෂවරුන්, ප්‍රාදේශීය ලේකම්වරුන්, සහකාර සැලසුම් අධ්‍යක්ෂවරුන් හා දිස්ත්‍රික් හා ප්‍රාදේශීය දේශපාලන අධිකාරිය සම්බන්ධකර ගනිමින් ග්‍රාම නිලධාරී වසම් භාරව සෘජුවම කටයුතු කරන රාජ්‍ය නිලධාරීන්, ප්‍රාදේශීය ආණ්ඩුවේ නියෝජිතයින් සමග ග්‍රාමීය ප්‍රජාව සවිබල ගැන්වීම සිදුකරන ලදී. ඒ සඳහා පුහුණු වැඩමුළු, අත්දැකීම් හුවමාරු, ඇතුළු වැඩසටහන් අවශ්‍යතාවයන් පරිදි දියත් කරන ලදී. හම්බන්තොට දිස්ත්‍රික්කයේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක් තුළම පිහිටුවා ඇති ග්‍රාම සභා වලට අදාළ නිලධාරීන් හා සාමාජිකයින් සඳහා ප්‍රාදේශීය ආණ්ඩු, ආයතන හා ප්‍රජාව අතර පැවතිය යුතු සබඳතා පිළිබඳ පුහුණු වැඩසටහන් ආරම්භ කරන ලදී.

**ග්‍රාම සභා වැඩපිළිවලේ වැදගත්කම පිළිබඳ ගරු ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා අදහස් දක්වමින් .....**

## තිස්සමහාරාම අංජලිගල ග්‍රාමයේ ග්‍රාම සභාව පිහිටුවීමේ අවස්ථාව

ස්ථාපිත කරන ලද ග්‍රාම සභා 60 තුල ඔවුන් විසින් ආර්ථික, සාමාජීය, සංස්කෘතික, දේශපාලන සහ පාරිසරික අංශ වලට අදාළව විවිධ ක්‍රියාකාරකම් ස්වඋත්සාහයෙන් ක්‍රියාත්මක කරමින් පවතී.

## ග්‍රාම සභා විසින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්



## 2.10 විමධ්‍යගත අයවැය වැඩසටහන

1973 වර්ෂයේ සිට වසර 40 ක් පුරා වසරින් වසර නව හැඩතලයන් අනුව වෙනස් වෙමින් විමධ්‍යගත අයවැය වැඩසටහන 2013 වර්ෂයේද ක්‍රියාත්මක විය. මූලික වශයෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක ජනගහනය, දරිද්‍රතාවය හා භූමි ප්‍රමාණය යන සාධක පදනම් කරගනිමින් දිස්ත්‍රික් අතර ප්‍රතිපාදන බෙදී යන ආකාරයෙන්, මෙහිදී රේඛීය අමාත්‍යාංශ හා අනෙකුත් ආයතනවලින් ප්‍රතිපාදන වෙන් නොවන ආර්ථික, භෞතික හා සමාජ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා විශේෂයෙන්ම පහත සඳහන් අංශයන් කෙරෙහි ප්‍රමුඛත්වය ලබා දී මෙම වැඩසටහන 2013 වර්ෂයේ ක්‍රියාත්මක විය.

මහජන නියෝජිතයන්ගේ අදහස්වලට හා ග්‍රාමීය සංවර්ධන සැලසුම්වලට මුල්තැන දෙමින් එක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුට රු. මි. 5.0 බැගින් මෙම වැඩසටහන මගින් ප්‍රතිපාදන වෙන් කරනු ලැබීය.



ඉහත සංරචක යටතේ 2013 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති බෙදී ගොස් ඇති ආකාරය පහත දැක්වේ.




ඉහත සඳහන් සංරචක පදනම් කර ගනිමින් 2013 වර්ෂයේ මෙම වැඩසටහන වෙනුවෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 225 ක් සඳහා රු.මි. 1125.00 ක මූල්‍ය ප්‍රතිපාදන වෙන් කරන ලදි. ඒ අනුව 2013.12.31 දින වන විට වෙන් රු.මි. 1056.55 ක ප්‍රමාණයක් ව්‍යාපෘති සඳහා වැය කර ඇත.

## විමධ්‍යගත අයවැය වැඩසටහන ප්‍රගතිය - 2013

වගු අංක 2.10.1

| අනු අංකය | දිස්ත්‍රික්කය | පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සංඛ්‍යාව | ව්‍යාපෘති සංඛ්‍යාව | වියදම රු.මි. (2013.12.31) |
|---|---|---|---|---|
| 1 | කොළඹ | 19 | 1062 | 119.27 |
| 2 | කළුතර | 10 | 467 | 63.04 |
| 3 | ගම්පහ | 18 | 752 | 99.06 |
| 4 | ගාල්ල | 10 | 774 | 51.66 |
| 5 | මාතර | 8 | 720 | 47.84 |
| 6 | හම්බන්තොට | 7 | 814 | 40.05 |
| 7 | කෑගල්ල | 9 | 461 | 44.54 |
| 8 | රත්නපුර | 10 | 684 | 57.35 |
| 9 | කුරුණෑගල | 15 | 1603 | 68.65 |
| 10 | පුත්තලම | 8 | 770 | 38.78 |
| 11 | මොණරාගල | 5 | 295 | 25.75 |
| 12 | බදුල්ල | 8 | 717 | 42.38 |
| 13 | මහනුවර | 12 | 1141 | 69.32 |
| 14 | මාතලේ | 5 | 577 | 26.52 |
| 15 | නුවරඑළිය | 7 | 707 | 12.91 |
| 16 | අනුරාධපුර | 9 | 756 | 45.16 |
| 17 | පොළොන්නරුව | 5 | 582 | 25.17 |
| 18 | මඩකලපුව | 5 | 414 | 29.59 |
| 19 | අම්පාර | 7 | 837 | 44.25 |
| 20 | ත්‍රිකුණාමලය | 4 | 182 | 21.63 |
| 21 | වවුනියාව | 6 | 190 | 10.76 |
| 22 | මුලතිව් | | 84 | 8.54 |
| 23 | මන්නාරම | | 196 | 15.05 |
| 24 | යාපනය | 9 | 781 | 41.02 |
| 25 | කිලිනොච්චි | | 95 | 8.26 |
| | ජාතික ලැයිස්තු මන්ත්‍රී වරුන් සංඛ්‍යාව | 29 | | |
| | **එකතුව** | **225** | **15,661** | **1,056.55** |

විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති කිහිපයක්

*බහු කාර්යය ගොඩනැගිල්ල අළුත් වැඩියා කිරීම,*
*නල්ලූර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය,*
*යාපනය දිස්ත්‍රික්කය*

*ශාන්ත මේරි විද්‍යාලයේ පිහිනුම් තටාකය ඉදි කිරීම කිරීම,*
*මතුගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය,*
*කළුතර දිස්ත්‍රික්කය*

*මහගම හල්පේ පොඳු නාන ළිද පිළිසකර කිරීම,*
*දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය,*
*ගම්පහ දිස්ත්‍රික්කය*

*වීරමල් මාවත 6 වන පටුමග සංවර්ධනය කිරීම,*
*කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය,*
*කොළඹ දිස්ත්‍රික්කය*

## 2.11 මහින්ද චින්තන ඉදිරි දැක්ම - පුනර්ජීවන වැඩසටහන යටතේ ප්‍රාථමික පාසල් 5000 ක් සංවර්ධනය කිරීමේ වැඩසටහන

### හැඳින්වීම

ශ්‍රී ලංකාවේ තත්කාලීන සංවර්ධන ප්‍රතිපත්ති රාමුව ලෙස පිළිගැනෙන "මහින්ද චින්තන ඉදිරි දැක්ම" අනුව ශ්‍රී ලංකාව ගෝලීය වශයෙන් සුවිශේෂ ආර්ථික කේන්ද්‍රස්ථානයක් බවට පත්කර ගැනීම සඳහා අවශ්‍ය නිපුණතා සහිත පුද්ගලයින් බිහි කිරීමේ අරමුණෙන් යුතුව ද්විතියික පාසල් දහසක් සහ ප්‍රාථමික පාසල් පන්දහසක් සංවර්ධනය කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය. මෙම අංග සම්පූර්ණ ප්‍රාථමික පාසල් 5000 සංවර්ධනය කිරීම මගින් දැයේ දරුවන්ට තම විභවතාවයන් උපරිම ලෙස සංවර්ධනය කර ගැනීමට පදනම සැකසීමට අවශ්‍ය වටපිටාව නිර්මාණය කිරීම මෙහි ප්‍රමුඛ අභිලාෂය වේ.

මේ අනුව ශ්‍රී ලංකාවේ ද්විතියික අධ්‍යාපනය ලැබීමට සුදුස්සන් වියයුතු වන්නේ ප්‍රාථමික අධ්‍යාපන අවධිය ඵලදායි ලෙස සම්පූර්ණ කළ, අවශ්‍ය මූලික නිපුණතා අත්පත් කරගන්නා ලද සිසුන්ය. මේ සඳහා ප්‍රාථමික පාසල් සිසුන්ගේ සෞඛ්‍ය සුරක්ෂිතතාව හා රැකවරණය කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් ප්‍රීතිමත් ඉගෙනුම් අවස්ථා සම්පාදනය කළයුතුය යන උත්තුංග පරමාර්ථයන් පෙරදැරිව මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම මූලික අභිප්‍රාය ලෙස සඳහන් කළ හැකිය.

### පළමු අදියර ( 2012 වසර)

රුපියල් මිලියන 828 ක වියදමින් ප්‍රාථමික පාසල් 1678 ක සංවර්ධන කටයුතු සාර්ථකව නිම කරන ලදී.

### දෙවන අදියර (2013 වසර)

රුපියල් මිලියන 1,580 ක වියදමින් ප්‍රාථමික පාසල් 3176 ක සංවර්ධන කටයුතු අපේක්ෂිත ඉලක්ක සපුරා ගනිමින් සාර්ථකව නිම කරන ලදී.

### වැඩසටහනේ අරමුණු

- ප්‍රාථමික පාසල් හා ද්විතීයික පාසල්වලට ඇතුළත් වීම සඳහා දැනට පවතින තදබදයට සාධාරණ හා ස්ථිරසාර විසඳුමක් ලබාදීම.
- පෝෂිත ප්‍රදේශය තුළ ප්‍රාථමික අධ්‍යාපනය සම්පූර්ණ කිරීම මගින් පාසල් දරුවන් සඳහා අංගසම්පූර්ණ විධිමත් ප්‍රාථමික අධ්‍යාපනයක් සහතික කිරීම .
- ඉතා දුර බැහැර සිට නගරයේ පාසල් වෙත ඇදෙන ප්‍රාථමික සිසුන් දැනට මුහුණ දෙන අවිවේකය ශාරීරික හා මානසික පීඩනය වැනි තත්වයන් සමනය කිරීමට සුදුසු වැඩපිළිවෙළක් වීම.
- ප්‍රාථමික පාසලක් සඳහා අනුමත නිර්ණායකවලට අනුව සපුරාලිය යුතු සම්පත් ලබාදීම මගින් ප්‍රාථමික පාසල් ළමා මිතුරු පාසල් ලෙස සංවර්ධනය කිරීම.
- ප්‍රාථමික පාසල් ළමා මිතුරු සංකල්පය මුල් කරගනිමින් ප්‍රියමනාප ඉගැනුම් ඉගැන්වීම් පරිසරයක් සම්පාදනය කරමින් ගුණාත්මක සංවර්ධනය සඳහා පාසල් පාදක ක්‍රියාකාරකම් සුවිශේෂිව හඳුනා ගැනීම හා ක්‍රියාත්මක කිරීම.
- ප්‍රාථමික පාසල් ළමා මිතුරු පාසල් ලෙස සංවර්ධනය කිරීම මගින් විදුහල්පතිවරුන් හා ගුරුවරුන්ගේ ශක්‍යතා වර්ධනය හා දෙමාපියන් දැනුවත් කිරීම මගින් දෙමව්පිය සහයෝගය ලබාගෙන ප්‍රාථමික අංශයේ අධ්‍යාපන කටයුතු වල ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම.

## වැඩසටහනේ ක්‍රියාකාරකම්

පාසල් සිතියම්ගතකරණයෙන් හඳුනාගනු ලැබූ ප්‍රාථමික පාසලේ සංවර්ධනය කිරීමට යෝජිත කාර්යයන් පදනම් කර ගනිමින් එසේ හඳුනා ගනු ලැබූ සියලුම ප්‍රාථමික පාසල්වල මූලික යටිතල පහසුකම් කෙටිකාලයක් තුළ පුනර්ජීවනය කිරීම. මේ යටතේ පහත සඳහන් අංග කෙරේ අවධානය යොමුකරමින් අත්‍යාවශ්‍ය හා කඩිනමින් කළ යුතු වැඩකොටස් විධිමත්ව හඳුනාගෙන වැඩිදියුණු කිරීමට පියවර ගැනීම.

1. විදුලිබල පහසුකම් සැපයීම.
2. ජල පහසුකම් සැපයීම.
3. වැසිකිලි හා සනීපාරක්ෂක පහසුකම් සංවර්ධනය.
4. පාසල් වැට හා ගේට්ටු සකස් කිරීම.
5. පවතින ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම හා තීන්ත ආලේපනය.
6. පාසල් භූමිය ආදර්ශමත් ගෙවතු වගාවක් බවට පත් කිරීම.
7. පාසලේ නාම පුවරුව සකස් කිරීම.
8. පළමු වසර සිසුන්ගේ ක්‍රියාකාරකම් කාමරයක් විධිමත් පරිදි සකස් කිරීම.
9. ළමා සෙල්ලම් මිදුල සකස් කිරීම.
10. ගුරුවරුන් දැනටමත් පදිංචි ගුරු නිවාසයක් ඇත්නම් එහි අත්‍යාවශ්‍ය අළුත්වැඩියාවන් පමණක් සිදු කිරීම.

## ප්‍රාථමික පාසල් 5000 ක් සංවර්ධනය කිරීමේ වැඩසටහන - 2013.12.31 දිනට ප්‍රගතිය

### 2 අදියර

වගු අංක 2.11.1

| දිස්ත්‍රික්කය | අනුමත කරන ලද පාසල් සංඛ්‍යාව | වැඩ නිම කරන ලද පාසල් සංඛ්‍යාව | 2013 වර්ෂය සඳහා වෙන්කල ප්‍රතිපාදන (රු.මි) | 2013.12.31 දිනට වියදම (රු.මි) | 2013.12.31 දිනට භෞතික ප්‍රගතිය (%) | 2013.12.31 දිනට මූල්‍ය උපයෝජනය (%) |
|---|---|---|---|---|---|---|
| කොළඹ | 97 | 97 | 48.50 | 45.28 | 100% | 93% |
| ගම්පහ | 84 | 84 | 42.04 | 41.76 | 100% | 99% |
| කළුතර | 79 | 79 | 40.49 | 40.22 | 100% | 99% |
| ගාල්ල | 161 | 161 | 80.58 | 80.45 | 100% | 100% |
| මාතර | 168 | 168 | 84.06 | 83.81 | 100% | 100% |
| හම්බන්තොට | 106 | 106 | 54.39 | 54.21 | 100% | 100% |
| මහනුවර | 145 | 145 | 72.50 | 71.94 | 100% | 99% |
| මාතලේ | 111 | 111 | 56.23 | 53.94 | 100% | 96% |
| නුවරඑළිය | 232 | 229 | 116.00 | 100.07 | 98% | 86% |
| යාපනය | 101 | 101 | 50.50 | 50.50 | 100% | 100% |
| කිලිනොච්චිය | 25 | 25 | 12.50 | 12.50 | 100% | 100% |
| මුලතිවු | 33 | 33 | 16.50 | 16.50 | 100% | 100% |
| මන්නාරම | 36 | 36 | 18.00 | 17.83 | 100% | 99% |
| වවුනියාව | 48 | 48 | 24.23 | 24.02 | 100% | 99% |
| කුරුණෑගල | 453 | 453 | 226.60 | 225.12 | 100% | 99% |
| පුත්තලම | 151 | 151 | 79.74 | 74.69 | 100% | 94% |
| බදුල්ල | 65 | 65 | 32.89 | 32.85 | 100% | 100% |
| මොණරාගල | 37 | 37 | 18.50 | 18.31 | 100% | 99% |
| අම්පාර | 82 | 82 | 41.55 | 40.77 | 100% | 98% |
| මඩකලපුව | 82 | 82 | 41.18 | 41.02 | 100% | 100% |
| ත්‍රිකුණාමලය | 128 | 128 | 64.00 | 62.35 | 100% | 97% |
| කෑගල්ල | 240 | 240 | 136.09 | 134.87 | 100% | 99% |
| රත්නපුරය | 218 | 218 | 109.19 | 107.89 | 100% | 99% |
| අනුරාධපුරය | 190 | 190 | 97.47 | 96.55 | 100% | 99% |
| පොළොන්නරුව | 104 | 104 | 52.36 | 52.13 | 100% | 100% |
| එකතුව | **3,176** | **3,173** | **1,616 .08** | **1,579.58** | **100%** | **98%** |

**ප්‍රාථමික පාසල් 5000 ක් සංවර්ධනය කිරීමේ වැඩසටහන 2 අදියර යටතේ සාර්ථකව වැඩ අවසන් කරන ලද ව්‍යාපෘති කිහිපයක් ...**

*සුනන්දෝපනන්ද විද්‍යාලයේ කැඩීබිඳී ගිය වහළ සහිත ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කිරීම*
*මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය*
*කොළඹ දිස්ත්‍රික්කය*

*වැල්වෙටි විනයාගර් විද්‍යාලයේ ළිඳ ආවරණය කිරීම හා රථගාලක් ඉදිකිරීම*
*කරවෙඩ්ඩි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය*
*යාපනය දිස්ත්‍රික්කය*

*ගල්ලොළුව රෝමානු කතෝලික ප්‍රාථමික විද්‍යාලයේ සෙල්ලම් මිදුල ඉදිකිරීම*
*මිනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය*
*ගම්පහ දිස්ත්‍රික්කය*

## 2.12 ප්‍රජා අවශ්‍යතා හඳුනා ගැනීමේ ජනතා සත්කාරය හා ජංගම සේවා

ජනතා අවශ්‍යතා සෘජුවම හඳුනා ගැනීම හා ඒවාට කඩිනම් විසඳුම් ලබා දීමේ අරමුණින් **2014** " දයට කිරුළ" ජාතික සංවර්ධන වැඩසටහනට සමගාමීව පුත්තලම, කුරුණෑගල හා කෑගල්ල යන දිස්ත්‍රික්ක වල සියළුම ග්‍රාම නිලධාරි වසම් ආවරණය වන පරිදි ග්‍රාමීය ජනහමු හා ජංගම සහන සේවා පැවැත්වීම 2013.07.01 දින ආරම්භ කරන ලදි. ඒ අනුව අදාල දිස්ත්‍රික්ක 03 හි සියළුම ග්‍රාම නිලධාරි වසම් ආවරණය වන පරිදි ග්‍රාමීය ජනහමු හා ජංගම සේවා 2731 ක් පවත්වා ඇත.

***ග්‍රාමීය ජනහමු හා ජංගම සේවා පැවැත්වීමේ අරමුණු***

- ග්‍රාම සේවා වසම තුළ පුද්ගලයා සහ පවුල කේන්ද්‍ර කරගෙන ඔවුන්ගේ ගැටළු හා අවශ්‍යතා හඳුනාගෙන ඒවා විසඳීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම
- ග්‍රාම නිලධාරි වසම තුළ වැඩි දියුණු කළ යුතු පොදු පහසුකම් සහ අවශ්‍යතා හඳුනා ගැනීම හා ඒවා විසඳීමට ප්‍රමුඛතාව ලබාදීම
- ජනතාවගේ මූලික ප්‍රශ්න හා බැඳුනු සියළුම රාජ්‍ය ආයතනවල සේවාවන් ගමේ ජනතාවට ගම තුළදීම ලබාදීම
- ජනතාවගේ අවශ්‍යතා සපුරා ගැනීම උදෙසා ඔවුන් දැනුවත් කිරීම, සායන හා උපදේශන පැවැත්වීම තුළින් ඔවුන් ප්‍රායෝගිකව සංවර්ධන ක්‍රියාදාමයට සම්බන්ධ කර ගැනීම
- ගමේ සංවර්ධනය සඳහා අවශ්‍යතා හඳුනා ගැනීම, සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, මෙහෙයවීම හා ඇගයීම යන සියළු අවස්ථාවන්ට ප්‍රජාව ක්‍රියාකාරීව සම්බන්ධ කර ගැනීම

මූලික වශයෙන් මෙම ග්‍රාමීය ජනහමු හා ජංගම සේවාවන් වලදී පහත දෑ ක්‍රියාත්මක කරන ලද අතර ඒ යටතේ ජනතාවට හිමිවූ ප්‍රතිලාභයන්ද දක්වා ඇත.

| ප්‍රජා ගැටළු හඳුනා ගැනිම හා විසඳුම් ලබා දීම | හඳුනාගත් ප්‍රජා අවශ්‍යතා සඳහා උපකරණ හා ද්‍රව්‍ය ලබා දීම | පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | සෞඛ්‍ය සායන පැවැත්වීම |
|---|---|---|---|
| විවාහ, උප්පැන්න, හා මරණ සහතික, ඉඩම් බලපත්‍ර, විදේශ ගමන් බලපත්‍ර ලබා දීම | රෝදපුටු, අත්වාරු, ඇස්කණ්ණාඩි, ක්‍රීඩාභාණ්ඩ, උළු, පැලවර්ග හා සතුන් ලබා දීම | දිවි නැඟුම, ස්වයං රැකියා, මත් ද්‍රව්‍ය නිවාරණ , ප්‍රජා සෞඛ්‍ය වැඩසටහන් පැවැත්වීම | ළමා හා මාතෘ සායන, අක්ෂි පරීක්ෂාව, බෝ නොවන රෝග පරීක්ෂාව |

මෙම ග්‍රාමීය ජන හමු හා ජංගම සේවාවන්වලදී මතුවූ ගැටළු පොදු හා පෞද්ගලික වශයෙන් ප්‍රධාන කොටස් 02 යටතේ හඳුනාගන්නා ලද අතර දිස්ත්‍රික්ක 03 හි පෞද්ගලික මට්ටමින් මතුවූ යෝජනා විසඳීමේ ප්‍රගතිය පහත පරිදි වේ.

වගු අංක 2.12.1

| අනු අංකය | ගැටළු මතුවූ ක්ෂේත්‍රය | ඉදිරිපත් වූ ගැටළු සංඛ්‍යාව | විසඳූ ගැටළු සංඛ්‍යාව | තවදුරටත් විසඳීමට ඇති ගැටළු සංඛ්‍යාව | ගැටළු විසඳීමේ ප්‍රතිශතය % |
|---|---|---|---|---|---|
| 1 | සහතික හා බලපත්‍ර | 110,202 | 101,328 | 8,874 | 92 |
| 2 | සමාජ ආරක්ෂණය | 184,917 | 124,846 | 60,071 | 68 |
| 3 | සෞඛ්‍ය | 172,209 | 168,680 | 3,529 | 98 |
| 4 | දිවි නැඟුම | 101,443 | 52,059 | 49,184 | 51 |
| 5 | නිවාස සහ ඉඩම් | 256,022 | 87,889 | 168,133 | 34 |
| 6 | පොදු පහසුකම් | 142,262 | 56,147 | 86,115 | 39 |
| 7 | තරුණ හා කාන්තා කටයුතු | 15,276 | 8,782 | 6,494 | 57 |
| 8 | අධ්‍යාපනය | 14,435 | 6,842 | 7,593 | 47 |
| 9 | වාරිමාර්ග | 9,097 | 4,098 | 4,999 | 45 |
| 10 | ආගමික කටයුතු හා වෙනත් | 34,636 | 23,255 | 11,381 | 67 |
| | **එකතුව** | **1,040,299** | **633,926** | **406,373** | **61** |

*උප්පැන්න, විවාහ හා මරණ සහතික, ඉඩම් බලපත්‍ර, විදේශ ගමන් බලපත්‍ර ලබා ගැනීම*

*රැකියා ලියාපදිංචි කිරීමේ වැඩසටහන*

අදාල දිස්ත්‍රික්කක් 03 හි ජංගම සේවාවන් පැවැත්වීමේදී ඉදිරිපත්වූ ප්‍රජා අවශ්‍යතා පිළිබඳ ඉල්ලීම් සඳහා විසඳුම් ලබාදීම හැකිතාක් දුරට එදිනම ඉටු කරනු ලැබූ අතර ප්‍රජා අවශ්‍යතා සපුරාලීම පිළිබඳ ප්‍රගතිය පහත පරිදිවේ.

වගු අංක 2.12.2

| උපකරණ වර්ගය | ඉල්ලුම් කළ සංඛ්‍යාව | එදිනම ලබාදුන් සංඛ්‍යාව |
|---|---|---|
| රෝද පුටු | 2,670 | 593 |
| අත්වාරු | 1,286 | 337 |
| ඇස්කණ්නාඩි | 116,158 | 72,459 |
| ක්‍රීඩා භාණ්ඩ | 1,983 | 1,311 |
| ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් යටතේ ලබාදිය හැකි යෙදවුම් | 6,879 | 1,661 |
| වැසිකිලි උපාංග | 23,879 | 1,688 |
| පැළ වර්ග | 256,140 | 166,978 |
| සතුන් | 20,259 | 1,633 |
| වෙනත් උපකරණ | 37,917 | 26,383 |

*රෝද පුටු ලබා දීම*

*පැළ වර්ග ලබාදීම*

එමෙන්ම මධ්‍යම රජයේ හා අදාළ පළාත් සභාවල විවිධ අමාත්‍යාංශ හා රාජ්‍ය ආයතන, පෞද්ගලික අංශයේ සහයෝගයද ඇතිව එක්ව හඳුනාගත් විවිධ ප්‍රජා අවශ්‍යතාවයන් සඳහා විවිධ වැඩසටහන් රාශියක් බහුවිධ ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි පැවැත්වූ අතර ඒ පිළිබඳව විස්තර පහත වගුවෙහි පරිදි වේ.

වගු අංක 2.12.3

| වැඩසටහන | වැඩසටහන් සංඛ්‍යාව | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|
| සෞඛ්‍ය සායන | 2,464 | 235,533 |
| මාතෘ හා ළමා පෝෂණ වැඩසටහන් | 638 | 28,400 |
| පුහුණු වැඩසටහන් | 432 | 12,715 |
| • ආහාර සැකසීම | 3 | 60 |
| • රූපලාවන්‍ය වැඩසටහන් | 170 | 4,766 |
| • වෙනත් (පැහැදිලි කරන්න) | 384 | 16,907 |
| දිවි නැඟුම දැනුවත් කිරීමේ වැඩසටහන් | 176 | 7,373 |
| • කෘෂිකර්ම අංශය | 704 | 27,325 |
| • සත්ව පාලන අංශය | 392 | 9,176 |
| • ධීවර අංශය | 96 | 1,207 |
| • ව්‍යවසාය සංවර්ධන අංශය | 339 | 12,883 |
| • වෙනත් | 2 | 42 |
| මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් | 402 | 21,980 |
| ශ්‍රමදාන වැඩසටහන් | 1,430 | 80,500 |
| ආගමික වැඩසටහන් | 822 | 122,716 |
| පරිසර වැඩසටහන් | 376 | 22,366 |
| වෙනත් දැනුවත් කිරීමේ වැඩසටහන් | 1,071 | 162,364 |

*සෞඛ්‍ය සායන පැවැත්වීම*

*දිවි නැඟුම වැඩසටහන පිළිබඳව දැනුවත් කිරීම*

මෙම ජංගම සේවාවන්හි දෙවන අදියර ලෙස මැතිවරණ කොට්ඨාශ මට්ටමින් ජංගම සේවා 2014 ජනවාරි මාසයේදී පැවැත්වේ. එහිදීත් විසඳුම් ලබා දීමට නොහැකි වන ගැටළු ඇත්නම් "දයට කිරුළ" ප්‍රදර්ශන කුටිවලදී අදාළ විෂයභාර අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මගින් පවත්වනු ලබන ජංගම සේවාවන්වලදී සලකා බැලේ.

ඉහත දිස්ත්‍රික්ක තුනෙහි ජංගම සේවාවන් වලදී ජනතා ගැටළු හඳුනා ගැනීමේදී හා එම ගැටළු විසඳීමේදී ලද සාර්ථකත්වය මත 2014 වර්ෂයේ මුල් කාර්තුවේදී මෙම වැඩසටහන අනෙකුත් දිස්ත්‍රික්කවල සියළුම ග්‍රාම නිලධාරි වසම් ආවරණය වන පරිදි ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් දැනට සම්පාදනය කරමින් පවතී.

## 2.13 සමෘද්ධිමත් ගමක් උදෙසා බල මුළු ගැන්වූ තරුණ ජවය

ශ්‍රී ලංකාව ආසියාවේ ආශ්චර්යය කරා යන ගමනේදී සියළු පහසුකම් වලින් සපිරි, සවිබල ගැන්වූ ප්‍රජාවක් සහිත සමෘද්ධිමත් ගමක් නිර්මාණය කිරීම උදෙසා මහින්ද චින්තන ඉදිරි දැක්ම ගුරු කොට ගනිමින් ග්‍රාමීය මට්ටමින් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන සියළුම සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘති වඩාත් කාර්යක්ෂමව, විධිමත්ව හා ජවසම්පන්නව ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය ශක්තිමත් සම්බන්ධීකරණයක් හා මෙහෙයවීමක් ලබා දීම සඳහා තරුණ උපාධිධාරීන් ආර්ථික සංවර්ධන නිලධාරීන් ලෙස අමාත්‍යාංශයට අනුයුක්ත කර ගන්නා ලදි.

මෙසේ බඳවා ගන්නා ලද ආර්ථික සංවර්ධන නිලධාරීන් සඳහා රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ සහය ඇතිව දිවයින පුරා පිහිටි හමුදා පුහුණු මධ්‍යස්ථාන 16 කදී අදියරයන් 05 ක් යටතේ සති දෙකක කාලසීමාවක් තුළ ප්‍රායෝගික හා න්‍යායාත්මක නායකත්ව පුහුණුවක් ලබා දෙන ලදි. අදාළ පුහුණු වැඩසටහන් සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශ්‍ය මගින් රු. මි. 154.59 ක මුදලක් වැය කර ඇත. මෙම නිලධාරීන්ට තම කාර්යයන් වඩාත් කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා අවශ්‍ය කාර්යාල පහසුකම් හා උපකරණ ලබා දීම වෙනුවෙන් රු.මි.280 ක් අමාත්‍යාංශය මගින් 2013 වර්ෂයේදී වැය කර ඇත.




මේ වන විට ආර්ථික සංවර්ධන නිලධාරීන් 15,539 ක් අමාත්‍යාංශය විසින් අනුයුක්ත කර ඇති අතර එම නිලධාරීන් ගෙන් 15,506 ක් ග්‍රාම නිලධාරි වසම් මට්ටමින්ද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා දිස්ත්‍රික් ක්‍රමසම්පාදන කාර්යාල මට්ටමින්ද සේවය සඳහා යොදවා ඇත. ඔවුන් වෙත පවරා ඇති රාජකාරි පහත පරිදි වේ.

### ආර්ථික සංවර්ධන නිලධාරීන් ඉටු කලයුතු රාජකාරි

- ග්‍රාමීය සම්පත් පැතිකඩ සකස් කිරීම
- ගම සඳහා දත්ත පද්ධතියක් සකස් කිරීම
- ගමේ අවශ්‍යතා ප්‍රමුඛතාවය මත පදනම්ව ග්‍රාමීය සංවර්ධන සැලැස්ම සකස් කිරිම
- දිවි නැගුම, ගම නැගුම, විමධ්‍යගත අයවැය වැඩසටහන, ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන, පුර නැගුම, විදේශ ව්‍යාපෘති, සංචාරක කටයුතු හා ග්‍රාමීය ජනහමු හා ජංගම සේවා පැවැත්වීම ආදි ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන සියළුම සංවර්ධන වැඩසටහන් සම්බන්ධීකරණය හා මෙහෙයවීම
- ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ බල ප්‍රදේශය තුල ඇති රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධීකරණය පවත්වා ගැනීම
- ගමේ ගැටළු හෝ ආපදා තත්වයන් හඳුනාගෙන ඒවා වලක්වාලිමට සුදුසු වැඩපිලිවෙලක් යෙදිම හා එවැනි අවස්ථාවලදී ජනතාව සමඟ සහජීවනයෙන් කටයුතු කිරීම
- සමාජ සුභසාධන කාර්යභාරය ඉටු කිරීම
- ගමේ පොදු කටයුතු වලට සම්බන්ධවීම
- වසම තුල අනෙකුත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතන මගින් ක්‍රියාත්මක සියළුම සංවර්ධන වැඩසටහන් සම්බන්ධීකරණය

මේ අනුව ඔවුන් ග්‍රාම නිලධාරි වසම් මට්ටමේදී ග්‍රාම නිලධාරීන්, සමෘද්ධි සංවර්ධන නිලධාරීන්, (වර්තමානයේ දිවි නැගුම සංවර්ධන නිලධාරීන්) කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන් හා පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන් සමඟ එක්ව කණ්ඩායමක් ලෙස ඒකාබද්ධ වෙමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ගම්මට්ටමින් ක්‍රියාත්මක කිරීමෙහිලා සුවිශේෂි කාර්යභාරයක් ඉටු කරනු දැකිය හැක.

පුහුණු වැඩසටහන් වල අවස්ථා කිහිපයක් පහතින් දැක්වේ

පුහුණුව

අවධානය

නිරීක්ෂණය

ක්‍රියාත්මක වීම

# 3

# පුර නැඟුම - පරිසර හිතකාමී නාගරික පරිසරයක්

## 3. පුර නැගුම - පරිසර හිතකාමී නාගරික පරිසරයක්

රටේ සිදුවන වේගවත් සංවර්ධන ක්‍රියාදාමයට සමගාමීව ග්‍රාමීය හා අර්ධ නාගරික ප්‍රදේශ ආශ්‍රිතව ජීවත් වන ජනතාවට අවශ්‍ය සේවා පහසුකම් සම්පාදනය වෙනුවෙන් එම ප්‍රදේශ ප්‍රාදේශීය සේවා මධ්‍යස්ථාන ලෙස සංවර්ධනය කිරීම පුර නැගුම වැඩසටහනෙහි මූලික අරමුණ විය. "පුර නැගුම" නියාමක වැඩසටහනක් ලෙස 2013 වර්ෂයේදීද අඛණ්ඩව බස්නාහිර පළාත තුළ ක්‍රියාත්මක කරන ලදී. මෙහිදී විශේෂයෙන්ම සෞඛ්‍ය, වෙළඳ හා විනෝදාස්වාදය යනාදී ක්ෂේත්‍රයන්හි දියුණුව උදෙසා පහත සඳහන් සංවර්ධන කාර්යයන් සිදු කරන ලදී.

### පුර නැගුම වැඩසටහන මගින් ආවරණය වූ ක්ෂේත්‍ර



## 3.1 නිරෝගී පරපුරක් බිහිකිරීම උදෙසා ළමා හා මාතෘ සායන මධ්‍යස්ථාන සංවර්ධනය

*සංවර්ධනය කරන ලද යක්කල ළමා හා මාතෘ සායන මධ්‍යස්ථානය*
*ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය*

*සංවර්ධනය කරන ලද බුදුවතුගොඩ ළමා හා මාතෘ සායන මධ්‍යස්ථානය*
*ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය*

2010 වර්ෂයේදී නියමු ව්‍යාපෘතියක් ලෙස ගම්පහ දිස්ත්‍රික්කයෙන් ආරම්භ කරන ලද ළමා හා මාතෘ සායන මධ්‍යස්ථාන වල පහසුකම් සංවර්ධනය කිරීම අදියර 3 ක් යටතේ ක්‍රියාත්මක විය. 2013 වර්ෂයේදී ගම්පහ, කටාන, මිනුවන්ගොඩ, ජා ඇල, වත්තල, මීගමුව, කැළණිය, බියගම, අත්තනගල්ල, දොම්පෙ, මහර හා දිවුලපිටිය යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල රු.මි 233.43 ක වියදමින් ළමා හා මාතෘ සායන මධ්‍යස්ථාන 31 ක වැඩ අවසන් කර ඇත.




## 3.2 අලෙවි/පාරිභෝගික දෙපාර්ශවයටම ප්‍රතිලාභ සැලසෙන සති පොළ සංවර්ධනය

විසල් අරමුණු කරා යා හැක්කේ අපේ නැගී එන ව්‍යාපාරිකයින් ආරක්ෂා කොට ඉදිරියට යාමට දිරි දීමෙන් පමණි. ඒ සඳහා අවශ්‍ය සියළු පහසුකම් දේශීය මධ්‍ය සහ කුඩා ව්‍යාපාරිකයින්ට ලබාදීමට අවශ්‍ය පියවර ගන්නෙමි.

මහින්ද චින්තන ඉදිරි දැක්ම, පිටුව 93

*ජොසිකාවත්ත සතිපොළෙහි ඉදිකිරීම් කටයුතු නිමවෙමින් පවතින ආකාරය*
*ජා ඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය*

*වැලිවේරිය සතිපොළෙහි පාරිභෝගිකයින් භාණ්ඩ මිලදී ගන්නා ආකාරය*
*ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය*




2013 වර්ෂයේදී රු.මි 307.20 ක මුදලක් සති පොළ සංවර්ධන කාර්යයන් සඳහා ආයෝජනය කරන ලදී.

**2013 වර්ෂය තුළ ඉදිකිරීම් කටයුතු සම්පූර්ණයෙන්ම අවසන් කරන ලද සති පොළ ව්‍යාපෘති**

වගු අංක 3.2.1

| සංවර්ධනය කිරීමට හඳුනාගත් සති පොළ | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | 2013 වර්ෂය සඳහා වැය කරන ලද මුදල රු.මි |
|---|---|---|
| මිනුවන්ගොඩ සතිපොළ | මිනුවන්ගොඩ | 27.19 |
| නයිවල සතිපොළ | මිනුවන්ගොඩ | 20.98 |
| බෝපිටිය සතිපොළ | වත්තල | 25.50 |
| බඩල්ගම සතිපොළ | දිවුලපිටිය | 30.10 |
| වැලිවේරිය සතිපොළ | ගම්පහ | 51.29 |
| පට්ටිවිල සතිපොළ | බියගම | 8.51 |
| මාවරමණ්ඩිය සතිපොළ | බියගම | 56.97 |
| **එකතුව** | | **173.25** |

## 2013 වර්ෂය තුළ ඉදිකිරීම් කටයුතු ක්‍රියාත්මක තත්ත්වයේ පවතින සති පොළ ව්‍යාපෘති

වගු අංක 3.2.2

| සංවර්ධනය කිරීමට හඳුනාගත් සති පොළ | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | 2013 වර්ෂය සඳහා වැය කරන ලද මුදල රු.මි |
|---|---|---|
| කාමච්චෝඩ සතිපොළ | මීගමුව | 43.97 |
| දිවුලපිටිය සතිපොළ | දිවුලපිටිය | 18.19 |
| පල්ලෙවෙල සතිපොළ | මීරිගම | 3.23 |
| යක්කල සතිපොළ | ගම්පහ | 49.81 |
| රන්පොකුණගම සතිපොළ | අත්තනගල්ල | 3.02 |
| තිහාරිය සතිපොළ | අත්තනගල්ල | 3.43 |
| ඌරාපොල සතිපොළ | අත්තනගල්ල | 7.56 |
| වේයන්ගොඩ සතිපොළ | අත්තනගල්ල | 4.84 |
| එකතුව | | **134.05** |

## 3.3 සමබර ශාරීරික හා මානසික සෞඛ්‍ය සංවර්ධනයට සුවතා මංතීරු

*මහර, දළුපිටිය ශරීර සුවතා මංතීරුව*

කැළණිය, කිරිබත්ගොඩ ශරීර සුවතා මංතීරුව

ජනතාවගේ කායික හා මානසික සෞඛ්‍ය ඉහළ නංවා සෞඛ්‍ය සම්පන්න ප්‍රජාවක් බිහිකිරීමේ අරමුණ පෙරදැරිව ඉතා දර්ශනීය ආකාරයෙන් සුවතා මංතීරු ඉදිකිරීමට අමාත්‍යාංශය පියවර ගන්නා ලදී.

වගු අංක 3.3.1

| ව්‍යාපෘතියේ නම | 2013.12.31 දිනට සමස්ත වැඩසටහන සඳහා වැය කරන ලද මුදල රු.මි |
|---|---|
| ගම්පහ ඔරුතොට ව්‍යායාම මංතීරුව | 41.68 |
| කැළණිය, කිරිබත්ගොඩ ව්‍යායාම මංතීරුව | 66.28 |
| මහර, දළුපිටිය ව්‍යායාම මංතීරුව | 80.48 |
| බියගම, සියඹලාපේ ව්‍යායාම මංතීරුව | 20.00 |
| ලුනාව, ව්‍යායාම මංතීරුව | 9.00 |
| එකතුව | **217.44** |




## 3.4 සුන්දර විවේකයක් ගතකිරීමට දියත උයන

*සංවර්ධනය කරන ලද දියත උයන*

රජය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයෙන් කරන ලද ඉල්ලීමකට අනුව බත්තරමුල්ල, දියත උයන සංවර්ධන කටයුතු සඳහා 2013 වර්ෂයේදී අමාත්‍යාංශය රු.මි 49.15 ක ප්‍රතිපාදන ලබා දී ඇති අතර 2013.12.31 දින වන විට ලබාදුන් ප්‍රතිපාදන මුදල් සියල්ල වැය කර ඇත

# 4

# ප්‍රාදේශීය වර්ධන මධ්‍යස්ථාන - පැතිරුනු සංවර්ධනයක්

## 4. ප්‍රාදේශීය වර්ධන මධ්‍යස්ථාන - පැතිරුනු සංවර්ධනයක්

වේගවත් ආර්ථික සංවර්ධනයක් කරා ගමන්කිරීමට අඛණ්ඩ ඉහළ ආර්ථික වර්ධන වේගයක් පවත්වා ගැනීම අත්‍යාවශ්‍ය සාධකයකි. යුධමය තත්ත්වය හේතුවෙන් ආර්ථික පසුබෑමකට ලක්ව තිබූ උතුරු හා නැගෙනහිර පළාත් මෙන්ම දිවයිනේ අනෙකුත් පළාත්ද විධිමත් හා කඩිනම් සංවර්ධන ක්‍රියාදාමයකට යොමු කරවා දළ ජාතික නිෂ්පාදිතය සඳහා ඉහළ දායකත්වයක් ලබාගැනීම සඳහා තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් ඇති කිරීම රජයේ අපේක්ෂාව වේ.

පළාත් නැගුම

උතුරු හා නැගෙනහිර පළාත් වල සීඝ්‍ර සංවර්ධනයක් අපට කෙටි කලකින් ලබා ගත හැකි වූයේ එම දෙපළාත් සඳහා කාර්ය සාධන බලකායන් පිහිටුවීමෙනි. මෙම අත්දැකීම උපයෝගී කරගෙන රජරට නවෝදය, වයඹ පුබුදුව, පුබුදමු වෙල්ලස්ස, කඳුරට උදානය සහ සබරගමුව අරුණාලෝකය යන පංච පළාත් සංවර්ධන කඩිනම් වැඩසටහනක් ක්‍රියාත්මක කරමි. ඒ සඳහා පළාත් සභාවද ඒකාබද්ධ කර ගන්නා කාර්ය සාධන බලකායන් පහක් පිහිටුවමි.

- කොළඹ හා තදාසන්න නගර මධ්‍යම ආදායම්ලාභී රටක මට්ටමකට පරිසර හිතකාමී ලෙස නවීකරණය කරමින් දකුණු ආසියාවේ වාණිජ කේන්ද්‍රස්ථානය ලෙස සංවර්ධනය කරමි.
- හම්බන්තොට වරාය නගරයක් ලෙසත් ගාලු පුරවරය සංචාරක කේන්ද්‍රස්ථානයක් ලෙසත් මාතර දකුණ අභිමානයේ නගරය ලෙසත් සංවර්ධනය කරන්නෙමි.

මහින්ද චින්තන ඉදිරි දැක්ම, පිටුව 17,18

පළාත් අතර පවතින මෙම සංවර්ධන විෂමතාවයන් අවම කර තුලිත ආර්ථික සංවර්ධනයක් ළඟා කරගැනීමව පළාත් 9 සඳහා ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන් 9ක් 2013 වර්ෂයේදීද ක්‍රියාත්මක කරන ලදී.



මෙම වැඩසටහන් සැලසුම්කර ක්‍රියාත්මක කිරීමේදී පළාතේ පවතින සම්පත් හා විභවතා අනුසාරයෙන් ප්‍රදේශයට ආවේණික අනන්‍යතා ලක්ෂණ, ස්ථානීය වෙනස්කම් හා ආර්ථික හැකියාවන් සැළකිල්ලට ගනු ලබන අතර මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී ඉහළ ප්‍රමිතියෙන් යුක්ත යටිතල පහසුකම් ඉදිකිරීම සහ නිපුණ මානව සම්පත් අභිවර්ධනය මගින් ප්‍රදේශයට අත්වන ප්‍රතිලාභ වැඩිකිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කර ඇත.

2013 වර්ෂයේදීද අමාත්‍යාංශය විසින් අංශ කිහිපයක් යටතේ ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

## 4.1 ගම හා නගරය යා කරමින් ක්‍රියාත්මක වන මාර්ග හා පාලම් සංවර්ධන වැඩසටහන්

මීට වසර කීපයකට පෙර රූපවාහිනී නාලිකාවලින් පවා අපට නිතර දකින්නට ලැබුණේ රෝගියෙකු පවා රෝහලකට ගෙන යා නොහැකි තත්ත්වයට අබලන් වූ මාර්ග පද්ධතියකි. කි.මී 11700 ක් වූ ජාතික මාර්ග පද්ධතියෙන් මා බලයට පත්වීමට පෙර වූ වසර 20 තුළම සංවර්ධනය කර තිබුණේ කි.මී 2000 කටත් අඩු ප්‍රමාණයකි. එහෙත් පසුගිය වසර 4 තුළ පමණක් මහාමාර්ග කි.මී 2278 ක් පුළුල් කර ඇති අතර තවත් මහා මාර්ග කි.මී 2823 ක් ඉදි වෙමින් පවතී. තවත් කි.මී 4000 ක් ඉදිරි වසර තුළදී සංවර්ධනය කරමි. මෙයින් කි.මී 1200 ක්ම උතුරු පළාතට අයත් මහා මාර්ග වනු ඇත. අද ලංකාවේ ඕනෑම දුර බැහැර පළාතක සිට පැය කීපයකින් පැමිණිය හැකි පරිදි ප්‍රධාන මාර්ග වලින් වැඩි කොටසක් කාපට් පාරවල් ලෙස සකස් කර ඇත. එසේම සෑම ගමකම වාගේ කොන්ක්‍රීට් ඇතුරු මාර්ග පද්ධතියක් සකස් වෙමින් පවතී.

මහින්ද චින්තන ඉදිරි දැක්ම, පිටුව 43

දිවයින පුරා පුළුල්ව ක්‍රියාත්මක වන මාර්ග සංවර්ධන වැඩසටහන් මගින් පොදු හා පෞද්ගලික ප්‍රවාහන පද්ධතියට ප්‍රතිලාභ රැසක් අත්වී ඇති අතර ප්‍රවාහනය කාර්යක්ෂමවී පළාත් අතර සමබර ආර්ථික වර්ධනයක් උදෙසාද එම තත්ත්වය මනා පිටිවහලක් වනු ඇත.



## අන්තර් පළාත් මාර්ග කාපට් කිරීමේ ව්‍යාපෘතියෙහි සමුච්චිත ප්‍රගතිය-(2011-2013)

බස්නාහිර, මධ්‍යම, දකුණ, වයඹ, උතුරු මැද, ඌව සහ සබරගමුව පළාත් වල ක්‍රියාත්මක වන සෑම ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහනකම පළාත් මාර්ග කාපට් කිරීම ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘතියකි.

ඉලක්කගත දුර කි.මී ගණන : 4,163.05
වැඩ අවසන් කර ඇති දුර කි.මී ගණන : 3,443.01
සමුච්චිත පිරිවැය (2011-2013) රු.මි : 46,324.26

2013 වර්ෂයේ නිම කරන ලද මාර්ග සංවර්ධන ව්‍යාපෘති

*කාපට් අතුරන ලද 17 කණුව නවගත්තේගම මාර්ගය*
*ආනමඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය*
*පුත්තලම දිස්ත්‍රික්කය*

*කාපට් අතුරන ලද හීල්ඔය ඇල්ලමලේ මාර්ගය*
*බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය*
*බදුල්ල දිස්ත්‍රික්කය*

*කාපට් අතුරන ලද මාකඳුර උඩවෙල මාර්ගය*
*කටුගම්පොළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය*
*කුරුණෑගල දිස්ත්‍රික්කය*

*කාපට් අතුරන ලද හුන්නස්ගිරිය බඹරබැද්ද මාර්ගය*
*උඩුදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය*
*මහනුවර දිස්ත්‍රික්කය*

## අන්තර් පළාත් මාර්ග කාපට් කිරීමේ ව්‍යාපෘතියෙහි සමුච්චිත ප්‍රගතිය-2011-2013

වගු අංක 4.1.1

| ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන | දිස්ත්‍රික්කය | සමස්ත වැඩසටහනේහි අනුමත මාර්ග ව්‍යාපෘති සංඛ්‍යාව | සංවර්ධනය කිරීමට ඉලක්කගත කි.මී සංඛ්‍යාව | 2013.12.31 දිනට වැඩ අවසන් කර ඇති කි.මී සංඛ්‍යාව | වැඩ අවසන් ව්‍යාපෘති සංඛ්‍යාව | ක්‍රියාත්මක තත්ත්වයේ පවතින ව්‍යාපෘති සංඛ්‍යාව | 2013.12.31 දිනට දරණ ලද වියදම රු.මි |
|---|---|---|---|---|---|---|---|
| බටහිර රන් අරුණ | කොළඹ | 103 | 167.10 | 163.33 | 100 | 3 | 1,806.23 |
| | කළුතර | 84 | 206.40 | 198.00 | 83 | 1 | 1,941.01 |
| | ගම්පහ | 162 | 318.21 | 272.69 | 139 | 15 | 3,524.89 |
| කඳුරට උදානය | මහනුවර | 163 | 448.65 | 277.92 | 76 | 49 | 4,191.93 |
| | මාතලේ | 25 | 126.97 | 97.60 | 11 | 14 | 1,579.56 |
| රුහුණු උදානය | ගාල්ල | 102 | 347.85 | 280.75 | 71 | 31 | 3,020.97 |
| | මාතර | 73 | 246.22 | 236.89 | 64 | 9 | 3,508.34 |
| | හම්බන්තොට | 24 | 120.75 | 108.35 | 20 | 4 | 1,481.25 |
| වයඹ පුබුදුව | කුරුණෑගල | 67 | 428.46 | 428.46 | 67 | | 5,649.60 |
| | පුත්තලම | 36 | 221.37 | 221.37 | 36 | | 3,227.24 |
| රජරට නවෝදය | අනුරාධපුරය | 50 | 301.55 | 205.71 | 28 | 21 | 3,533.67 |
| | පොළොන්නරුව | 39 | 137.96 | 108.67 | 28 | 11 | 1,429.24 |
| පුබුදමු වෙල්ලස්ස | බදුල්ල | 73 | 283.59 | 259.05 | 53 | 13 | 4,080.68 |
| | මොණරාගල | 16 | 177.69 | 166.23 | 10 | 6 | 2,750.67 |
| සබරගමුව අරුණාලෝකය | කෑගල්ල | 93 | 349.75 | 206.56 | | 91 | 2,005.10 |
| | රත්නපුර | 64 | 280.53 | 211.43 | 14 | 49 | 2,593.88 |
| **එකතුව** | | **1,174** | **4,163.05** | **3,443.01** | **800** | **317** | **46,324.26** |

## අන්තර් පළාත් මාර්ග කාපට් කිරීමේ වැඩසටහනෙහි වැඩසටහන් අනුව භෞතික ප්‍රගතිය-2011-2013

රූප සටහන 4.1.1



**2013 පළාත් මාර්ග කාපට් කිරීමේ වැඩසටහනෙහි ක්‍රියාත්මක ක්‍රමවේදය**

- පළාත් මාර්ග කාපට්කිරීමේ වැඩසටහන සඳහා අදාළ ව්‍යාපෘති යෝජනා පළාතෙහි ආසන මට්ටමින් අමාත්‍යාංශය වෙත ලබාගනී.
- එක් එක් දිස්ත්‍රික්කයන්හි මාර්ග සංවර්ධන ව්‍යාපෘති වලට අදාළ සංවර්ධනය කරනු ලබන මුළු දුර, ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව භාර දෙනු ලබන ආයතනය හා අධීක්ෂණ කටයුතු සිදු කරන ආයතනය සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් මගින් කැබිනට් අනුමැතිය ලබා ගැනීම.
- ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව භාර දෙනු ලබන්නේ පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය, රාජ්‍ය සංවර්ධන හා ඉදිකිරීම් නීතිගත සංස්ථාව වැනි රාජ්‍ය ආයතනයකටය.
- ව්‍යාපෘතිය පිළිබඳ අධීක්ෂණ කටයුතු පළාත් මාර්ග දෙපාර්තමේන්තුවට / පළාත් සභා මාර්ග සංවර්ධන අධිකාරියට පවරා දී ඇති අතර අධීක්ෂණ ආයතනය සතු කාර්යභාරය වනුයේ ව්‍යාපෘතියේ සැලසුම් හා මිල ගණන් අනුමත කිරීම, විෂය පථය තීරණය කිරීම, බිල්පත් පරීක්ෂා කිරීම හා ඒවායේ නිවැරදිබව සනාථ කිරීම යනාදී ක්‍රියාකාරකම්ය.
- ඉදිකිරීම් ආයතනය විසින් සකස් කරන ලද බිල්පත්, අධීක්ෂණ කටයුතු භාර ආයතනය විසින් නිර්දේශ කරන ලදුව දිස්ත්‍රික් ඉංජිනේරු වෙත යොමු කරනු ලබන අතර දිස්ත්‍රික් ඉංජිනේරු විසින් පරීක්ෂා කරන ලද බිල්පත දිස්ත්‍රික් ලේකම් වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කළ පසු ගෙවීම් සිදු කිරීමට නියමිතය.
- අදාළ දිස්ත්‍රික්ක වල මාර්ග සංවර්ධන ව්‍යාපෘති වලට ගෙවීම් කිරීම සඳහා අමාත්‍යාංශය විසින් දිස්ත්‍රික් ලේකම් වෙත ප්‍රතිපාදන නිදහස් කරනු ලබන අතර ඉදිකිරීම් කටයුතු ප්‍රදානය කිරීමේ පටන් ගෙවීම් කටයුතු අවසන් වන අදියර දක්වා පවතින්නේ විනිවිදභාවයකින් යුත් ක්‍රියාවලියකි.

## පළාත් මාර්ග කාපට් කිරීමට අමතරව පහත සඳහන් මාර්ග සංවර්ධන ව්‍යාපෘති 2013 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලදී.

වගු අංක 4.1.2

| වැඩසටහන | ව්‍යාපෘතියේ නම | 2013 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 2013 වර්ෂය සඳහා වියදම (රු.මි) | වැඩ අවසන් ව්‍යාපෘති ගණන |
|---|---|---|---|---|
| **බටහිර රන් අරුණ** | රන් අරුණ 1 හා 2 අදියර හා මීගමුව දිස්ත්‍රික්කයේ මහ නගර සභා මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම | 1,343.37 | 1,297.69 | 1710 |
| **පුබුදමු වෙල්ලස්ස** | බදුල්ල දිස්ත්‍රික්කයේ බණ්ඩාරවෙල සංචාරක තානායමෙහි ප්‍රවේශ මාර්ගය ප්‍රතිසංස්කරණය | 9.22 | 9.01 | ව්‍යාපෘතියෙහි වැඩ අවසන් කර ඇත |
| | බදුල්ල දිස්ත්‍රික්කයේ අඹදණ්ඩේගම මාර්ගයේ අවිච්ඡේද වැඩ නිමකිරීම | 4.79 | 4.66 | ව්‍යාපෘතියෙහි වැඩ අවසන් කර ඇත |

*රන් අරුණ 1 වැඩසටහන යටතේ ප්‍රතිසංස්කරණය කරන ලද ඉඹුල්ගොඩ පහළයාගොඩ මාර්ගය*
*ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය*
*ගම්පහ දිස්ත්‍රික්කය*

*බණ්ඩාරවෙල සංචාරක තානායමෙහි ප්‍රවේශ මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම*
*බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය*
*බදුල්ල දිස්ත්‍රික්කය*

## ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන් යටතේ ක්‍රියාත්මක කළ පාලම් ව්‍යාපෘති

වගු අංක 4.1.3

| වැඩසටහන | දිස්ත්‍රික්කය | ව්‍යාපෘතියේ නම | 2013 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 2013 වර්ෂය සඳහා වියදම (රු.මි) | ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| කඳුරට උදානය | මාතලේ | කවුඩගම්මන නව පාලම ඉදිකිරීම | 6.42 | 4.12 | 100% |
| රජරට නවෝදය | අනුරාධපුර | ගලෙන්බිඳුණුවැව කහඔය පාලම ප්‍රතිසංස්කරණ කිරීම | 4.06 | 4.02 | 100% |
| පුබුදමු වෙල්ලස්ස | බදුල්ල | බදුලුපිටිය අන්දෙණිය පාලම ප්‍රතිසංස්කරණය කිරීම | 2.97 | 2.39 | 75% |



*කවුඩගම්මන පාලමෙහි ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමෙන් පසු මාතලේ දිස්ත්‍රික්කය*

## විදේශාධාර මගින් 2013 වර්ෂයේදී ක්‍රියාත්මක කරනු ලැබූ මාර්ග හා පාලම් සංවර්ධන ව්‍යාපෘති

2013 වර්ෂය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන :
රු.මි 9,709.28

2013 වර්ෂය සඳහා සැලසුම්ගත ඉලක්කයන් :
මාර්ග කි.මී : 2477.76
ග්‍රාමීය පාලම් : 205
ග්‍රාමීය මාර්ග ව්‍යාපෘති : 2380

2013 වර්ෂය සඳහා වියදම :
රු.මි 7,594.57

2013 වර්ෂයේ සාධනය කරගන්නා ලද ඉලක්කයන් :
මාර්ග කි.මී : 1637.21
ග්‍රාමීය පාලම් : 82
ග්‍රාමීය මාර්ග ව්‍යාපෘති : 1269

*මාන්කුලම් - වෙල්ලන්කුලම් මාර්ගය මුලතිවු දිස්ත්‍රික්කය*

*මළඔය පාලම පොළොන්නරුව දිස්ත්‍රික්කය*

*නිකලඔය කඹරගල මාර්ගය මාතලේ දිස්ත්‍රික්කය*

## 2013.12.31 දිනට මාර්ග හා පාලම් සංවර්ධන ව්‍යාපෘති අත්පත් කරගෙන ඇති භෞතික හා මූල්‍ය ප්‍රගතිය

වගු අංක 4.1.4

| දිස්ත්‍රික්කය | 2013 වර්ෂය සඳහා භෞතික ඉලක්කය සංඛ්‍යාව / කි.මී. | 2013.12.31 දිනට අත්කරගෙන ඇති භෞතික ප්‍රගතිය | | 2013 වර්ෂය සඳහා ප්‍රතිපාදන රු.මි | 2013 වර්ෂය සඳහා වියදම රු.මි |
|---|---|---|---|---|---|
| | | වැඩ අවසන් ව්‍යාපෘති සංඛ්‍යාව / කි.මී. | ක්‍රියාත්මක තත්ත්වයේ ව්‍යාපෘති සංඛ්‍යාව / කි.මී. | | |
| කළුතර | මාර්ග 15 | 5 | 10 | 13.95 | 13.95 |
| මහනුවර | කි.මී 38.86 | 10.56 | 18.27 | 128.73 | 224.51 |
| මාතලේ | කි.මී 41.92 | 36.27 | 5.05 | 58.69 | 137.80 |
| නුවරඑළිය | කි.මී 22.97 | 11.54 | 6.98 | 89.90 | 152.06 |
| | මාර්ග 165 | 51 | 114 | | |
| හම්බන්තොට | මාර්ග 181 | 72 | 109 | 127.24 | 127.24 |
| යාපනය | කි.මී 258.76 | 174.90 | 66.15 | 1177.59 | 679.93 |
| | පාලම් 1 | 1 | | | |
| මන්නාරම | කි.මී 375.26 | 287.44 | 76.29 | 723.94 | 533.97 |
| වවුනියාව | කි.මී 473.26 | 329.31 | 120.60 | 848.52 | 623.87 |
| | පාලම් 1 | 1 | | | |
| මුලතිවු | කි.මී 380.86 | 302.53 | 76.74 | 1,410.48 | 1,254.26 |
| | පාලම් 10 | 6 | 4 | | |
| කිළිනොච්චිය | කි.මී 107.73 | 86.70 | 7.03 | 1,605.67 | 1,505.94 |
| | පාලම් 10 | 5 | 5 | | |
| මඩකලපුව | කි.මී 49.01 | 35.11 | 8.40 | 547.33 | 327.42 |
| | පාලම් 43 | 10 | 5 | | |
| අම්පාර | කි.මී 162.44 | 127.26 | 10.16 | 608.43 | 407.78 |
| | පාලම් 24 | 9 | 10 | | |
| ත්‍රිකුණාමලය | කි.මී 90.50 | 63.35 | 27.16 | 607.89 | 214.43 |
| | පාලම් 68 | 35 | 33 | | |
| කුරුණෑගල | මාර්ග 88 | 25 | 63 | 25.28 | 25.28 |
| පුත්තලම | කි.මී 27.54 | 18.31 | 6.21 | 73.72 | 73.72 |
| | පාලම් 34 | 11 | 20 | | |
| අනුරාධපුරය | කි.මී 291.69 | 89.55 | 193.24 | 245.78 | 89.39 |
| | පාලම් 3 | | 2 | | |
| පොළොන්නරුව | කි.මී 40.79 | 16.60 | 18.88 | | |
| | පාලම් 5 | 3 | 1 | 216.83 | 216.83 |
| | මාර්ග 224 | 61 | 160 | | |
| බදුල්ල | කි.මී 54.17 | 27.27 | 4.46 | 373.86 | 373.86 |
| | මාර්ග 359 | 231 | 120 | | |
| මොණරාගල | කි.මී 61.41 | 20.49 | 39.28 | | |
| | පාලම් 6 | 2 | 1 | 183.82 | 183.82 |
| | මාර්ග 84 | 35 | 49 | | |
| රත්නපුරය | මාර්ග 598 | 418 | 180 | 191.27 | 191.27 |
| කෑගල්ල | මාර්ග 666 | 371 | 295 | 192.30 | 192.30 |
| | **කි.මී 2477.76** | **1,637.20** | **684.88** | | |
| මුළු එකතුව | **පාලම් 205** | **82** | **81** | **9,709.28** | **7,594.57** |
| | **මාර්ග 2,380** | **1,269** | **1,100** | | |

## ග්‍රාමීය පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය (2013 - 2015)

මෙම ව්‍යාපෘතිය යටතේ , මුළු රටම ආවරණය කරමින් මීටර් 6 සිට 30 දක්වා විවිධ දිගින් යුතු ස්ථාවර වානේ පාලම් 210 ක් ඉදිකිරීම සිදු කරනු ලබන අතර ආයෝජන මුදල රු.බි 7.0 (බ්‍රිතාන්‍ය පවුම් මිලියන 35.0) කි. නාගරික හා ග්‍රාමීය ප්‍රදේශ යා කිරීම සම්බන්ධයෙන් ප්‍රධාන බාධාවක්ව පැවති පිවිසුම් මාර්ග හා සම්බන්ධ කෙරෙන නව පාලම් ඉදිකිරීමත්, අබලන් වී ඇති පාලම් වෙනුවට නව පාලම් ඉදිකිරීමත් මෙම ව්‍යාපෘතිය මගින් සිදුකිරීමට අපේක්ෂිතය. දුෂ්කර ප්‍රදේශ වෙත ප්‍රවේශ පහසුකම් වඩාත් පුළුල් කිරීම තුළින් රටේ බොහෝ ග්‍රාමීය ප්‍රදේශ වල ප්‍රවාහන පහසුකම් වැඩිදියුණු කිරීමට මෙම ව්‍යාපෘතිය පහසුකම් සලසනු ඇත. එමගින් ග්‍රාමීය ප්‍රජාවගේ ආර්ථික හා සාමාජීය ක්‍රියාකාරකම් වැඩිදියුණු කරගැනීම සඳහා අවශ්‍ය මංපෙත් විවර වී ඇත.

## 2013.12.31 දිනට භෞතික ප්‍රගතිය

වගු අංක වි. ස. 4.1.1

| දිස්ත්‍රික්කය | ඉලක්කගත ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|
| කළුතර | 13 |
| මහනුවර | 27 |
| මාතලේ | 32 |
| නුවරඑළිය | 4 |
| ගාල්ල | 9 |
| මාතර | 16 |
| හම්බන්තොට | 10 |
| පුත්තලම | 2 |
| අනුරාධපුරය | 6 |
| පොළොන්නරුව | 11 |
| බදුල්ල | 14 |
| මොණරාගල | 14 |
| කෑගල්ල | 28 |
| රත්නපුර | 24 |

2013.12.31 දින වන විට ව්‍යාපෘති 9 ක වැඩ අවසන් කරන ලද අතර ව්‍යාපෘති 16ක් ක්‍රියාත්මක තත්ත්වයේ පැවතුණි.

### 2013 වර්ෂයේදී නිමකරන ලද ව්‍යාපෘති

*පලරම්බේගම පාලම*
*කෑගල්ල දිස්ත්‍රික්කය*

*වැලම්ටියාව පාලම*
*මාතලේ දිස්ත්‍රික්කය*

*වේරගොල්ල පාලම*
*මහනුවර දිස්ත්‍රික්කය*

## 4.2 අත්හැර දමන ලද හෝ අසම්පූර්ණ රජයේ දේපළ ප්‍රතිසංස්කරණය මගින් ප්‍රජාවට ප්‍රතිලාභ

අධ්‍යාපනික, සෞඛ්‍ය, පරිපාලන, ජල සම්පාදන, විදුලිය හා විහාරස්ථාන සංවර්ධනය යනාදී ක්ෂේත්‍රයන්හි ඉදිකිරීම් කටයුතු සම්පූර්ණයෙන් නොකිරීම හේතුවෙන් මෙතෙක් ප්‍රයෝජනයට ගත නොහැකිව තිබූ දේපළ ප්‍රයෝජනයට ගත හැකි පරිදි ප්‍රතිසංස්කරණය කිරීම සඳහා අමාත්‍යාංශය 2013 වර්ෂයේදී විශේෂ අවසන් අවධානයක් යොමු කරන ලදී.

### 2013 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද අත්හැර දමන ලද හෝ අසම්පූර්ණ රජයේ දේපළ ප්‍රතිසංස්කරණය ව්‍යාපෘති

වගු අංක 4.2.1

| දිස්ත්‍රික්කය | ව්‍යාපෘතියේ නම | 2013 වර්ෂය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන රු.මි | 2013 වර්ෂය සඳහා වියදම රු.මි |
|---|---|---|---|
| **ගම්පහ** | පස්යාල බාබුසලාම් විද්‍යාලයේ ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කිරීම | 13.43 | 3.98 |
| **ගාල්ල** | වැලිවිට, දිවිතුර ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල, යක්කලමුල්ල අමරසිරි දොඩංගොඩ අනුස්මරණ ශාලා හා ඇල්පිටිය, වලාහේන ග්‍රාම ලේකම් ගොඩනැගිල්ලෙහි ඉදිකිරීම් කටයුතු නිමකිරීම. | 20.16 | 5.72 |
| **මාතර** | බිබුලාවෙල ශ්‍රී අතුලදස්සනාරාම ප්‍රජා ශාලාවෙහි ප්‍රතිසංස්කරණ කටයුතු නිම කිරීම | 1.40 | 1.39 |
| **මඩකලපුව** | කාත්තන්කුඩි හා එරාවූර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල පාසල් ගොඩනැගිලි - 15 ක්, පුස්තකාල ගොඩනැගිලි - 3ක්, සංස්කෘතික මධ්‍යස්ථානයක්, ගමනා ගමන මණ්ඩලයේ ගොඩනැගිලි - 1ක්, නගර සභා ගොඩනැගිල්ලක්, පොදු ක්‍රීඩාංගණ - 2ක් , ළමා හා මාතෘ සායන ගොඩනැගිලි - 2 ක් හා කෞතුකාගාර ගොඩනැගිල්ලක් ප්‍රතිසංස්කරණය කිරීම | 96.16 | 80.43 |
| **කුරුණෑගල** | මහව නගර සභා ගොඩනැගිල්ල, බෝනගමුව, රන්දෙණිගම, කලගල හා තලාහිටිමුල්ල ජල සම්පාදන ව්‍යාපෘති හා කලගල ජල සම්පාදන ව්‍යාපෘතිය වෙනුවෙන් විදුලිය ලබා දීමේ ව්‍යාපෘතිය | 22.87 | 2.35 |
| **අනුරාධපුර** | කටාරම්පුර සේනාසනය, ගෝනපතිරාව රජ මහා විහාරය හා කාඩියංගල ජයගංගාරාම විහාරස්ථානයේ පුස්තකාල ගොඩනැගිලි ඉදිකිරීම , 2007 යාය 11, යාය 17 හා යාය 18 ප්‍රදේශයන්හි බහුකාර්ය ගොඩනැගිලි ඉදිකිරීම | 11.86 | 11.20 |
| **බදුල්ල** | මස්පැන්න බස් නැවතුම්පොළ ඉදිකිරීම | 8.84 | 8.58 |
| **එකතුව** | | **174.72** | **113.65** |

**අත්හැර දමන ලද හෝ අසම්පූර්ණ රජයේ දේපළ ප්‍රතිසංස්කරණය යටතේ සාර්ථකව වැඩ අවසන් කරන ලද ව්‍යාපෘති කිහිපයක්.**

වැලිවිට, දිවිතුර ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලෙහි ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් වීමෙන් පසු

ගාල්ල දිස්ත්‍රික්කය

ප්‍රතිසංස්කරණය කරන ලද හිස්බුල්ලා සංස්කෘතික මධ්‍යස්ථානය

මඩකලපුව දිස්ත්‍රික්කය

## 4.3 කෘෂිකර්මය

> වී වගාව අපේ ගොවියාගේ රක්ෂාව නොවේ. ජීවිතයයි. සිතුම් පැතුම්, සිරිත් විරිත්, විනෝදය, විවේකාස්වාදය පදනම් කරගත් සමස්ත සංස්කෘතියම වී ගොවිතැනයි.
>
> මහින්ද චින්තන ඉදිරි දැක්ම, පිටුව 80

### කෘෂිකර්ම ක්ෂේත්‍රය තුළ දේශීය ආයෝජන

- **වී ගබඩා ඉදිකිරීම**

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පදවි ශ්‍රීපුර, මොරවැව, කින්නියාව හා තඹලගමුව යන ප්‍රදේශවල අළුතින්ම ඉදි කරන ලද වී ගබඩා වෙනුවෙන් 2013 වර්ෂයේ රු.මි 17.28 ක ප්‍රතිපාදන වෙන් කළ අතර 2013.12.31 දිනට වියදම රු.මි 15.39 කි. මෙම වී ගබඩා වල ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇති අතර මේ තුළින් ප්‍රතිලාභීන් 135,850 දෙනෙකුට පමණ ප්‍රතිලාභ අත්වේ.

රජයේ සහතික මිලට ගොවියාගෙන් අස්වැන්න මිලට ගෙන ගබඩා කර ගතහැකි බැවින් එයින් ගොවියා අතරමැදියන්ගේ සූරාකෑමෙන් වළක්වා ගතහැකිවේ.

වී ගබඩා ඉදිකිරීමෙන් ලද ප්‍රතිලාභ

ගොවිබිම් හා වෙළඳපොළ දක්වා යෙදවුම් හා නිමැවුම් ප්‍රවාහනය කාර්යක්ෂම වීම.

සාධාරණ මිලකට පාරිභෝගික ජනතාවට/වෙළඳපොළට සහල් නිකුත් කිරීමේ හැකියාව ලැබීම

*කින්නියාවෙහි ඉදිකරන ලද වී ගබඩා සංකීර්ණය*

*මොරවැව ඉදිකරන ලද වී ගබඩා සංකීර්ණය*

- **වැව් හා වාරිමාර්ග පුනරුත්ථාපනය කිරීම**

> අදත් අපේ ගොවි ජනතාව ඉල්ලා සිටින්නේ රන් මසුරන් නොවේ. දහසින් බැඳි පියලිද නොවේ. ජලයයි. ජලය ලැබුනු විට ඔවුන් අපට මසුරන් ගෙනෙනු ඇත.
>
> මහින්ද චින්තන ඉදිරි දැක්ම, පිටුව 38

කෘෂි ඉඩම් සඳහා ප්‍රමාණවත් පරිදි ජල සම්පාදනය සඳහා මනා වාරිමාර්ග පහසුකම් සංවර්ධනය සහ නිසි ජල කලමනාකරණ ක්‍රමවේදයන් ස්ථාපනය සඳහා අමාත්‍යාංශය ව්‍යාපෘති රැසක් 2013 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලදී.




## 2013 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

වගු අංක 4.3.1

| දිස්ත්‍රික්කය | ව්‍යාපෘතියේ නම | 2013 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 2013 වර්ෂය සඳහා වියදම (රු.මි) |
|---|---|---|---|
| **මාතලේ** | මාරක වැව, කුඩාරදුන්න වැව හා දුනුවිලපිටිය වැව | 19 | 18.56 |
| **කුරුණෑගල** | රත්විට පොතුව වැව හා රත්විට වැව | 3.53 | 1.30 |
| **පුත්තලම** | යකමුන්න අමුණ | 39.73 | 9.30 |
| **මොණරාගල** | තණමල්විල නාඑළිය වැව, සෙවණගල මොල්ලිගොඩ වැව හා , බඩල්කුඹුර කෝන්ගහවැව ඇල මාර්ගය | 14.31 | 3.53 |
| **එකතුව** | | **76.57** | **32.69** |

*දුනුවිලපිටිය වැවෙහි ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කරමින් විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය මාතලේ දිස්ත්‍රික්කය*

*ප්‍රතිසංස්කරණය කරමින් පැවති යකමුන්න අමුණ මාදම්පෙ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය පුත්තලම දිස්ත්‍රික්කය*

## කෘෂිකර්ම ක්ෂේත්‍රය තුළ විදේශීය ආයෝජන

## 2013.12.31 දිනට සාරාංශගත භෞතික හා මූල්‍ය ප්‍රගතිය

වග අංක 4.3.2

| අංශය | 2013 වර්ෂය සඳහා සැලසුම් කරන ලද භෞතික ඉලක්කයන් | 2013 වර්ෂයේ සාධනය කරගන්නා ලද ඉලක්කයන් | 2013 වර්ෂය සඳහා ප්‍රතිපාදන රු.මි | 2013 වර්ෂය සඳහා වියදම රු.මි |
|---|---|---|---|---|
| සුළු පරිමාණ වාරිකර්මාන්ත | වැව් 746 | 334 | 2858.80 | 2038.55 |
| මධ්‍ය හා මහා පරිමාණ වාරිකර්මාන්ත | වැව් 26 | 17 | 257.83 | 200.41 |
| වාරි ඇල හා කෘෂි මාර්ග | වාරි ඇල - කි.මී 200.0<br>කෘෂි මාර්ග- කි.මී 100.0 | කි.මී 87.65<br>කි.මී 83.88 | 136.00 | 135.80 |
| කෘෂිකර්මය | ගොඩනැගිලි 133<br>ගෙවතු වගා ඒකක 9678<br>උස්බිම් වගාවන් අක්කර 22820 | 131<br>1443<br>3520 | 282.10 | 257.31 |
| එකතුව | | | 3,534.73 | 2,632.07 |

## සුළු, මධ්‍ය හා මහා පරිමාණ වාරිකර්මාන්ත ව්‍යාපෘති වල 2013.12.31 දිනට සවිස්තරාත්මක භෞතික හා මූල්‍ය ප්‍රගතිය

වග අංක 4.3.3

| දිස්ත්‍රික්කය | 2013 වර්ෂය සඳහා භෞතික ඉලක්කය (වැව් සංඛ්‍යාව) | 2013.12.31 දිනට අත්කරගෙන ඇති භෞතික ප්‍රගතිය | | 2013 වර්ෂය සඳහා ප්‍රතිපාදන රු.මි | 2013 වර්ෂය සඳහා වියදම රු.මි |
|---|---|---|---|---|---|
| | | වැඩ අවසන් ව්‍යාපෘති | ක්‍රියාත්මක තත්ත්වයේ ව්‍යාපෘති | | |
| කුඩා පරිමාණ වාරි කර්මාන්ත | | | | | |
| මහනුවර | 5 | 3 | 2 | 44.34 | 44.34 |
| මාතලේ | 6 | 5 | 1 | 31.35 | 31.35 |
| නුවරඑළිය | 9 | 3 | 5 | 75.50 | 50.42 |
| යාපනය | 53 | 16 | 29 | 71.71 | 39.11 |
| මන්නාරම | 94 | 24 | 60 | 160.72 | 95.72 |
| වවුනියාව | 119 | 70 | 42 | 267.94 | 143.88 |
| මුලතිවු | 105 | 69 | 35 | 995.53 | 897.72 |
| කිළිනොච්චිය | 38 | 29 | 5 | 150.59 | 98.29 |
| මඩකලපුව | 21 | 10 | 6 | 93.44 | 82.65 |
| අම්පාර | 18 | 6 | 7 | 68.36 | 32.80 |
| ත්‍රිකුණාමලය | 49 | 10 | 39 | 152.88 | 65.85 |
| පුත්තලම | 15 | 8 | 4 | 26.19 | 25.05 |
| අනුරාධපුරය | 163 | 63 | 98 | 530.06 | 293.02 |
| පොළොන්නරුව | 24 | 7 | 9 | 83.58 | 64.07 |
| බදුල්ල | 3 | 1 | | 50.21 | 17.88 |
| මොණරාගල | 24 | 10 | 10 | 56.40 | 56.40 |
| උප එකතුව | **746** | **334** | **352** | **2858.80** | **2038.55** |
| මධ්‍ය හා මහා පරිමාණ වාරි කර්මාන්ත | | | | | |
| යාපනය | 1 | | 1 | 25.51 | 25.51 |
| මන්නාරම | 5 | 2 | | 56.00 | 41.58 |
| වවුනියාව | 6 | 5 | 1 | 39.75 | 39.75 |
| මුලතිවු | 6 | 4 | 1 | 53.52 | 43.19 |
| කිළිනොච්චිය | 6 | 5 | | 43.05 | 28.84 |
| මඩකලපුව | 2 | 1 | 1 | 40.00 | 19.44 |
| ත්‍රිකුණාමලය (බිල්පත් පියවීම) | | | | | 2.10 |
| උප එකතුව | **26** | **17** | **4** | **257.83** | **200.41** |
| මුළු එකතුව | **772** | **351** | **356** | **3116.63** | **2238.96** |

## කෘෂිකර්ම අංශයේ ව්‍යාපෘති වල 2013.12.31 දිනට සවිස්තරාත්මක භෞතික හා මූල්‍ය ප්‍රගතිය

වග අංක 4.3.4

| දිස්ත්‍රික්කය | 2013 වර්ෂය සඳහා භෞතික ඉලක්කය (සංඛ්‍යාව / කි.මී.) | 2013.12.31 දිනට අත්කරගෙන ඇති භෞතික ප්‍රගතිය | | 2013 වර්ෂය සඳහා ප්‍රතිපාදන රු.මි | 2013 වර්ෂය සඳහා වියදම රු.මි |
|---|---|---|---|---|---|
| | | වැඩ අවසන් ව්‍යාපෘති (සංඛ්‍යාව / කි.මී.) | ක්‍රියාත්මක තත්ත්වයේ ව්‍යාපෘති (සංඛ්‍යාව / කි.මී.) | | |
| **කෘෂි මාර්ග හා වාරිඇල මාර්ග** | | | | | |
| **යාපනය** | වාරිඇල මාර්ග- කි.මී 40<br>කෘෂි මාර්ග - කි.මී 28 | කි.මී 17.41<br>කි.මී 11.88 | | **136.00** | **135.80** |
| **කිලිනොච්චි** | වාරිඇල මාර්ග - කි.මී 40<br>කෘෂි මාර්ග - කි.මී 18 | කි.මී 20.5<br>කි.මී 18.00 | | | |
| **මන්නාරම** | වාරිඇල මාර්ග- කි.මී 40<br>කෘෂි මාර්ග - කි.මී 18 | කි.මී 18.9<br>කි.මී 18.00 | | | |
| **මුලතිවු** | වාරිඇල මාර්ග- කි.මී 40<br>කෘෂි මාර්ග - කි.මී 18 | කි.මී 7.25<br>කි.මී 18.00 | | | |
| **වවුනියාව** | වාරිඇල මාර්ග- කි.මී 40<br>කෘෂි මාර්ග - කි.මී 18 | කි.මී 23.58<br>කි.මී 18.00 | | | |
| **උප එකතුව - කෘෂි මාර්ග හා වාරිඇල මාර්ග** | **වාරිඇල මාර්ග- කි.මී 200<br>කෘෂි මාර්ග - කි.මී 520.16** | වාරිඇල මාර්ග- කි.මී 87.65<br>කෘෂි මාර්ග - කි.මී 83.88 | | **136.00** | **135.80** |
| **කෘෂිකාර්මික ගොඩනැගිලි (වී ගබඩා, පොහොර ගබඩා, පැළ තවාන් ආදිය)** | | | | | |
| **යාපනය** | 15 | 15 | | 7.32 | 3.71 |
| **කිලිනොච්චි** | 43 | 43 | | 37.69 | 29.74 |
| **මුලතිවු** | 28 | 28 | | 6.24 | 2.92 |
| **වවුනියාව** | 24 | 23 | | 11.47 | 5.44 |
| **මන්නාරම** | 23 | 22 | | 18.35 | 14.47 |
| **උප එකතුව** | **133** | **131** | | **81.07** | **56.28** |
| **අනෙකුත් කෘෂිකාර්මික ක්‍රියාකාරකම්** | | | | | |
| **පොළොන්නරුව** | ගෙවතු ඒකක 617 | 118 | 21 | 57.75 | 57.75 |
| | උස්බිම් වගා අක්කර 4250 | 590 | | | |
| **බදුල්ල** | ගෙවතු ඒකක 1631 | 320 | 5 | 32.90 | 32.90 |
| | උස්බිම් වගා අක්කර 4680 | 431 | | | |
| **මොණරාගල** | ගෙවතු ඒකක 909 | 25 | | 20.32 | 20.32 |
| | උස්බිම් වගා අක්කර 9070 | 789 | | | |
| **රත්නපුරය** | ගෙවතු ඒකක 2542 | 733 | 4 | 14.37 | 14.37 |
| | උස්බිම් වගා අක්කර 920 | 691 | | | |
| **කෑගල්ල** | ගෙවතු ඒකක 1235 | 49 | 2 | 16.21 | 16.21 |
| | උස්බිම් වගා අක්කර 950 | 684 | | | |
| **නුවරඑළිය** | ගෙවතු ඒකක 774 | 124 | 2 | 12.00 | 12.00 |
| | උස්බිම් වගා අක්කර 200 | 87 | | | |
| **හම්බන්තොට** | ගෙවතු ඒකක 1751 | 65 | 20 | 32.39 | 32.39 |
| | උස්බිම් වගා අක්කර 2550 | 216 | | | |
| **කුරුණෑගල** | ගෙවතු ඒකක 219 | 9 | 3 | 6.35 | 6.35 |
| | උස්බිම් වගා අක්කර 200 | 32 | | 8.73 | 8.73 |
| **ගෙවතු ඒකක** | **9678** | **1443** | **57** | **201.03** | **201.03** |
| **උස්බිම් වගාවන් අක්කර** | **22820** | **3520** | | | |
| **කෘෂිකාර්මික ගොඩනැගිලි , ගෙවතු ඒකක හා උස්බිම් වගාවන් සඳහා ප්‍රතිපාදන හා වියදම** | | | | **282.10** | **257.31** |

කරවාහු ජල යෝජනා ක්‍රමය
අම්පාර දිස්ත්‍රික්කය

පොතුවිල්ලුව වැව
පුත්තලම දිස්ත්‍රික්කය

රන්කෙත්ගම බඩඉරිඟු වගාවක්
වවුනියාව දිස්ත්‍රික්කය

## 4.4 සෑම පවුලක් සඳහාම නිවසක්

> සියළු රජයන් විසින් නිවාස ඉදිකිරීම සඳහා පසුගිය කාලය පුරාම ගෙන ගිය වැඩසටහන් යටතේ නිවාස අංශයෙන් අපේ රට විශාල ප්‍රගතියක් ලබා ඇත. ශ්‍රී ලංකාවේ සෑම පවුලක්ම නිවසක් හිමි පවුලක් විය යුතුය යන්න මාගේ ප්‍රතිපත්තියයි.
>
> මහින්ද චින්තන ඉදිරි දැක්ම, පිටුව 36

මහින්ද චින්තන ඉදිරිදැක්ම අනුව සෑම පවුලකටම හිසට සෙවණක් ලබාදීම රජයේ මූලික අරමුණක් වන බැවින් නිවාස සංවර්ධන වැඩසටහන් වෙනුවෙන් දේශීය මෙන්ම විදේශීය අරමුදල් ආයෝජනය කරන ලදී.

### 2013 වර්ෂයේදී දේශීය අරමුදල් යොදවා ක්‍රියාත්මක කරන ලද නිවාස ව්‍යාපෘති

වගු අංක 4.4.1

| දිස්ත්‍රික්කය | ව්‍යාපෘතියේ නම | 2013 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 2013 වර්ෂය සඳහා වියදම (රු.මි) |
|---|---|---|---|
| **හම්බන්තොට** | පැල්පතින් නව ලොවට ව්‍යාපෘතිය ( පවුල් 408 කට නිවාස පහසුකම් ලබාදීමට සැලසුම් කර ඇත ) | 16.90 | 11.85 |
| **පොළොන්නරුව** | ගංවතුරින් හානියට පත් නිවාස පුනරුත්ථාපනය | 10.08 | 9.13 |
| **මන්නාරම** | නියඟයෙන් පීඩාවට පත් ජනතාවට සහනාධාර ලබාදීම | 10.00 | 10.00 |
| **වවුනියාව** | නිවාස සඳහා සෙවිළි තහඩු ලබාදීම | 33.77 | 30.50 |
| **අම්පාර** | සුනාමි නිවාස ව්‍යාපෘතිය | 20.00 | 18.37 |
| **පුත්තලම** | ගංවතුරින් හානියට පත් නිවාස පුනරුත්ථාපනය | 51.84 | 36.44 |
| **එකතුව** | | **142.59** | **116.29** |

පැල්පතින් නවලොවට වැඩසටහන යටතේ උඩුවිල, තිස්ස කේ.ජී.එන්.චන්දන
මහතා ඉදිකරන ලද නව නිවහන

## ඉන්දියානු රජයේ ආධාර මත ක්‍රියාත්මක වන නිවාස 50,000 ව්‍යාපෘතිය

සමස්ත වැඩසටහන සඳහා ඇස්තමේන්තුගත මුදල : රු.බි 13.5 → 2013 වර්ෂය සඳහා වියදම රු.බි 7.31

ඉලක්කගත නිවාස සංඛ්‍යාව 49,000 → ඉදිකරන ලද නිවාස සංඛ්‍යාව 6,403 ඉදිකරමින් පවතින නිවාස සංඛ්‍යාව 11,061

යුධ ගැටුම් වලට නිරාවරණය වූ යාපනය, කිලිනොච්චිය, මුලතිවු, වවුනියාව, මන්නාරම හා මඩකලපුව යන දිස්ත්‍රික්ක වල වාසය කරන්නාවූ ජනතාවට මෙම වැඩසටහන මගින් ප්‍රතිලාභ අත්වී ඇත.

### ඉන්දියානු රජයේ ආධාර මත ක්‍රියාත්මක වන නිවාස 50,000 ව්‍යාපෘතියේ 2013.12.31 දිනට සමස්ථ භෞතික සහ මූල්‍ය ප්‍රගතිය

වගු අංක වි. ස. 4.2.1

| දිස්ත්‍රික්කය | නිවාස සංඛ්‍යාව | | | 2013 වර්ෂය තුළ දරා ඇති වියදම (රු.මි.) | සමුච්චිත වියදම (රු.මි.) |
|---|---|---|---|---|---|
| | ආරම්භ කළ | ඉදිවෙමින් පවතින නිවාස | සම්පූර්ණ නිමකල නිවාස | | |
| යාපනය | 2,816 | 1,334 | 1,482 | 1,300.15 | 1,535.03 |
| වවුනියා | 1,435 | 553 | 882 | 539.10 | 883.39 |
| මුලතිව් | 5,713 | 4,458 | 1,255 | 2,475.50 | 2,811.89 |
| කිළිනොච්චිය | 4,087 | 2,519 | 1,568 | 1,804.35 | 2,272.19 |
| මන්නාරම | 2,670 | 1,454 | 1,216 | 997.60 | 1,259.29 |
| මඩකලපුව | 743 | 743 | - | 192.40 | 192.40 |
| එකතුව | **17,464** | **11,061** | **6,403** | **7,309.10** | **8,954.19** |

*ඉන්දියානු නිවාස ව්‍යාපෘතියේ ප්‍රතිලාභී පවුලක් වවුනියාව දිස්ත්‍රික්කය*

*ඉන්දියානු නිවාස ව්‍යාපෘතියේ ප්‍රතිලාභී පවුලක් යාපනය දිස්ත්‍රික්කය*

## 4.5 නීරෝගී ප්‍රජාවක් වෙනුවෙන් ජල සම්පාදනය හා සනීපාරක්ෂාව

පිරිසිදු පානීය ජලය හා සනීපාරක්ෂක සේවා සැපයීම දිළිඳුකම පිටුදැකීම සඳහා අවශ්‍යවන එක් ප්‍රධාන සාධකයන් ලෙස හඳුනාගෙන ඇති අතර ඒ සඳහා විශාල මුදලක් ආයෝජනය කරන ලදී. තවද නව නිවාස සංවර්ධන ව්‍යාපෘතීන් වලදී මෙන්ම, ජනතාව නැවත පදිංචි කිරීමේදී පානීය ජලය හා සනීපාරක්ෂක පහසුකම් සැපයීම කෙරෙහි අවධානය යොමු කරන ලදී. මෙහිදී දේශීය ආයෝජන වලින් සිදු කරන ලද පහත සංවර්ධන කාර්යයන් කැපී පෙනේ.

### 2013 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද ජල සම්පාදන ව්‍යාපෘති

වග අංක 4.5.1

| දිස්ත්‍රික්කය | ව්‍යාපෘතියේ නම | 2013 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 2013 වර්ෂය සඳහා වියදම (රු.මි) |
|---|---|---|---|
| ගාල්ල | පරණතානායම්ගොඩ ජල සම්පාදන ව්‍යාපෘතිය | 12.55 | 12.55 |
| බදුල්ල | කන්දෙකැටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මහකැලේ ජල සම්පාදන ව්‍යාපෘතිය, හාලි ඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රෝස්ට් වතුයායේ 3 කොටස සඳහා පානීය ජලය ලබාදීම හා හල්දුම්මුල්ල ග්ලේරියා වතුයාය සඳහා පානීය ජලය ලබාදීම | 7.08 | 6.99 |
| මොණරාගල | ආනන්දගම වාසනාගම ජල සම්පාදන ව්‍යාපෘතිය | 4.62 | 4.19 |
| **එකතුව** | | **24.25** | **23.73** |

*ආනන්දගම වාසනාගම ජල සම්පාදන ව්‍යාපෘතිය*
*මොණරාගල දිස්ත්‍රික්කය*

## මෙම ක්ෂේත්‍රයෙහි විදේශීය ආයෝජන

## ජල සම්පාදන ව්‍යාපෘති 2013.12.31 දිනට අත්කරගෙන ඇති භෞතික හා මූල්‍ය ප්‍රගතිය

වගු අංක 4.6.1

| දිස්ත්‍රික්කය | ව්‍යාපෘතිය | 2013 වර්ෂය සඳහා භෞතික ඉලක්කය (සංඛ්‍යාව / කි.මී.) | 2013.12.31 දිනට අත්කරගෙන ඇති භෞතික ප්‍රගතිය | | 2013 වර්ෂය සඳහා ප්‍රතිපාදන රු.මි | 2013 වර්ෂය සඳහා වියදම රු.මි |
|---|---|---|---|---|---|---|
| | | | වැඩ අවසන් ව්‍යාපෘති (සංඛ්‍යාව / කි.මී.) | ක්‍රියාත්මක තත්ත්වයේ ව්‍යාපෘති (සංඛ්‍යාව / කි.මී.) | | |
| කළුතර | ළිං හා කුඩා ජල ටැංකි | 90 | 68 | | 5.91 | 5.91 |
| නුවර එළිය | ළිං හා කුඩා ජල ටැංකි | 2676 | 779 | 43 | 80.22 | 80.22 |
| හම්බන්තොට | ළිං හා කුඩා ජල ටැංකි | 2810 | 619 | 77 | 43.37 | 43.37 |
| යාපනය | ජල යෝජනා ක්‍රම | 3 | 2 | 1 | | |
| | ළිං | 6 | 3 | 0.92 | 211.82 | 165.71 |
| මන්නාරම | ජල යෝජනා ක්‍රම | 3 | 1 | 2 | 223.15 | 150.10 |
| | ළිං | 11 | 6 | 2 | | |
| වවුනියාව | ජල යෝජනා ක්‍රම | 2 | 2 | | | |
| | ළිං | 9 | 6 | 2 | 54.00 | 55.82 |
| | පයිප්ප එළීම කි.මී | | | | | |
| මුලතිවු | ජල යෝජනා ක්‍රම | 3 | 3 | | | |
| | ළිං | 31 | 10 | 20 | 65.80 | 57.22 |
| කිළිනොච්චිය | ජල යෝජනා ක්‍රම | 1 | 1 | | 6.07 | 6.07 |
| | ළිං | 21 | 3 | 17 | | |
| මඩකලපුව | ජල යෝජනා ක්‍රම | 5 | 1 | 3 | | |
| | ළිං | 24 | 8 | 8 | 133.97 | 92.15 |
| | පයිප්ප එළීම කි.මී | 5.94 | 5.52 | 0.12 | | |
| අම්පාර | ජල යෝජනා ක්‍රම | 1 | | | | |
| | ළිං | 5 | 2 | | 134.69 | 69.80 |
| | පයිප්ප එළීම කි.මී | 6.89 | 4.51 | 2.385 | | |
| ත්‍රිකුණාමලය | ජල යෝජනා ක්‍රම | 5 | 2 | 3 | | |
| | ළිං | 10 | 1 | 9 | 444.35 | 329.45 |
| | පයිප්ප එළීම කි.මී | 4.63 | 2.35 | 2.27 | | |
| කුරුණෑගල | ළිං හා කුඩා ජල ටැංකි | 554 | 199 | 3 | 27.88 | 27.88 |
| පුත්තලම | ළිං හා කුඩා ජල ටැංකි | 6 | 4 | 2 | 14.81 | 4.03 |
| අනුරාධපුරය | ළිං හා කුඩා ජල ටැංකි | 20 | 9 | 10 | 14.07 | 14.07 |
| පොළොන්නරුව | ළිං හා කුඩා ජල ටැංකි | 2434 | 280 | 64 | 59.66 | 59.68 |
| බදුල්ල | ළිං හා කුඩා ජල ටැංකි | 1369 | 464 | 35 | 64.19 | 64.19 |
| මොණරාගල | ළිං හා කුඩා ජල ටැංකි | 928 | 200 | 30 | 66.35 | 62.91 |
| රත්නපුරය | ළිං හා කුඩා ජල ටැංකි | 1530 | 759 | 35 | 32.54 | 32.54 |
| කෑගල්ල | ළිං හා කුඩා ජල ටැංකි | 2256 | 801 | 62 | 71.57 | 71.57 |
| එකතුව | ජල යෝජනා ක්‍රම | **23** | **12** | **9** | | |
| | ළිං | **14790** | **4221** | **419** | **1754.47** | **1392.69** |
| | කි.මී | **21.591** | **15.59** | **5.69** | | |

2013 වර්ෂයේදී ජල යෝජනා ක්‍රම 23 ක්, ළිං 14,790 ක් හා ජල නල කි.මී 21.59 ක් එළීම වෙනුවෙන් රු.මි 1754.45 ක ප්‍රතිපාදන මුදලක් වෙන් කරන ලදී.

මෙමගින් 2013.12.31 දින වන විට ජල යෝජනා ක්‍රම 12ක්, ළිං 4221 ක් හා කි.මී 15.59 කින් යුත් ජල නල ස්ථාපනය කිරීම සම්පූර්ණ කරන ලද අතර මූල්‍ය ප්‍රගතිය රු.මි 1392.69 කි.

ජල යෝජනා ක්‍රම ඉදිකිරීම මගින් පේදුරු තුඩුව, මරදන්කර්නි, වැලිවැටිතුරෙයි, කරච්චි, මල්ලාවි, පාන්ඩියන්කුලම්, ඔඩ්ඩුසුඩාන්, නැදුන්කර්නි, මාමඩුව, විඩත්තල්තීවු, තේවන්පිටිය හා අඩම්පන් යන ප්‍රදේශයන්හි පවුල් 77,625 කට පමණ ප්‍රතිලාභ අත්වී ඇත.

පේදුරු තුඩුව ජල යෝජනා ක්‍රමය යාපනය දිස්ත්‍රික්කය

කෝවිල් කුඩියිරිප්පු ගම්මානයේ ඉදි කරන ලද ළිඳක් යාපනය දිස්ත්‍රික්කය

ජලය හා සනීපාරක්ෂක පහසුකම් සංවර්ධනයෙන් අත්වන ප්‍රතිලාභ

- ප්‍රජාවට සෞඛ්‍යාරක්ෂිත පානීය ජලය ලබාදීම
- නීරෝගීකම රැකගැනීම සඳහා අවශ්‍ය සනීපාරක්ෂක පහසුකම් ඇතිකිරීම

## 4.6 විදුලිය හා බලශක්ති

යාපනය අර්ධද්වීපයට විදුලිය සපයන චුන්නාකම් විදුලි උපපොළ හා කිළිනොච්චි හා චුන්නාකම් දක්වා විදුලි සම්ප්‍රේෂණ රැහැන් පද්ධතිය ඉදිකිරීම සඳහා විදේශාධාර මගින් රු.මි 1415.00 ක් ආයෝජනය කරන ලද අතර මෙම ව්‍යාපෘතිය 2013.09.14 දින අතිගරු ජනාධිපතිතුමා විසින් ජනතා අයිතියට පත් කරන ලදී.

- කි.වෝල්ට් 132/133 ක ධාරිතාවයකින් යුත් චුන්නාකම් විදුලි උපපොළ ඉදිකිරීම.
- කි.වෝල්ට් 132 ක ධාරිතාවයකින් යුත් කිළිනොච්චි හා චුන්නාකම් දක්වා විදුලි සම්ප්‍රේෂණ රැහැන් පද්ධතිය ඉදිකිරීම.

ඉදිකරන ලද චුන්නාකම් විදුලි උපපොළ

කිළිනොච්චි හා චුන්නාකම් දක්වා විදුලි සම්ප්‍රේෂණ රැහැන් පද්ධතිය

## 4.7 සිවිල් පරිපාලනය ශක්තිමත් කිරීම

උතුරු හා නැගෙනහිර පළාත් තුළ සිවිල් පරිපාලනය ශක්තිමත් කිරීම සඳහා යුද්ධයෙන් විනාශ වූ පරිපාලන ගොඩනැගිලි, තැපැල් කාර්යාල, වාරිමාර්ග දෙපාර්තමේන්තු ගොඩනැගිලි, ග්‍රාම නිලධාරී කාර්යාල, පළාත් පාලන ගොඩනැගිලි, පශු වෛද්‍ය කාර්යාල සහ උසාවි සංකීර්ණ වැනි භෞතික යටිතල පහසුකම් සංවර්ධනය වෙනුවෙන් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මගින් 2013 වර්ෂයේදී ආයෝජනය කරන ලද මුදල රු.මි 1352.76 ක් වන අතර එමගින් පරිපාලන ගොඩනැගිලි 152 ක් ප්‍රතිසංස්කරණය කර ඇත.

*ඉදිකරන කරන ලද දිස්ත්‍රික් ලේකම් කාර්යාලය කිළිනොච්චිය දිස්ත්‍රික්කය*

*ඉදිකරන ලද නාවිදන්වලි ප්‍රාදේශීය සභා කාර්යාලය අම්පාර දිස්ත්‍රික්කය*

### පරිපාලන යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති 2013.12.31 දිනට අත්කරගෙන ඇති භෞතික හා මූල්‍ය ප්‍රගතිය

වගු අංක 4.7.1

| දිස්ත්‍රික්කය | 2013 වර්ෂය සඳහා භෞතික ඉලක්කය (ගොඩනැගිලි සංඛ්‍යාව) | 2013.12.31 දිනට අත්කරගෙන ඇති භෞතික ප්‍රගතිය | | 2013 වර්ෂය සඳහා ප්‍රතිපාදන රු.මි | 2013 වර්ෂය සඳහා වියදම රු.මි |
|---|---|---|---|---|---|
| | | වැඩ අවසන් ව්‍යාපෘති සංඛ්‍යාව | ක්‍රියාත්මක තත්ත්වයේ ව්‍යාපෘති සංඛ්‍යාව | | |
| යාපනය | 38 | 32 | 6 | 295.27 | 269.10 |
| මන්නාරම | 27 | 24 | 3 | 238.32 | 216.69 |
| වවුනියාව | 22 | 21 | 1 | 72.82 | 46.37 |
| මුලතිවු | 42 | 38 | 4 | 363.15 | 308.83 |
| කිළිනොච්චිය | 36 | 34 | 2 | 199.63 | 165.65 |
| මඩකලපුව | 6 | | 6 | 209.79 | 104.39 |
| ත්‍රිකුණාමලය | 8 | 2 | 6 | 256.99 | 117.76 |
| අම්පාර | 11 | 1 | 10 | 397.73 | 123.98 |
| **මුළු එකතුව** | **190** | **152** | **38** | **2,033.70** | **1,352.76** |

## 4.8 සමාජීය යටිතල පහසුකම් සංවර්ධනය

මානව සම්පත් සංවර්ධනය පිළිබඳ අදාළවන අධ්‍යාපනික, සෞඛ්‍ය, අධ්‍යාත්මික සංවර්ධනය හා වෙළඳ ආදී ක්ෂේත්‍රයන්ට අදාළ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම මේ මගින් අපේක්ෂා කළ අතර මේ යටතේ දේශීය මෙන්ම විදේශීය අරමුදල් යොදවා සංවර්ධන ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක කරන ලදී.

### දේශීය අරමුදල් මගින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති

වගු අංක 4.8.1

| දිස්ත්‍රික්කය | ව්‍යාපෘතියේ නම | 2013 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 2013 වර්ෂය සඳහා වියදම (රු.මි) |
|---|---|---|---|
| **ගම්පහ** | යසෝදරා බාලිකා විද්‍යාලයෙහි ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය | 31.48 | 19.53 |
| **නුවරඑළිය** | ආර්ථික හා සමාජීය යටිතල පහසුකම් සවර්ධනය යන ක්ෂේත්‍ර ආවරණය වන පරිදි ව්‍යාපෘති 267 ක් ක්‍රියාත්මක කිරීම | 17.50 | 17.47 |
| | ශ්‍රී මුත්තුමාරි අම්මාන් කෝවිල සංස්කෘතික මධ්‍යස්ථානය හා මස්කෙළිය ශ්‍රී ෂන්මුගනාදන් දේවස්ථාන සංස්කෘතික මධ්‍යස්ථානයෙහි 1 වන අදියර ඉදිකිරීම | 10.00 | 1.95 |
| **මාතලේ** | නාගොල්ල හිග්ගොල්ල ශ්‍රී මඩසාමි කෝවිලේ සංස්කෘතික මධ්‍යස්ථානයේ සංවර්ධන කටයුතු සිදුකිරීම | 2.40 | 0.84 |
| **යාපනය** | නාගදීප විහාරයේ පහසුකම් සංවර්ධනය කිරීම | 10.23 | 1.60 |
| **අනුරාධපුර** | මහවිලච්චිය ළමා හා මාතෘ සායනය වැඩිදියුණු කිරීම | 3.98 | |
| **එකතුව** | | **75.59** | **41.39** |

- 2013 වර්ෂයේදී කුරුණෑගල, පුත්තලම, අනුරාධපුර හා පොළොන්නරුව දිස්ත්‍රික්කයන්හි සුළු වාරිමාර්ග, ග්‍රාමීය මාර්ග, ජල සම්පාදන, විදුලිය, පාසල් භෞතික පහසුකම් සංවර්ධනය, සිඟිති උයන් හා පෙර පාසල් සංවර්ධනය, ළමා උද්‍යාන හා ක්‍රීඩාංගන සංවර්ධනය, සෞඛ්‍ය සනීපාරක්ෂක හා මාතෘ සායන, සුළු හා පාරම්පරික කර්මාන්ත හා සේවා මධ්‍යස්ථාන වැඩිදියුණු කිරීම, වී, ආහාර, පොහොර ගබඩා නවීකරණය හා දිවි නැඟුම ජීවනෝපාය සංවර්ධනය යනාදී ක්ෂේත්‍ර වල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා නව ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක කරන ලදී.

වගු අංක 4.8.2

| අංශය | 2013 වර්ෂය සඳහා වියදම (රු.මි) | | | |
|---|---|---|---|---|
| | **කුරුණෑගල,** | **පුත්තලම** | **අනුරාධපුර** | **පොළොන්නරුව** |
| සුළු වාරිමාර්ග | 14.48 | 4.54 | 1.36 | 2.26 |
| ග්‍රාමීය මාර්ග | 106.95 | 35.40 | 67.52 | 45.19 |
| ජල සම්පාදන | 8.77 | 7.06 | 2.45 | 0.89 |
| විදුලිය | 32.72 | 11.20 | 4.23 | |
| පාසල් භෞතික පහසුකම් සංවර්ධනය | 18.38 | 28.60 | 1.20 | 5.63 |
| සිඟිති උයන් හා පෙර පාසල් සංවර්ධනය | 15.84 | 8.79 | 1.89 | |
| ළමා උද්‍යාන හා ක්‍රීඩාංගන සංවර්ධනය | 5.51 | 12.50 | 0.83 | |
| සෞඛ්‍ය සනීපාරක්ෂක හා මාතෘ සායන | 4.03 | 6.18 | 0.19 | |
| සුළු හා පාරම්පරික කර්මාන්ත හා සේවා මධ්‍යස්ථාන වැඩිදියුණු කිරීම | 0.32 | 11.58 | 0.04 | 5.26 |
| වී, ආහාර, පොහොර ගබඩා නවීකරණය | 0.34 | | 4.98 | |
| දිවි නැඟුම ජීවනෝපාය සංවර්ධනය | 0.05 | 1.11 | 0.10 | |
| **එකතුව** | **207.39** | **127.00** | **84.79** | **59.23** |

*යසෝදරා බාලිකා විද්‍යාලයට නව ගොඩනැගිල්ලක් ඉදි කිරීම හා බාස්කට් බෝල් ක්‍රීඩා අංගනයක් ඉදිකිරීම*
*ගම්පහ දිස්ත්‍රික්කය*

*ප්‍රතිසංස්කරණ කටයුතු නිම කිරීමෙන් පසුව නාගදීප විහාරය*
*යාපනය දිස්ත්‍රික්කය*

## සමාජීය යටිතල පහසුකම් සංවර්ධන අංශයේ විදේශීය ආයෝජන

2013 වර්ෂයේදී මේ යටතේ රෝහල් 33 ක්, පාසල් 159 ක්, වෙළඳපොළ 193 ක් හා ප්‍රජා ශාලා 802 ක් වශයෙන් ගොඩනැගිලි 1187 ක් ප්‍රතිසංස්කරණය කිරීමට සැලසුම් කරන ලදී.

2013.12.31 දින වන විට ඉන් රෝහල් 32 ක්, පාසල් 158 ක්, වෙළඳපොළ 101 ක් හා ප්‍රජා ශාලා 404 ක ප්‍රතිසංස්කරණ කටයුතු නිම කර ඇත .

තච්චිනාමරදමඩු රජයේ මිශ්‍ර පාසල
මුලතිවු දිස්ත්‍රික්කය

ධර්මපුර (නැ) ග්‍රාම සංවර්ධන කාර්යාලය
කිලිනොච්චි දිස්ත්‍රික්කය

ඉදිකරන ලද මූතූර් වෙළඳපොල
ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය

## 2013.12.31 දිනට සාරාංශගත මූල්‍ය ප්‍රගතිය

වග අංක 4.8.3

| අංශය | 2013 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 2013.12.31 දිනට වියදම (රු.මි) |
|---|---|---|
| ප්‍රජා ශාලා | 971.48 | 426.38 |
| අධ්‍යාපනික | 100.00 | 68.75 |
| සෞඛ්‍ය | 28.88 | 22.47 |
| වෙළඳපොල | 1211.45 | 389.27 |
| එකතුව | **2,311.81** | **906.86** |

## 2013.12.31 දිනට සමාජීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති අත්කරගෙන ඇති භෞතික හා මූල්‍ය ප්‍රගතිය

වගු අංක 4.8.4

| දිස්ත්‍රික්කය | 2013 වර්ෂය සඳහා භෞතික ඉලක්කය ව්‍යාපෘති සංඛ්‍යාව | 2013.12.31 දිනට අත්කරගෙන ඇති භෞතික ප්‍රගතිය | | 2013 වර්ෂය සඳහා ප්‍රතිපාදන රු.මි | 2013 වර්ෂය සඳහා වියදම රු.මි |
|---|---|---|---|---|---|
| | | වැඩ අවසන් ව්‍යාපෘති සංඛ්‍යාව | ක්‍රියාත්මක තත්ත්වයේ ව්‍යාපෘති සංඛ්‍යාව | | |
| සාමාජීය යටිතල පහසුකම් (ගෘහස්ථ ක්‍රීඩා හා ළමා ක්‍රියාකාරකම් වෙනුවෙන් උපකරණ හා ගොඩනැගිලි ලබාදීම, පුහුණු මධ්‍යස්ථාන, සංස්කෘතික මධ්‍යස්ථාන,ළමුන් සඳහා කියවීම් ශාලා, මගී ප්‍රවාහන බෝට්ටු, සොහොන් බිම්, ක්‍රීඩාංගන, බස් නැවතුම්පොළ, පුස්තකාල, වෙරළ උද්‍යාන, පොදු උද්‍යාන, රථ වාහන අංගන, ප්‍රජා ශාලා) | | | | | |
| කළුතර | 2 | | 2 | 4.14 | 4.14 |
| නුවරඑළිය | 57 | 11 | 46 | 17.94 | 17.94 |
| හම්බන්තොට | 177 | 72 | 104 | 53.39 | 53.39 |
| යාපනය | 3 | 1 | 1 | 124.32 | 29.78 |
| මන්නාරම | 18 | 5 | 12 | 125.32 | 48.96 |
| වවුනියාව | 2 | | 2 | 2.50 | 2.04 |
| මුලතිවු | 2 | 1 | 1 | 13.41 | 2.62 |
| කිළිනොච්චි | 12 | 6 | 5 | 40.60 | 18.36 |
| මඩකලපුව | 6 | 4 | 2 | 32.62 | 16.17 |
| අම්පාර | 19 | 7 | 5 | 238.35 | 118.47 |
| ත්‍රිකුණාමලය | 20 | 2 | 17 | 233.94 | 29.94 |
| කුරුණෑගල | 1 | | 1 | 0.86 | 0.86 |
| පොළොන්නරුව | 50 | 14 | 36 | 33.00 | 32.43 |
| බදුල්ල | 187 | 140 | 30 | 11.10 | 11.10 |
| මොණරාගල | 43 | 34 | 9 | 4.50 | 4.50 |
| රත්නපුරය | 107 | 73 | 34 | 21.75 | 21.75 |
| කෑගල්ල | 96 | 34 | 62 | 13.92 | 13.92 |
| උප එකතුව | **802** | **404** | **369** | **971.48** | **426.38** |
| අධ්‍යාපනික (පාසල් ගොඩනැගිලි) | | | | | |
| යාපනය | 43 | 43 | | 26.05 | 15.09 |
| මන්නාරම | 9 | 9 | | 1.20 | 0.00 |
| වවුනියාව | 23 | 22 | | 18.08 | 16.03 |
| මුලතිවු | 26 | 26 | | 13.52 | 9.34 |
| කිළිනොච්චි | 58 | 58 | | 41.15 | 28.282 |
| උප එකතුව | **159** | **158** | | **100.00** | **68.75** |
| සෞඛ්‍ය (රෝහල් ගොඩනැගිලි) | | | | | |
| යාපනය | 18 | 17 | 1 | 16.51 | 11.55 |
| මන්නාරම | 3 | 3 | | 3.98 | 3.42 |
| වවුනියාව | 4 | 4 | | 2.75 | 1.86 |
| කිළිනොච්චි | 8 | 8 | | 5.64 | 5.64 |
| උප එකතුව | **33** | **32** | **1** | **28.88** | **22.47** |
| සති පොළ ගොඩනැගිලි | | | | | |
| යාපනය | 25 | 15 | 7 | 200.89 | 75.60 |
| මන්නාරම | 31 | 19 | 8 | 94.10 | 31.31 |
| වවුනියාව | 11 | 9 | 1 | 49.22 | 24.55 |
| මුලතිවු | 34 | 19 | 13 | 187.07 | 28.82 |
| කිළිනොච්චි | 33 | 20 | 12 | 87.96 | 40.84 |
| මඩකලපුව | 15 | 10 | 13 | 108.26 | 28.30 |
| අම්පාර | 12 | 3 | 9 | 216.12 | 83.33 |
| ත්‍රිකුණාමලය | 19 | 7 | 11 | 149.27 | 34.67 |
| අනුරාධපුර | 12 | 1 | 6 | 3.310 | 3.31 |
| පොළොන්නරුව | 1 | | 1 | 0.780 | 0.62 |
| මොණරාගල (බිල්පත් පියවීම) | | | | 1.700 | 1.70 |
| උප එකතුව | **193** | **101** | **75** | **1,211.45** | **389.27** |
| මුළු එකතුව | **1187** | **695** | **445** | **2,311.81** | **906.86** |

## 4.9 ජීවනෝපාය සංවර්ධනය

ඇඟලුම් කර්මාන්තය, අත් යන්ත්‍ර රෙදි පිළි නිෂ්පාදනය, පොල් තෙල් හිඳීමේ කර්මාන්තය වැනි පොකුරු ව්‍යාපාර/කුඩා කණ්ඩායම් ව්‍යාපාර (cluster business) තුළින් ආදායම් උත්පාදනය කිරීම සඳහා ක්ෂුද්‍ර මූල්‍ය ණය පහසුකම් ලබාදීම හා පුහුණු වැඩසටහන් පවත්වා අදාළ කර්මාන්ත සම්බන්ධ දැනුම ලබාදීම යනාදී ව්‍යාපෘති සඳහා ජීවනෝපාය සංවර්ධනය යටතේ 2013 වර්ෂයේදී රු.මි 519.38 ක ප්‍රතිපාදන වෙන් කරන ලද අතර 2013.12.31 දිනට වියදම රු.මි 158.69 කි.

*ජයන්තිනගර් ප්‍රදේශයේ මල් පෝච්චි නිපදවමින් කිළිනොච්චි දිස්ත්‍රික්කය*

*මයියාතුපිටිය ප්‍රදේශයේ පිහිටි ඇඟලුම් කර්මාන්තායතනයක් මඩකලපුව දිස්ත්‍රික්කය*

- පොකුරු ව්‍යාපාර මේ වන විට ලාභ සහිතව ඉතා සාර්ථකව ආදායම් උත්පාදනය කරනු ලබයි. මෙම ව්‍යාපාර වෙනුවෙන් ගොඩනැගිලි 40 ක් ඉදිකරන ලද අතර ඍජු හා වක්‍ර ප්‍රතිලාභීන් මිලියනයකට පමණ ප්‍රතිලාභ අත්වේ.
- මෙම ව්‍යාපාර කුඩා කණ්ඩායම් 22,929 කගේ සහභාගීත්වයෙන් ගම්මාන 1039 ක ක්‍රියාත්මක වේ.
- මීට සම්බන්ධ කණ්ඩායම් වල සාමාජිකයන්ගේ පවුල් වල ආදායම් තත්ත්වය 30% කින් වර්ධනය වී ඇත.
- පුහුණු වැඩසටහන් 21 ක් පවත්වා අවසන් කර ඇත.
- ක්ෂුද්‍ර මූල්‍ය ණය යෝජනා ක්‍රමය මගින් ප්‍රතිලාභීන් 13,807 කට ප්‍රතිලාභ සලසා ඇත.

## ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති 2013.12.31 දිනට අත්කරගෙන ඇති භෞතික හා මූල්‍ය ප්‍රගතිය

වග අංක 4.9.1

| දිස්ත්‍රික්කය | ක්‍රියාකාරකම | 2013 වර්ෂය සඳහා භෞතික ඉලක්ක සංඛ්‍යාව | 2013.12.31 දිනට අත්කරගෙන ඇති භෞතික ප්‍රගතිය | | 2013 වර්ෂය සඳහා ප්‍රතිපාදන රු.මි | 2013 වර්ෂය සඳහා වියදම රු.මි |
|---|---|---|---|---|---|---|
| | | | වැඩ අවසන් ව්‍යාපෘති සංඛ්‍යාව | ක්‍රියාත්මක තත්ත්වයේ ව්‍යාපෘති සංඛ්‍යාව | | |
| | පුහුණු වැඩසටහන් | 10 | 3 | 3 | | |
| යාපනය | ක්ෂුද්‍ර මූල්‍ය ණය පහසුකම් ලබා ගත් ප්‍රතිලාභීන් | 73 | 73 | | 31.70 | 0.48 |
| | පොකුරු ව්‍යාපාර සඳහා ඉදි කරන ලද ගොඩනැගිලි සංඛ්‍යාව | 11 | 5 | 6 | | |
| | පුහුණු වැඩසටහන් | 10 | 8 | | | |
| මන්නාරම | ක්ෂුද්‍ර මූල්‍ය ණය පහසුකම් ලබා ගත් ප්‍රතිලාභීන් | 9 | 9 | | 27.33 | 1.47 |
| | පොකුරු ව්‍යාපාර සඳහා ඉදි කරන ලද ගොඩනැගිලි සංඛ්‍යාව | 11 | 6 | 4 | | |
| | පුහුණු වැඩසටහන් | 5 | 3 | | | |
| වවුනියාව | ක්ෂුද්‍ර මූල්‍ය ණය පහසුකම් ලබා ගත් ප්‍රතිලාභීන් | 853 | 853 | | 27.11 | 8.25 |
| | පොකුරු ව්‍යාපාර සඳහා ඉදි කරන ලද ගොඩනැගිලි සංඛ්‍යාව | 21 | 7 | 12 | | |
| | පුහුණු වැඩසටහන් | 10 | | 3 | | |
| මුලතිවු | ක්ෂුද්‍ර මූල්‍ය ණය පහසුකම් ලබා ගත් ප්‍රතිලාභීන් | 1542 | 1542 | | 34.24 | 26.69 |
| | පොකුරු ව්‍යාපාර සඳහා ඉදි කරන ලද ගොඩනැගිලි සංඛ්‍යාව | 5 | | | | |
| | පුහුණු වැඩසටහන් | 7 | | | | |
| කිළිනොච්චිය | ක්ෂුද්‍ර මූල්‍ය ණය පහසුකම් ලබා ගත් ප්‍රතිලාභීන් | 3936 | 3936 | | 41.56 | 14.42 |
| | පොකුරු ව්‍යාපාර සඳහා ඉදි කරන ලද ගොඩනැගිලි සංඛ්‍යාව | 5 | 1 | 4 | | |
| | පුහුණු වැඩසටහන් | 10 | 2 | | | |
| මඩකලපුව | ක්ෂුද්‍ර මූල්‍ය ණය පහසුකම් ලබා ගත් ප්‍රතිලාභීන් | 3458 | 3458 | | 37.49 | 11.83 |
| | පොකුරු ව්‍යාපාර සඳහා ඉදි කරන ලද ගොඩනැගිලි සංඛ්‍යාව | 4 | 2 | 2 | | |
| | පුහුණු වැඩසටහන් | 10 | 2 | | | |
| අම්පාර | ක්ෂුද්‍ර මූල්‍ය ණය පහසුකම් ලබා ගත් ප්‍රතිලාභීන් | 813 | 813 | | 46.50 | 21.73 |
| | පොකුරු ව්‍යාපාර සඳහා ඉදි කරන ලද ගොඩනැගිලි සංඛ්‍යාව | 5 | | 4 | | |
| | පුහුණු වැඩසටහන් | 10 | 3 | | | |
| ත්‍රිකුණාමලය | ක්ෂුද්‍ර මූල්‍ය ණය පහසුකම් ලබා ගත් ප්‍රතිලාභීන් | 1696 | 1696 | | 34.28 | 12.87 |
| | පොකුරු ව්‍යාපාර සඳහා ඉදි කරන ලද ගොඩනැගිලි සංඛ්‍යාව | 6 | | 3 | | |
| පුත්තලම | ක්ෂුද්‍ර මූල්‍ය ණය පහසුකම් ලබා ගත් ප්‍රතිලාභීන් | 143 | 143 | | 74.15 | 21.98 |
| | පොකුරු ව්‍යාපාර සඳහා ඉදි කරන ලද ගොඩනැගිලි සංඛ්‍යාව | 16 | 7 | 9 | | |
| අනුරාධපුරය | ක්ෂුද්‍ර මූල්‍ය ණය පහසුකම් ලබා ගත් ප්‍රතිලාභීන් | 325 | 325 | | 54.25 | 13.13 |
| | පොකුරු ව්‍යාපාර සඳහා ඉදි කරන ලද ගොඩනැගිලි සංඛ්‍යාව | 7 | 4 | 3 | | |
| පොළොන්නරුව | ක්ෂුද්‍ර මූල්‍ය ණය පහසුකම් ලබා ගත් ප්‍රතිලාභීන් | 326 | 326 | | 55.49 | 15.72 |
| | පොකුරු ව්‍යාපාර සඳහා ඉදි කරන ලද ගොඩනැගිලි සංඛ්‍යාව | 14 | 7 | 7 | | |
| මොණරාගල | ක්ෂුද්‍ර මූල්‍ය ණය පහසුකම් ලබා ගත් ප්‍රතිලාභීන් | 633 | 633 | | 55.27 | 10.11 |
| | පොකුරු ව්‍යාපාර සඳහා ඉදි කරන ලද ගොඩනැගිලි සංඛ්‍යාව | 7 | 1 | 6 | | |
| | **පුහුණු වැඩසටහන්** | 72 | 21 | 6 | | |
| මුළු එකතුව | **ක්ෂුද්‍ර මූල්‍ය ණය පහසුකම් ලබා ගත් ප්‍රතිලාභීන්** | 13807 | 13807 | | 519.38 | 158.69 |
| | **පොකුරු ව්‍යාපාර සඳහා ඉදි කරන ලද ගොඩනැගිලි සංඛ්‍යාව** | 112 | 40 | 60 | | |

## 4.10 ධාරිතා සංවර්ධනය

රු.මි 230.00 ක වියදමින් පළාත් පාලන හා පළාත් සභා වල සේවයට අනුයුක්ත නිලධාරීන් සඳහා ක්ෂේත්‍ර 3 ක් ඔස්සේ ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. මෙම වැඩසටහන් තුළින් උතුරු, නැගෙනහිර පළාත් වල රාජ්‍ය නිලධාරීන් හට මෙන්ම කොළඹ දිස්ත්‍රික්කයේ රාජ්‍ය නිලධාරීන් රැසකටද ප්‍රතිලාභ අත්විය.

**මානව සම්පත් සංවර්ධනය**

- උතුරු හා නැගෙනහිර පළාතේ ගුරුවරු 280 කට පමණ හා පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් 19,000 කට පමණ ඉංග්‍රීසි භාෂා දැනුම ලබාදීම.
- උතුරු හා නැගෙනහිර පළාත් වල සේවය කරනු ලබන 3567 ක් පමණවන රාජ්‍ය නිලධාරීන් හට තම රාජකාරි ඉටුකිරීමේදී අවශ්‍ය වන ඉංග්‍රීසි භාෂා දැනුම ලබාදීම.

**ප්‍රාදේශීය හා නාගරික සංවර්ධනය**

- උතුරු හා නැගෙනහිර පළාත් වල සියළුම ප්‍රාදේශීය හා නාගරික මට්ටමේ රාජ්‍ය ආයතන වල නිලධාරීන් සඳහා මහජන සම්බන්ධතා පැවැත්වීම පිළිබඳ වැඩමුළු සංවිධානය කිරීම.

**ප්‍රජා සංවර්ධනය**

- මඩකලපුව දිස්ත්‍රික්කයේ කාන්තා අභිවෘද්ධිය වෙනුවෙන් ක්‍රියාත්මක වන ආයතන වලට සහන සලසාදීම.
- ප්‍රජා සංවිධාන සඳහා විධිමත්ව ව්‍යාපෘති යෝජනා සකස් කරන ආකාරය පිළිබඳ පුහුණුවක් ලබාදීම.

*නිපුණතා සංවර්ධන වැඩසටහන්*

## 4.11 බිම් බෝම්බ ඉවත්කිරීමේ වැඩසටහන

යුද්ධය පැවති වකවානුවේ යුද්ධය පැවති ප්‍රදේශ වල සෑම බිම් අඟලක් පාසාම වළලා තිබූ බිම් බෝම්බ ඉවත් කර එම ප්‍රදේශ ජනතා හිතකර ප්‍රදේශ බවට පත්කරලීම උදෙසා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක විය.

යුධ ගැටුම් අවසානයත් සමග මතුවූ කඩිනම් අවශ්‍යතාවය වූයේ පුද්ගල නාශක හා වාහන නාශක යන දෙආකාරයෙන්ම පුපුරා නොගිය අවි කොටස් හා ත්‍රස්තවාදීන් විසින් අටවන ලද මරුගුල් හේතුවෙන් අනාරක්ෂිත තත්ත්වයට පත්වී තිබුණු ගැටුම් වලින් බලපෑමට පත් වූ ප්‍රදේශයන් බිම් බෝම්බ වලින් තොර ප්‍රදේශයන් ලෙස ගොඩනැගීමයි. අවතැන්වූවන් ඔවුන්ගේ මුල් වාසස්ථානයන්හි නැවත පදිංචි කිරීමේදී සහ ගැටුම් බලපැවැත් වූ ප්‍රදේශයන්හි සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී බිම් බෝම්බ පැවතීම මහත් බාධාවක් විය. එම නිසා බිම් බෝම්බ වලින් තොර පරිසරයක් ගොඩනැගීම ඉලක්ක කරගෙන බිම් බෝම්බ ඉවත්කිරීමේ මානුෂවාදී වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී.

**බිම් බෝම්බ ඉවත්කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමෙන් ලද ප්‍රතිලාභ**

- බිම් බෝම්බ ඉවත්කිරීමෙන් පසු " සහල් නැලිය" ප්‍රදේශයේ නැවත වී වගාව ඇරඹුනි.
- ප්‍රධාන දුම්රිය මාර්ග දෙකක බිම් බෝම්බ ඉවත් කිරීම
    - ඕමන්තෙයි සිට කන්කසන්තුරය දක්වා කි.මී 148 ක දුර ප්‍රමාණයක්
    - මැදවච්චිය සිට තලෙයිමන්නාරම දක්වා කි.මී 106 ක දුර ප්‍රමාණයක්
- ප්‍රාථමික හා ද්විතියික පාසල්, ආගමික ස්ථාන නැවත විවෘත කිරීම
- උතුරු පළාතේ 300,000 ක් පමණ අවතැන් ජනතාව නැවත පදිංචි කිරීම.
- A32 මාර්ගයේ මන්නාරමේ සිට වෙල්ලන්කුලම දක්වා කි.මී 41 දුර ප්‍රමාණයක බිම් බෝම්බ ඉවත් කිරීමෙන් පසු සංවර්ධනය කිරීම.
- A12 හා A5 මාර්ග වල කි.මී 60 ක දුර ප්‍රමාණයක බිම් බෝම්බ ඉවත් කිරීම.

*බිම් බෝම්බ අවදානම පිළිබඳ දැනුවත්කිරීමේ වැඩසටහන්*

*බිම් බෝම්බ ඉවත්කිරීමෙන් පසු ආගමික ස්ථාන ජනතාවගේ වන්දනාමානයන්ට පාත්‍රවීම*

*බිම් බෝම්බ ඉවත් කර ඇති ප්‍රදේශවල නිදහසේ සැරිසරන පාසල් දරුවන්*

## බිම් බෝම්බ ඉවත්කිරීමේ වැඩසටහන - 2013.12.31 දිනට ප්‍රගතිය

වගු අංක 4.11.1

| දිස්ත්‍රික්කය | බිම් බෝම්බ උවදුරට ගොදුරු වූ මුළු භූමි ප්‍රමාණය (වර්ග මීටර) | සම්පූර්ණයෙන් බිම් බෝම්බ ඉවත් කර ඇති මුළු භූමි ප්‍රමාණය (වර්ග මීටර) | තවදුරටත් බිම් බෝම්බ ඉවත්කිරීමට ඇති භූමි ප්‍රමාණය (වර්ග මීටර) |
|---|---|---|---|
| යාපනය | 51,935,532 | 47,934,500 | 3,807,011 |
| කිළිනොච්චිය | 597,375,765 | 579,316,088 | 18,059,677 |
| මුලතිවු | 230,331,444 | 214,148,015 | 16,183,429 |
| වවුනියාව | 223,251,300 | 218,172,099 | 5,079,201 |
| මන්නාරම | 314,669,910 | 298,165,504 | 16,504,406 |
| **උප එකතුව** | **1,417,563,950** | **1,357,930,226** | **59,633,724** |
| ත්‍රිකුණාමලය | 101,665,234 | 95,282,716 | 6,382,518 |
| මඩකලපුව | 495,262,449 | 480,866,288 | 14,396,161 |
| අම්පාර | 46,651,013 | 46,577,574 | 73,439 |
| **උප එකතුව** | **643,578,695** | **622,726,578** | **20,852,118** |
| අනුරාධපුරය | 3,547,971 | 213,290 | 3,334,681 |
| පොළොන්නරුව | 105,669 | 73,810 | 31,859 |
| **උප එකතුව** | **3,653,640** | **287,100** | **3,366,540** |
| **එකතුව** | **2,064,796,286** | **1,980,943,904** | **83,852,382** |

*Source : Information Management System on Mine Action (IMSMA)*
*සටහන : තාක්ෂණික නොවන අධ්‍යයන මගින් බිම් බෝම්බ උවදුරට ගොදුරු වූ මුළු භූමි ප්‍රමාණය නිර්ණය අඛණ්ඩව සිදු කරගෙන යන ක්‍රියාවලියක් බැවින් (continuous process) එම අගය වෙනස් වන සුළුය.*

## 2013.12.31 දිනට බිම් බෝම්බ ඉවත්කිරීමේ වැඩසටහන අත්කරගෙන ඇති ප්‍රගතිය




*2009 වර්ෂයේදී තිබූ තත්ත්වය*




*2013.12.31 දිනට වැඩසටහන අත්කර ගෙන ඇති ප්‍රගතිය*

## 4.12 සංවර්ධනය සඳහා ලෝක ආහාර වැඩසටහනෙහි දායකත්වය

### 01. හැඳින්වීම

ශ්‍රී ලංකා රජය හා එක්සත් ජාතීන්ගේ ලෝක ආහාර වැඩපිළිවෙළ ඒකාබද්ධව ක්‍රියාත්මක කරන ව්‍යාපෘතියකි. ලෝක ආහාර වැඩසටහන ප්‍රධාන වශයෙන්ම සහනාධාර ලෙස ආහාර ද්‍රව්‍ය ලබා දෙන අතර, ව්‍යාපෘති මෙහෙයුම් වියදම් ශ්‍රී ලංකා රජය විසින් දරනු ලබයි. අවදානමට ලක්වූ ජනතාවගේ ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම මූලික අරමුණ වන අතර, මෙම ව්‍යාපෘතිය 2013 වසර තුල උතුරු පළාතේ යාපනය, කිලිනොච්චි, මුලතිව්, වවුනියාව හා මන්නාරම යන දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි ක්‍රියාත්මක විය.

### 03. කාර්ය සාධනය - 2013 දෙසැම්බර් 31

✓ මූල්‍ය කාර්ය සාධනය (රු.මිලියන)

වගු අංක 4.12.1

| අරමුදල් ප්‍රභවය | මුළු වියදම (රු.මි) |
|---|---|
| ශ්‍රී ලංකා රජය | 383.48 |
| එක්සත් ජාතීන්ගේ ලෝක ආහාර වැඩපිළිවෙළ | 805.30 |
| **මුළු එකතුව** | **1,188.78** |

✓ භෞතික කාර්ය සාධනය - ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වන ප්‍රධාන වැඩසටහන් 04 අනුව

වගු අංක 4.12.2

| ප්‍රධාන වැඩ සටහන් | භෞතික ප්‍රගතිය | |
|---|---|---|
| | ප්‍රතිලාභින් සංඛ්‍යාව | ආහාර ප්‍රමාණය (මෙ.ටො) |
| 01. අවදානමට ලක් වූ කණ්ඩායම් සඳහා ආහාර ලබා දීමේ වැඩසටහන (VGF) | 40,212 | 3,664.84 |
| 02. පාසල් ළමුන් සඳහා ආහාර වැඩසටහන (SMP) | 156,267 | 3,106.35 |
| 03. මාතෘ හා ළමා සෞඛ්‍ය සහ පෝෂණ වැඩසටහන (MCHN) | 67,585 | 492.62 |
| 04. වැඩ සඳහා ආහාර වැඩසටහන (FFW/FFT/FFA/SFFW) | 27,635 | 1,185.55 |
| **මුළු එකතුව** | **291,699** | **8,449.36** |

# 5

# නැගී එන ආර්ථිකයක් උදෙසා
# උපාය මාර්ගික මූලාරම්භයන්

## 5. සංචාරක කටයුතු සංවර්ධනය

සංචාරක කර්මාන්තය සඳහා කඩිනම් සංවර්ධන වැඩසටහනක් හඳුන්වා දෙන්නෙමි. ඒ යටතේ 2016 වර්ෂය වන විට වසරකට සංචාරකයන් ලක්ෂ 25 ක් මෙරටට ගෙන්වා ගැනීමට අවශ්‍ය වන යටිතල පහසුකම් සහ අනෙකුත් අවශ්‍යතා සපුරාලන වැඩපිළිවෙලක් දියත් කරන්නෙමි.

මහින්ද චින්තන ඉදිරි දැක්ම: පිටු අංක 90

2013 වර්ෂයේදී ශ්‍රී ලංකා ජාතික ආර්ථිකය තුළ විදේශ විනිමය උපයා දෙන කර්මාන්ත අතුරින් පස්වන ස්ථානය හිමි කර ගත්තේ සංචාරක කර්මාන්තයයි. 2012 වසරේ සංචාරක ක්ෂේත්‍රයෙන් ලද මුළු ආදායම ඇ.ඩො.මි. 1038.3 ක් වූ අතර 2013 වසර අවසානයේදී ඇස්තමේන්තුගත සමස්ථ ආදායම ඇ.ඩො.මි. 1707.0 ක් පමණ වනු ඇතැයි උපකල්පනය කර තිබිණි.

2013 වසරේ ජනවාරි සිට දෙසැම්බර් මාසය දක්වා වසර තුළ මෙරටට පැමිණි සංචාරකයින් සංඛ්‍යාව 1,274,593 ක් වූ අතර පසුගිය වසරේ එම කාලය තුළදී පැමිණි සංචාරකයින් සංඛ්‍යාව හා සැසඳීමේදී එය 26.7% ක වර්ධනයක් පෙන්නුම් කරනු ලැබීය.

### සංචාරක පැමිණීම්

වගු අංක 5.1

| | 2012 | 2013 |
|---|---|---|
| ජනවාරි | 85,874 | 110,543 |
| පෙබරවාරි | 83,549 | 113,968 |
| මාර්තු | 91,102 | 113,208 |
| අප්‍රේල් | 69,591 | 80,737 |
| මැයි | 57,506 | 74,838 |
| ජුනි | 65,245 | 90,279 |
| ජූලි | 90,338 | 107,016 |
| අගෝස්තු | 79,456 | 123,269 |
| සැප්තැම්බර් | 71,111 | 90,339 |
| ඔක්තෝම්බර් | 80,379 | 107,058 |
| නොවැම්බර් | 109,202 | 109,420 |
| දෙසැම්බර් | 122,252 | 153,918 |




ඉහත පරමාර්ථයන් සාධනයෙහිලා සංචාරක කටයුතු සම්බන්ධයෙන් වූ උපාය මාර්ග, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය 2013 වසරේදීද ප්‍රධාන ක්ෂේත්‍ර 3 ක් ඔස්සේ සිදු කරනු ලැබීය.




## 5.1 සංචාරක පහසුකම් සංවර්ධනය (Tourist Facility Development)

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් ඉහළ ක්‍රය ශක්තියක් ඇති සංචාරකයින් සඳහා අවශ්‍ය කරන නවාතැන් පහසුකම් සැපයීම අරමුණු කර ගනිමින් කල්පිටිය, පාසිකුඩා, කුච්චවේලි, දෙද්දූව හා යාල පලටුපාන ආදී සංචාරක කලාප පරිසර හිතකාමී අයුරින් සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමේ අභිලාෂයෙන් නිර්මිත සිදු කර ඇත.

### ඉදි කිරීම් අරඹා ඇති සංචාරක නිකේතන

වගු අංක 5.1.1

| සංචාරක කලාපය | භූමි ප්‍රමාණය (අක්කර) | ඉදි කිරීමට යෝජිත කාමර ගණන | 2013.12.31 දිනට නිම කර ඇති කාමර ගණන | 2013.12.31 දිනට පෞද්ගලික අංශයේ දායකත්වය (රු.මි.) |
|---|---|---|---|---|
| පාසිකුඩා | 156 | 854 | 327 | 10,161.0 |
| කල්පිටිය | 3636 | 5000 | - | - |
| කුච්චවේලි | 510 | 2500 | 40 | 1050.0 |
| දෙද්දූව | 1713 | - | - | - |
| යාල පලටුපාන | 1036 | 310 | 160 | 2455.0 |

අනිලානා සංචාරක නිකේතනය - පාසිකුඩා

උගාබේ සංචාරක නිකේතනය - පාසිකුඩා

Jungle Beach Resort - කුච්චවේලි

පස් අවුරුදු සංචාරක සංවර්ධන උපාය මාර්ග අනුව 2016 වසර වන විට මිලියන 2.5 ක් වූ සංචාරක පැමිණීම් ඉලක්කය සපුරා ගැනීම සඳහා අවශ්‍ය කරන කාමර සංඛ්‍යාව 50,000 ක් පමණ වන බැව් සංඛ්‍යාත්මකව පුරෝකථනය කර ඇති අතර, 2013 දෙසැම්බර් 31 දිනට සංචාරක ක්ෂේත්‍රය සතුව ඇති කාමර සංඛ්‍යාව 23,983 ක් විය.

**නවාතැන් වර්ගීකරණය අනුව කාමර සංඛ්‍යාව**

වගු අංක 5.1.2

| නවාතැන්පල | කාමර සංඛ්‍යාව |
|---|---|
| **තරු 01 සිට 5 දක්වා හෝටල්** | 9,389 |
| **බුටික් (Boutique) හෝටල් සහ බුටික් විලා** | 645 |
| **ආගන්තුක නිවාස (Guest Houses)** | 7,230 |
| **වර්ගීකරණය නොකල හෝටල්** | 6,719 |
| **එකතුව** | **23,983** |

ඉහත අරමුණු සපුරා ගැනීම උදෙසා යෝජිත වැඩසටහන් සහ ක්‍රියාමාර්ග පහත පරිදි දැක්විය හැක. මේ අනුව ප්‍රවර්ධන ඉලක්ක සපුරා ගැනීමට අවශ්‍ය කාමර සංඛ්‍යාව වැඩි කර ගැනීමට විකල්ප වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

## ❖ එක් වහලක් යටතේ සියළු පහසුකම් සැලසීමේ ඒකකය (One Stop Unit)

සංචාරක හෝටල් ව්‍යාපෘතින්වල ආයෝජකයින්ගේ ගැටළු කඩිනමින් නිරාකරණය කොට අවශ්‍ය අනුමැතීන් කඩිනමින් ලබා දීම සඳහා 2010 වසරේ පිහිටුවන ලද්දකි.

**මෙම ඒකකයේ 2013 වසරේ කාර්යසාධනය පහත පරිදි වේ.**

| | |
|---|---|
| 2013 දෙසැම්බර් 31 දිනට ලැබී ඇති ව්‍යාපෘති සංඛ්‍යාව | 298 |
| පරීක්ෂා කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව | 59 |
| අනුමැතීන් ලබා දුන් ව්‍යාපෘති සංඛ්‍යාව | 36 |

### ආයෝජන වටිනාකම් අනුව ව්‍යාපෘති වර්ගීකරණය - 2013

වගු අංක 5.1.3

| ඇ.ඩො.මි. | ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|
| 0.5 ට අඩු | 12 |
| 0.5 - 1 | 5 |
| 1.1 - 2 | 9 |
| 2.1 - 5 | 18 |
| 5.1 - 10 | 3 |
| 10.1 - 20 | 7 |
| 20 ට වැඩි | 5 |
| **එකතුව** | **59** |

### දිස්ත්‍රික් වශයෙන් ඉහත ඒකකය යටතේ ව්‍යාපෘතීන් සඳහා අනුමැතිය ලද ව්‍යාපෘති

වගු අංක 5.1.4

| දිස්ත්‍රික්කය | ව්‍යාපෘතීන් සංඛ්‍යාව | කාමර සංඛ්‍යාව | ආයෝජනය (ඇ.ඩො.මි.) |
|---|---|---|---|
| අම්පාර | 1 | 31 | 1.8 |
| කොළඹ | 4 | 329 | 24.14 |
| ගාල්ල | 4 | 80 | 10.86 |
| ගම්පහ | 3 | 48 | 10.23 |
| හම්බන්තොට | 5 | 845 | 171.76 |
| යාපනය | 1 | 66 | 6.36 |
| කළුතර | 5 | 712 | 110.89 |

| | | | |
|---|---|---|---|
| කුරුණෑගල | 1 | 16 | 0.37 |
| මන්නාරම | 1 | 52 | 1.22 |
| මාතලේ | 3 | 193 | 17.2 |
| මාතර | 3 | 75 | 13.63 |
| මොණරාගල | 2 | 42 | 1.37 |
| පොලොන්නරුව | 1 | 33 | 0.63 |
| ත්‍රිකුණාමලය | 1 | 10 | 0.6 |
| වව්නියාව | 1 | 15 | 1.16 |
| **එකතුව** | **36** | **2547** | **372.22** |

## ❖ සංචාරක සත්කාරක නිවාස වැඩසටහන (Home Stay Programme)

මෙරටට පැමිණෙන ක්‍රයශක්තිය අඩු සංචාරකයින් ඉලක්ක කරගනිමින් ක්‍රියාත්මක වන සංචාරක සත්කාරක නිවාස වැඩසටහනේදී ශ්‍රී ලාංකීය නිවැසියන් සමඟ දේශීය ආහාරපාන, සිරිත් විරිත් හා ආගන්තුක සත්කාර අත්විඳිමින් දේශීය ජීවන රටාව හා සංස්කෘතික වටිනාකම් පිළිබඳ අත්දැකීම් ලබා දෙමින් නිවාඩුවක් ගත කිරීමට ඉඩ සලසා දීම මෙම වැඩසටහන යටතේ සිදු කරනු ලැබේ.

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2011 වසරේදී ආරම්භ කරන ලද මෙම වැඩසටහන නැවත නව මුහුණුවරකින් 2013 වසරේදී දියත් කරන ලදී. මෙම වැඩසටහනෙහි මූලික අරමුණ වනුයේ සංචාරක ව්‍යාපාරයෙන් ලැබෙන ප්‍රතිලාභ සෘජුවම බිම් මට්ටමේ ප්‍රජාව වෙත ලබා දීමයි.

*සංචාරක සත්කාරක නිවාස වැඩසටහනෙහි නව ලාංඡනය*

| 2013.12.31 දිනට ප්‍රගතිය | ඒකක සංඛ්‍යාව | කාමර සංඛ්‍යාව |
|---|---|---|
| | 323 | 1128 |

*සංචාරක සත්කාරක නිවසක අසිරිය විඳිමින් සිටින විදේශික පවුලක්*

**සංචාරක යටිතල පහසුකම් සංවර්ධනය සඳහා විදේශාධාර දායකත්වය ලද ව්‍යාපෘති**

**සංචාරක සම්පත් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය** (TRIP)

ජපාන අන්තර්ජාතික සහයෝගිතා ආයතනයේ (JICA) මූල්‍ය ප්‍රතිපාදන යටතේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරනු ලැබූ සංචාරක සම්පත් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (TRIP) මගින් හැම්ල්ටන් ඇළෙහි සංචාරක හා ධීවර කර්මාන්ත සංවර්ධනය සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී. එමගින් ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නංවාලීමට මෙන්ම ඔවුන්ට ආර්ථික ප්‍රතිලාභ ලබාගත හැකි වන අයුරින් බොහෝ පිරිසකගේ හිත සුව පිණිස එම ඇළ දෙපස සංචාරක ආකර්ෂණ කලාපයක් ලෙස සංවර්ධනය කිරීමටත්, ධීවර බෝට්ටු පහසුවෙන් නවතා තැබීමට හැකි අයුරින් සංවර්ධන කටයුතු සිදු කරන ලදී.

රු.මි. 2248.04 ක මුදලක් වැය කර මෙම ව්‍යාපෘතියේ සංවර්ධන කාර්යයන් නිම කර ඇති අතර මීට අමතරව මෙම ව්‍යාපෘතියේ වැඩිදුර ක්‍රියාකාරකම් සඳහා අමාත්‍යාංශය විසින් 2013 අයවැය මඟින් රු.මි. 90.0 ක ප්‍රතිපාදන ලබා දෙන ලදී.

*හැම්ල්ටන් ඇල සංවර්ධනය කිරීම*

## 5.2 සංචාරක කටයුතු ප්‍රවර්ධනය (Tourism Promotion)

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය මඟින් සංචාරක කටයුතු ප්‍රවර්ධනය සිදු කරනු ලබයි. මෙම වැඩසටහනේ අරමුණ වන්නේ වසර පුරා ඒකාකාරීව විදේශීය සංචාරකයින් ප්‍රමාණයක් මෙරටට ගෙන්වා ගැනීමයි. එය තහවුරු කරනු වස් සාම්ප්‍රදායික සංචාරක වෙළඳපළ සේම නව සංචාරක වෙළඳ පළවල් ලෙස ඇමරිකාව, නැගෙනහිර ආසියාව, මැදපෙරදිග, නැගෙනහිර යුරෝපය සහ ඕස්ට්‍රේලියාව ආදී නව වෙළඳපල ආකර්ෂණය කිරීම සඳහා හේතු වන වැඩසටහන් 2013 වසරේදීද සිදු කරනු ලැබීය.

## ශ්‍රී ලංකාවට සංචාරකයින්ගේ පැමිණීම

වගු අංක 5.2.1

| රට | 2012 | 2013 |
|---|---|---|
| ඉන්දියාව | 176,340 | 208,795 |
| එක්සත් රාජධානිය | 114,218 | 137,416 |
| ජර්මනිය | 71,642 | 85,470 |
| මාලදිවයින | 47,572 | 79,474 |
| ප්‍රංශය | 56,863 | 64,388 |
| චීනය | 27,627 | 54,288 |
| ඔස්ට්‍රේලියාව | 51,614 | 54,252 |
| රුසියාව | 28,402 | 51,235 |
| යුක්රේනය | 22,348 | 38,607 |
| ඇමරිකා එක්සත් ජනපදය | 29,907 | 34,690 |

ශ්‍රී ලංකාවට සංචාරකයන් පැමිණෙන අනෙකුත් රටවල්වලට සාපේක්ෂව ඉන්දියාව, එක්සත් රාජධානිය, ජර්මනිය, ප්‍රංශය හා මැදපෙරදිග රටවලින් විශාල සංචාරක පිරිසක් මෙරටට පැමිණ ඇත.




මීට අමතරව සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය හා සම්බන්ධ සුවිශේෂී වෙළඳපොළ (Niche Markets) ආකර්ෂණය කර ගැනීමෙහි ලා සිදු කළ ප්‍රවර්ධන කටයුතු පිළිබඳව සළකා බැලීමේදී සංචාරක කටයුතු පිළිබඳ ජාත්‍යන්තර නාමාවලියක් වූ ''Kompass''හි ශ්‍රී ලංකාවේ සංචාරක කටයුතු ප්‍රවර්ධනය, ඉන්දියාවේ පළ කරන සඟරාවල ශ්‍රී ලංකාවේ සංචාරක කටයුතු ප්‍රවර්ධනය, ආසියානු පැසිපික් කලාපිය සඟරාවන් මඟින් ප්‍රවර්ධන කටයුතු සිදු කිරීම ප්‍රධාන වේ. තවද වෙබ් අඩවි ප්‍රවර්ධන කටයුතු, Google Alerts, MICE News, eturbo news, මොබයිල් වෙබ් (Mobile web

සහ ඇන්ඩ්‍රොයිඩ් ඇප්ස් (Android Aps) ආශ්‍රයෙන් ද ශ්‍රී ලංකාවේ සංචාරක කටයුතු පිළිබඳව ප්‍රවර්ධන කටයුතු සිදු කරන ලදී. මෙමඟින් අපේක්ෂා කරන්නේ එවැනි සුවිශේෂී මාධ්‍යයන් භාවිතා කරන්නා වූ ඉහළ ක්‍රයශක්තියක් ඇති සංචාරකයින් ආකර්ෂණය කර ගැනීමයි.

තවද සිංගප්පූරුව සහ මැලේසියාව තුළ සිදු කරන ලද ප්‍රවර්ධන කටයුතු සහ දැනුවත් කිරීම් චාරිකා හේතුවෙන් ශ්‍රී ලංකාවේ සුන්දර ස්ථාන සහ පිහිටීම ප්‍රචලිත කිරීම සම්බන්ධයෙන් SLAPCEO (Sri Lanka Association of Professional Conference Exhibition Organizer) සහ THASL (Tourist Hotel Association of Sri Lanka) සංවිධාන සාමාජිකයින් හට නව සම්බන්ධතා ඇති කර ගැනිමටද අවස්ථාව උදා විය.

## සංචාරක කටයුතු ප්‍රවර්ධනය උදෙසා ගත් පියවර

### 5.2.1 වෙළඳ සල්පිල් සඳහා සහභාගී වීම

සාම්ප්‍රදායික වෙළඳපොලට අමතරව නව වෙළඳපොල හඳුන්වා දෙමින් සංචාරක කටයුතු ප්‍රවර්ධනය වෙනුවෙන් 2013 වසරේත් සංචාරක සල්පිල් 34 ක් රටවල් 21 ක පවත්වා ඇති අතර චීනය, රුසියාව, යුක්රේනය, කසකස්ථානය, කුවේට්, සෞදි අරාබිය හා ආමේනියාව ආදී රටවල වීදී සංදර්ශන 13ක් පවත්වන ලදී. ඉන් කිහිපයක් පහත පරිදි වේ.

| වෙළඳ සල්පිල | පැවැත්වූ රට |
|---|---|
| CMT, ITB | ජර්මනිය |
| BIT | ඉතාලිය |
| MITT, Leisure | රුසියාව |
| JATA | ජපානය |
| OTM,IITM | ඉන්දියාව |

*MITT වෙළඳ සල්පිල - රුසියාව*

UITT වෙළඳ සල්පිල - සංස්කෘතික සංදර්ශනය යුක්රේනය

*CHOGM 2013 - ශ්‍රී ලංකාව*

Kunmin වීදි සංදර්ශනය - චීනය

සංචාරක වෙළඳ සල්පිල්වලට අමතරව රුසියාව, යුක්රේනය, බෙලෝරුසියාව, ඉන්දියාව හා චීනය යන රටවල මහා පරිමාණ සංචාරක ප්‍රවර්ධන වැඩසටහන් 13 ක් පවත්වා ඇත.

### 5.2.2 අන්තර්ජාතික මාධ්‍යවේදීන් සහ සුවිශේෂී පුද්ගලයින් දැනුවත් කිරීම

මේ යටතේ ඉන්දියාව, කොරියාව, චීනය, එක්සත් ජනපදය ආදී ප්‍රමුඛ පෙළේ රටවල් 29 ක මාධ්‍යවේදීන් 322 දෙනෙකු සහභාගී කරවා ගනිමින් ශ්‍රී ලංකාව පිළිබඳව දැනුවත් කිරීමේ සංචාර (FAM Tours) පවත්වා ඇත.

ඉහත වැඩසටහන්වලට අමතරව හයිඩ්‍රො ආසියානු කණ්ඩායම සහ ඉන්දියානු ප්‍රසිද්ධ සිනමා නිෂ්පාදකවරයෙකු වූ විවේක් අග්‍රාවෙල්ගේ ශ්‍රී ලංකා සංචාරය සංවිධානය කිරීම දැක්විය හැක. එම කණ්ඩායම විසින් නිෂ්පාදිත ''බොම්බේ වෙල්වට්'' සිනමා පටය ප්‍රදර්ශනය විම තුළ ශ්‍රී ලංකාවේ සුන්දරත්වය පිළිබඳ විශාල ආකර්ශණයක් ජනිතවන අතර ශ්‍රී ලංකාවට ඍජු ආදායමක් සහ ඉන්දියානු ජනතාව තුල ශ්‍රී ලංකාවේ පිහිටි සංචාරක ආකර්ෂණීය ස්ථාන පිළිබඳව සුවිසල් ප්‍රසිද්ධියක් ලැබෙනු ඇත.

### රැස්වීම්, දිරිගැන්වීම් චාරිකා, සමුළු, සම්මන්ත්‍රණ ක්ෂේත්‍රය (MICE Tourism)

සංචාරක ව්‍යාපාරය තුළ තවත් වැදගත් ක්ෂේත්‍රයක් නියෝජනය කරනු ලබන MICE සංචරණ ක්‍රියාකාරකම් ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශ විසින් සිදු කරනු ලබයි. ශ්‍රී ලංකාවට පැමිණෙන MICE සංචාරකයින්ගේ වර්ධනයක් 2013 වසරේද දක්නට ඇති අතර දළ වශයෙන් MICE සංචාරකයින් 133,832ක් පමණ පැමිණ ඇත. 2012 වසරේ පැමිණි MICE සංචාරකයින් සංඛ්‍යාව 119,560 ක් වන අතර 2012 කාල පරිච්ඡේදය හා සංසන්දනය කිරීමේදි එය 11.9% ක වර්ධනයක් වී ඇත. වර්තමානයේ සමස්ථ ලෝකය පුරාම MICE සංචරණ ව්‍යාපාරයේ දැඩි තරඟකාරිත්වයක් දක්නට ඇති අතර එලෙස පැමිණෙන සංචාරකයින්ගෙන් 75% ක් පමණ විවිධාකාර දිරිගැන්වීම් චාරිකා සහ සංස්ථාපිත රැස්වීම් සඳහා පැමිණෙන සංචාරකයින් වේ.

## පැවැත්වූ හා පැවැත්වීමට නියමිත සමුළු, සම්මන්ත්‍රණ, රැස්වීම් හා දිරිගැන්වීම් චාරිකා

| නම | කාලය |
|---|---|
| 1 ස්කල් ආසියානු කොන්ග්‍රසය | ජූනි 2013 |
| 2 කිඹුලන් සම්බන්ධ පර්යේෂණ කණ්ඩායම් රැස්වීම් | මැයි 2013 |
| 3 09 වැනි සාර්ක් කලාපීය ENT කොන්ග්‍රසය | ඔක්තෝම්බර් 2013 |
| 4 26 වැනි පොදු රාජ්‍ය මණ්ඩලීය කලාපයේ ළමා රෝග පිළිබඳ ආසියානු පැසිපික් වාර්ෂික සමුළුව | දෙසැම්බර් 2013 |
| 5 ආසියානු කලාපීය විශේෂඥ ශල්‍ය වෛද්‍ය සංගම් සමුළුව | මාර්තු 2014 |
| 6 හයිඩ්‍රො ආසියානු සමුළුව | මාර්තු 2014 |

*CIBTM - චීනය*

ශ්‍රී ලංකාව පිළිබඳව දැනුවත් කිරීම - බැංගලෝර්,

එමෙන්ම ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය විසින් මැලේසියානු බෞද්ධ සංගමය සමග ඒකාබද්ධව බෞද්ධ සමුළුවක් පවත්වන ලදි. එහි පළමු කණ්ඩායම 2013 ජූලි මස ශ්‍රී ලංකාවට පැමිණෙන ලදි. ඒ හා සම්බන්ධව චීන බෞද්ධ සංගමය සමග ඒකාබද්ධව බෞද්ධ සමුළුවක් ඉදිරි කාලයේදී පැවැත්වීමටද සැලැසුම් කර ඇත

*මැලේසියානු බෞද්ධ සමුළුව*

## 5.3 සංචාරක ක්ෂේත්‍රයේ මානව සම්පත සංවර්ධනය කිරීම

ශ්‍රී ලංකාවේ සංචාරක ක්ෂේත්‍රයේ මානව සම්පත පුහුණු කරන ප්‍රධානතම රාජ්‍ය ආයතනය වන්නේ ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය යි. කොළඹ පිහිටි ප්‍රධාන කාර්යාලයට අමතරව මහනුවර, කොග්ගල, බණ්ඩාරවෙල, අනුරාධපුරය හා රත්නපුරය යන නගරවල පිහිටි ප්‍රාදේශීය පාසල් 05 ක් ද එයට අයත් වේ. මහනුවර ඉදි කෙරුණු නව පාසලේ කටයුතු 2013 මැයි මාසයේදී ආරම්භ කරන ලදී.

මෙමගින් දේශීය විදේශීය ආගන්තුක සත්කාර ක්ෂේත්‍රයේ රැකියා අවස්ථා ඉලක්ක කර ගනිමින් වෘත්තීය මට්ටමේ ශිල්පීන් බිහි කිරීමද, දැනට හෝටල්වල සේවය කරන කාර්ය මණ්ඩලයට තවදුරටත් ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනය උදෙසා අවශ්‍ය වන දැනුම සහ පුහුණුව ලබා දීම, නව දැනුම සහිත විෂය නිර්දේශ සකස් කිරීම, ජාතික වෘත්තීය මට්ටමේ සුදුසුකම් ලබා ගැනීම සඳහා ප්‍රමිතිකරණය, ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල විෂය පාඨමාලා වැඩි දියුණු කිරීම ආදී කටයුතු සංචාරක ක්ෂේත්‍රයේ මානව සම්පත සංවර්ධනයට අදාල ප්‍රමුඛ කාර්යයන් රැසක් ඉටු කරනු ලැබීය.

ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය මගින් සංචාරක හා සත්කාරක සේවා ක්ෂේත්‍රයේ ඩිප්ලෝමා පාඨමාලා සහ කළමනාකරණ පාඨමාලා පවත්වනු ලබන අතර මහින්ද චින්තන ප්‍රතිපත්තිය යටතේ තරුණ අභිවෘද්ධි කෙටිකාලීන පාඨමාලාද 2013 වසරේදී පවත්වනු ලැබීය. මෙම වැඩසටහන තවදුරටත් ක්‍රියාත්මක තත්ත්වයේ පවතී.

**2013 වර්ෂයේ පාඨමාලා සඳහා ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව**

වගු අංක 5.3.1

| | සුපවේදී (Professional Cookery) | ආහාරපාන සේවය (Food & Beverages) | හෝටල් ගෘහපාලනය (Hotel Housekeeping) | අමුත්තන් පිළිගැනීම (Front Office Management) |
|---|---|---|---|---|
| මූලික ශිල්පීය මට්ටම | 187 | 154 | 115 | - |
| සහතිකපත් පාඨමාලාව | 438 | 421 | 377 | 362 |
| අතරමැදි (Intermdiate) පාඨමාලාවන් (කොළඹ) | 17 | 24 | 3 | 13 |
| **එකතුව** | **642** | **599** | **495** | **375** |

ඉහත ක්‍රියාකාරකම්වලට අමතරව 2013 වර්ෂයේදී හෝටල් කළමනාකරණ පාඨමාලාව සඳහා සිසුන් 116 ක් ලියාපදිංචි වූ අතර මින් 41 දෙනෙකු පාඨමාලාව සඳහා සුදුසුකම් ලබා ගන්නා ලදී. ප්‍රාදේශීය පාසල් මගින් පවත්වනු ලැබූ විශේෂ වැඩසටහන් සඳහා සිසුන් 154 ක් සුදුසුකම් ලබා ගෙන ඇත.

*ආහාර පිළියෙල කිරීමේ පාඨමාලා හදාරමින්*

හෝටල් ගෘහපාලනය පිළිබඳ පාඨමාලා හදාරමින්

# 6

# ගිණුම් , මූලය, අභ්‍යන්තර විගණන හා මානව සම්පත්

# 6. 2013 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය

## 6.1 අනුමත ප්‍රතිපාදන හා ප්‍රගතිය

2013 වසර සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයීය ශීර්ෂ 105 යටතේ ලද වාර්ෂික ප්‍රතිපාදන පහත වැඩසටහන් හා ව්‍යාපෘති සඳහා යොදවා ඇත.

වගු අංක 6.1.1

| | වැඩසටහන | ව්‍යාපෘතිය | | ප්‍රතිපාදන (රු) | |
|---|---|---|---|---|---|
| අංකය | නම | | ක්‍රියාකාරකම | පුනරාවර්තන | ප්‍රාග්ධන |
| 1 | මෙහෙයුම් ක්‍රියාකාරකම් | 1 | අමාත්‍ය කාර්යාලය | 177,320,553 | 174,778,436 |
| | | 2 | අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යාලය | 433,089,511 | 194,300,000 |
| | | 3 | ග්‍රාමීය හා ප්‍රාදේශීය පරිපාලනය | 3,550,190,000 | 12,850,000 |
| **වැඩසටහන 01 එකතුව** | | | | **4,160,600,064** | **381,928,436** |
| 2 | සංවර්ධන ක්‍රියාකාරකම් | 1 | ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධනය - ගෘහ ආර්ථිකය | 9,461,850,000 | 2,250,000,000 |
| | | 2 | ග්‍රාමීය සංවර්ධනය - ගම්මාන සවිබල ගැන්වීම | | 29,053,236,000 |
| | | 3 | නැගී එන කලාප සංවර්ධනය | | 23,518,424,000 |
| | | 4 | අන්තර් ප්‍රාදේශීය සංවර්ධනය | | 7,405,000,000 |
| | | 5 | ආයෝජන ප්‍රවර්ධනය | | 1,076,425,000 |
| **වැඩසටහන 02 එකතුව** | | | | **9,461,850,000** | **63,303,085,000** |
| **මුළු එකතුව** | | | | **13,622,450,064** | **63,685,013,436** |

## ශීර්ෂ 105 වැඩසටහන් 01 මෙහෙයුම් ක්‍රියාකාරකම්

ව්‍යාපෘති 01
අමාත්‍ය කාර්යාලය

වගු අංක 6.1.2

| වියදමේ ස්වභාවය | අනුමත ප්‍රතිපාදන රු. | වියදම රු. | ඉතිරිය රු. | වියදම් ප්‍රතිශතය % |
|---|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | | | | |
| පුද්ගල පඩිනඩි | 60,015,810 | 57,833,644 | 2,182,166 | 96 |
| අනෙකුත් පුනරාවර්තන වියදම් | 117,304,743 | 115,228,362 | 2,076,381 | 98 |
| මුළු පුනරාවර්තන වියදම | **177,320,553** | **173,062,006** | **4,258,547** | **98** |
| ප්‍රාග්ධන වියදම් | | | | |
| ප්‍රාග්ධන වත්කම් වැඩි දියුණු කිරීම පුනරුත්තාපනය හා වැඩි දියුණු කිරීම | | | | |
| ගොඩනැගිලි හා ඉදිකිරීම් | 35,455,000 | 34,006,316 | 1,448,684 | 96 |
| යන්ත්‍රෝපකරණ | 300,000 | - | 300,000 | - |
| වාහන | 3,000,000 | 2,995,725 | 4,275 | 100 |
| ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම | | | | |
| වාහන | 97,608,794 | 97,163,742 | 445,052 | 100 |
| ගෘහ භාණ්ඩ හා කාර්යාලයීය උපකරණ | 8,758,000 | 8,135,935 | 622,065 | 93 |
| යන්ත්‍රෝපකරණ | 1,000,000 | 997,400 | 2,600 | 100 |
| ගොඩනැගිලි හා ඉදිකිරීම් | 28,600,803 | 28,600,803 | - | 100 |
| කාර්ය මණ්ඩල පුහුණු කිරීම් | 55,839 | 55,839 | - | 100 |
| මුළු ප්‍රාග්ධන වියදම | **174,778,436** | **171,955,760** | **2,822,676** | **98** |
| මුළු වියදම | **352,098,989** | **345,017,766** | **7,081,223** | **98** |

පුද්ගල පඩිනඩි සඳහා වෙන්කරන ලද පුනරාවර්තන වියදම් සඳහා වන ප්‍රතිපාදන වලින් 96% ක් සහ වෙනත් වියදම් සඳහා වෙන් කරන ලද පුනරාවර්තන වියදම් වලින් සියයට 98% ක් වර්ෂය තුල වැය කර ඇත. වැඩසටහන් අංක 1 යටතේ අනුමත ප්‍රග්ධන ප්‍රතිපාදන වලින් 98% ක් 2013 වසර තුළදී භාවිතා කර ඇත.

| | රු. මි. |
|---|---|
| ඇස්තමේන්තුව | 352.0 |
| වියදම | 345.0 |
| ඉතුරුම් | 7.0 |



1 වියදම 98%
2 ඉතිරිය 2%

## ශීර්ෂ 105 වැඩසටහන් 01 මෙහෙයුම් ක්‍රියාකාරකම්

ව්‍යාපෘති 02

අමාත්‍යාංශ ප්‍රධාන කාර්යාලය

වගු අංක 6.1.3

| වියදමේ ස්වභාවය | අනුමත ප්‍රතිපාදන රු. | වියදම රු. | ඉතිරිය රු. | වියදම් ප්‍රතිශතය % |
|---|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | | | | |
| පුද්ගල පඩිනඩි | 200,688,706 | 190,923,473 | 9,765,233 | 95 |
| අනෙකුත් පුනරාවර්තන වියදම් | 232,400,805 | 223,568,882 | 8,831,923 | 96 |
| මුළු පුනරාවර්තන වියදම | **433,089,511** | **414,492,355** | **18,597,156** | **96** |
| ප්‍රාග්ධන වියදම් | | | | |
| ගොඩනැගිලි හා ඉදිකිරීම් | 1,500,000 | 1,358,781 | 141,219 | 91 |
| යන්ත්‍රෝපකරණ | 1,000,000 | 73,763 | 926,237 | 7 |
| වාහන | 4,000,000 | 3,025,785 | 974,215 | 76 |
| වාහන | 170,000,000 | 168,450,317 | 1,549,683 | 99 |
| ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ | 2,000,000 | 1,000,309 | 999,691 | 50 |
| යන්ත්‍රෝපකරණ | 9,000,000 | 8,771,464 | 228,536 | 97 |
| සංවර්ධන සහය | 5,800,000 | 2,987,626 | 2,812,374 | 52 |
| පුහුණු කිරීම් සහ හැකියා වර්ධනය | 1,000,000 | 520,340 | 479,661 | 52 |
| මුළු ප්‍රාග්ධන වියදම | **194,300,000** | **186,188,386** | **8,111,614** | **96** |
| මුළු වියදම | **627,389,511** | **600,680,741** | **26,708,770** | **96** |

පුද්ගල පඩිනඩි සඳහා වෙන්කරන ලද අනුමත ප්‍රතිපාදන වලින් 95% ක් සහ වෙනත් වියදම් සඳහා වෙන් කරන ලද පුනරාවර්තන වියදම් වලින් 96% ක් භාවිතා කර ඇත. වැඩසටහන් අංක 2 යටතේ අනුමත ප්‍රග්ධන ප්‍රතිපාදන වලින් 96% ක් මෙම වසර තුළදී භාවිතා කර ඇත

| | රු. මි. |
|---|---|
| ඇස්තමේන්තුව | 627.0 |
| වියදම | 600.0 |
| ඉතුරුම් | 27.0 |



## ශීර්ෂ 105 වැඩසටහන් අංක 01 මෙහෙයුම් ක්‍රියාකාරකම්

ව්‍යාපෘති අංක 03
ග්‍රාමීය හා ප්‍රාදේශීය පරිපාලනය

වගු අංක 6.1.4

| වියදමේ ස්වභාවය | අනුමත ප්‍රතිපාදන රු. | වියදම රු. | ඉතිරිය රු. | වියදම් ප්‍රතිශතය % |
|---|---|---|---|---|
| **පුනරාවර්තන වියදම්** | | | | |
| පුද්ගල පඩිනඩි | 3,474,440,000 | 3,474,307,882 | 132,118 | 100 |
| අනෙකුත් පුනරාවර්තන වියදම් | 75,750,000 | 52,816,110 | 22,933,890 | 70 |
| **පුනරාවර්තන වියදම එකතුව** | **3,550,190,000** | **3,527,123,991** | **23,066,009** | **99** |
| **ප්‍රාග්ධන වියදම්** | | | | |
| ගොඩනැගිලි හා ඉදිකිරීම් | 2,000,000 | 1,999,216 | 784 | 100 |
| යන්ත්‍රෝපකරණ | 300,000 | 249,980 | 50,020 | 83 |
| වාහන | 1,350,000 | 498,552 | 851,448 | 37 |
| ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ | 6,000,000 | 5,578,303 | 421,697 | 93 |
| යන්ත්‍රෝපකරණ | 2,000,000 | 1,960,718 | 39,282 | 98 |
| පුහුණු කිරීම් සහ හැකියා වර්ධනය | 1,200,000 | 1,084,450 | 115,550 | 90 |
| **ප්‍රාග්ධන වියදම් එකතුව** | **12,850,000** | **11,371,219** | **1,478,781** | **88** |
| **එකතුව** | **3,563,040,000** | **3,538,495,211** | **24,544,789** | **99** |

වැඩසටහන් අංක 01 හි ව්‍යාපෘති 3 යටතේ ඇති දිස්ත්‍රික්ක 25හි දිස්ත්‍රික් ක්‍රමසම්පාදන ලේකම් කාර්යාල වල ප්‍රදේශිය පරිපාලන වැඩසටහන් ක්‍රියාත්මක වූ අතර අනුමත ප්‍රතිපාදන, වියදම්, ඉතිරිය හා වියදම් ප්‍රතිශතය ඉහත වගුවෙන් දැක්වේ



## ශීර්ෂ 105 වැඩසටහන් 02 සංවර්ධන ක්‍රියාකාරකම්

**ව්‍යාපෘති 1**

ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධනය - ගෘහස්ථ ආර්ථිකය

වගු අංක 6.1.5

| වියදමේ ස්වභාවය | අනුමත ප්‍රතිපාදන රු. | වියදම රු. | ඉතිරිය රු. | වියදම් ප්‍රතිශතය % |
|---|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | | | | |
| ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය | | | | |
| රාජ්‍ය ආයතන | 9,320,550,000 | 9,320,550,000 | - | 100 |
| දක්ෂිණ සංවර්ධන අධිකාරිය | | | | |
| රාජ්‍ය ආයතන | 116,800,000 | 115,775,000 | 1,025,000 | 99 |
| උඩරට සංවර්ධන අධිකාරිය | | | | |
| රාජ්‍ය ආයතන | 24,500,000 | 23,275,000 | 1,225,000 | 95 |
| මුළු පුනරාවර්තන වියදම | **9,461,850,000** | **9,459,600,000** | **2,250,000** | **99** |
| ප්‍රාග්ධන වියදම් | | | | |
| දිවි නැගුම වැඩසටහන | | | - | - |
| ඉඩම් හා ඉඩම් වැඩි දියුණු කිරීම | 1,850,000,000 | 1,519,017,939 | 330,982,061 | 82 |
| ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය | | | | |
| රාජ්‍ය ආයතන | 150,000,000 | 43,119,112 | 106,880,888 | 29 |
| දක්ෂිණ සංවර්ධන අධිකාරිය | | | | |
| රාජ්‍ය ආයතන | 50,000,000 | 12,012,527 | 37,987,473 | 24 |
| උඩරට සංවර්ධන අධිකාරිය | | | | |
| රාජ්‍ය ආයතන | 25,000,000 | 22,000,000 | 3,000,000 | 88 |
| රණවිරු දිවි නැගුම වැඩසටහන | | | | |
| **On Lending** | 175,000,000 | 175,000,000 | - | 100 |
| මුළු ප්‍රාග්ධන මුදල | **2,250,000,000** | **1,771,149,578** | **478,850,422** | **79** |
| මුළු වියදම | **11,711,850,000** | **11,230,749,578** | **481,100,422** | **96** |



## ව්‍යාපෘති 2

ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධනය - ගම්මාන සවිබලගැන්වීම

වගු අංක 6.1.6

| ව්‍යාපෘතිය | වැඩසටහන | ශීර්ෂය | මූල්‍යකරණ ප්‍රභේදය | වියදමේ ස්වභාවය | අනුමත ප්‍රතිපාදන රු. | වියදම රු. | ඉතිරිය රු. | වියදම් ප්‍රතිශතය % |
|---|---|---|---|---|---|---|---|---|
| 2 | 2 | | | ප්‍රාග්ධන වියදම් | | | | |
| | 1 | 2105 | 11 | ගම නැගුම වැඩසටහන | 5,414,000,000 | 5,413,202,775 | 797,225 | 100 |
| | 2 | 2104 | 11 | සුළු වාරි මාර්ග ප්‍රතිසංස්කරණය | 198,000,000 | 197,327,749 | 672,251 | 100 |
| | 3 | 2103 | 11 | ග්‍රාමීය ප්‍රදේශවල පෙර පාසල් ප්‍රවර්ධනය කිරීම සඳහා දායකවීම | 150,000,000 | 73,891,637 | 76,108,363 | 49 |
| | 4 | 2502 | 11 | විමධ්‍යගත අයවැය වැඩසටහන | 1,125,000,000 | 1,076,493,456 | 48,506,544 | 96 |
| | 6 | 2105 | | යළි පුබුදුම් ව්‍යාපෘතිය | | | | |
| | | | 12 | | 2,475,463,000 | 2,249,584,744 | 225,878,256 | 91 |
| | | | 14 | | 450,000,000 | 442,460,296 | 7,539,704 | 98 |
| | | | 17 | | 135,000,000 | 134,268,255 | 731,745 | 99 |
| | 7 | 2105 | 12 | අඩු ආදායම්ලාභී ප්‍රජාව සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය | | | | |
| | | | 14 | | 57,000,000 | 56,839,433 | 160,567 | 100 |
| | | | 17 | | 18,185,000 | 12,585,001 | 5,599,999 | 69 |
| | 8 | 2502 | | ගැම්දිරිය ව්‍යාපෘතිය | | | | |
| | | | 12 | | 2,022,000,000 | 1,988,140,572 | 33,859,428 | 98 |
| | | | 17 | | 612,000,000 | 550,000,000 | 62,000,000 | 90 |
| | 9 | 2502 | | ලෝක ආහාර වැඩසටහන | | | | |
| | | | 16 | | 805,300,000 | 805,280,495 | 19,505 | 100 |
| | | | 17 | | 419,700,000 | 383,474,840 | 36,225,160 | 91 |
| | 11 | 2502 | 13 | නිවාස ඉදිකිරීම | 7,309,000,000 | 7,309,000,000 | - | 100 |
| | 12 | 2502 | | ග්‍රාමීය පාලම් | | | | |
| | | | 12 | | 1,394,828,000 | 1,394,827,667 | 333 | 100 |
| | | | 17 | | 44,100,000 | 43,986,530 | 113,470 | 100 |
| | 13 | 2502 | 11 | පුරනැගුම | 750,000,000 | 744,540,166 | 5,459,834 | 99 |
| | 14 | 2502 | | උතුරු නැගෙනහිර පලාත් පාලන අයතනන හා සේවා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය | | | | |
| | | | 12 | | 1,960,000,000 | 1,953,632,340 | 6,367,660 | 100 |
| | | | 17 | | 490,000,000 | 484,937,232 | 5,062,768 | 99 |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 15 | 2104 | 11 | ගංවතුරින් හා නායයෑම් හේතුවෙන් හානිවූ යටිතල පහසුකම් පුනරුත්ථාපනය කිරීම | 50,000,000 | 42,798,423 | 7,201,577 | 86 |
| | 18 | 2502 | 11 | ප්‍රාථමික හා ද්විතීයික පාසල් වැඩි දියුණු කිරීම | 1,625,000,000 | 1,583,298,478 | 41,701,522 | 97 |
| | 21 | 2502 | 13 | සංවර්ධනය ඉලක්ක කරගත් හදිසි අවස්ථා සහ සංක්‍රාන්ති ආධාරය (GIZ DETA) | 366,000,000 | 134,930,000 | 231,070,000 | 37 |
| | | | 17 | | 16,200,000 | 15,179,915 | 1,020,085 | 94 |
| | 22 | 2502 | 13 | කාර්යසාධනය නැංවීමේ ව්‍යාපෘතිය (GIZ PIP) | 500,000,000 | 249,000,000 | 251,000,000 | 50 |
| | | 2502 | 17 | | 1,500,000 | 1,289,410 | 210,590 | 86 |
| | 23 | 2502 | 13 | ළමා ආරක්ෂණ වැඩසටහන | 2,600,000 | - | 2,600,000 | - |
| | 24 | 2502 | 11 | දිරිය පියස වැඩසටහන | 400,000,000 | 355,588,551 | 44,411,449 | 89 |
| | 25 | 2502 | 11 | එල්ලෙන පාලම් | 240,000,000 | 2,386,956 | 237,613,044 | 1 |
| | 26 | 2105 | 13 | ඉඩම් හා ඉඩම් සංවර්ධනය | 3,000,000 | 1,396,164 | 1,603,836 | 47 |
| | 27 | 2502 | 11 | ග්‍රාමීය ප්‍රජාවගේ සෞඛ්‍ය පහසුකම් වැඩි දියුණු කිරීම | 10,000,000 | 1,185,236 | 8,814,764 | 12 |
| | 35 | 2502 | 13 | ගම්පහ දිස්ත්‍රික්කයේ අත්යන්ත්‍ර රෙදිපිලි නිෂ්පාදකවරුන්ගේ ජීවන තත්වය ඉහල නැංවීම ( Pakisthan) | 9,360,000 | 1,116,575 | 8,243,425 | 12 |
| | | | | **එකතුව** | **29,053,236,000** | **27,702,642,897** | **1,350,593,103** | **95** |



**ව්‍යාපෘති 3**

**නැගී එන කලාප සංවර්ධනය**

වගු අංක 6.1.7

| ව්‍යාපෘතිය | වැඩසටහන | ශීර්ෂය | | වියදමේ ස්වභාවය | අනුමත ප්‍රතිපාදන රු. | වියදම රු. | ඉතිරිය රු. | වියදම් ප්‍රතිශතය % |
|---|---|---|---|---|---|---|---|---|
| | 1 | 2502 | 11 | උතුරු වසන්තය | 650,000,000 | 274,063,391 | 375,936,609 | 42 |
| | 2 | 2502 | | ගැටුම් වලින් හානියට පත් ප්‍රදේශ සංවර්ධනය කිරීමේ හදිසි ව්‍යාපෘතිය | | | | |
| | | | 12 | | 5,753,000,000 | 5,751,202,864 | 1,797,136 | 100 |
| | | | 13 | | 106,000,000 | 37,877,030 | 68,122,970 | 36 |
| | | | 17 | | 750,000,000 | 628,303,687 | 121,696,313 | 84 |
| | 3 | 2502 | | උතුරු හදිසි ප්‍රතිපාදන ව්‍යාපෘතිය | | | | |
| | | | 12 | | 1,720,392,000 | 1,435,782,999 | 284,609,001 | 83 |
| | | | 17 | | 2,000,000 | 1,679,392 | 320,608 | 84 |
| | 4 | 2502 | | උතුරු පළාත් අභ්‍යන්තර අවතැන් වුවන් හා පදිංචි කළ ජන කොට්ඨාශ වල ජීවනෝපය නැවත ස්ථාපිත කිරීම සඳහා වන හදිසි සහන ව්‍යාපෘතිය | | | | |
| | | | 13 | | 136,000,000 | 135,860,409 | 139,591 | 100 |
| | | | 17 | | 9,000,000 | 4,972,043 | 4,027,957 | 55 |
| | 5 | 2502 | | බිම් බෝම්බ අවධානය පිළිබඳ අධ්‍යාපන වැඩසටහන | | | | |
| | | | 13 | | 2,000,000 | 1,286,904 | 713,096 | 64 |
| | **6** | 2105 | 13 | ජාතික බිම් බෝම්බ ඉවත් කිරීමේ වැඩසටහන (GOSL-UNDP) | 4,000,000 | 3,628,844 | 371,156 | 91 |
| | 11 | 2502 | 11 | නැගෙනහිර නවෝදය | 212,000,000 | 211,311,275 | 688,725 | 100 |
| | 14 | 2502 | | උතුරු නැගෙනහිර ප්‍රජා ප්‍රතිසාධන හා සංවර්ධන ව්‍යාපෘතිය | | | | |
| | | | 12 | | 94,678,000 | 94,674,865 | 3,135 | 100 |
| | 16 | 2502 | 17 | MANRIP - මන්නාරම් දිස්ත්‍රික්කය වැඩි දියුණු කිරීම - ව්‍යාපෘතිය | 1,815,000 | 1,814,176 | 824 | 100 |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 17 | 2502 | 11 | සඹරගමුව අරුණාලෝකය | 1,700,000,000 | 1,684,196,203 | 15,803,797 | 99 |
| | 18 | 2502 | 11 | රජරට නවෝදය | 1,735,000,000 | 1,645,827,964 | 89,172,036 | 95 |
| | 19 | 2502 | 11 | කදුරට උදානය | 1,739,239,000 | 1,660,939,332 | 78,299,668 | 95 |
| | 20 | 2502 | 11 | වයඹ පුබුදුව | 1,910,000,000 | 1,866,719,458 | 43,280,542 | 98 |
| | 21 | 2502 | 11 | පුබුදමු වෙල්ලස්ස | 1,640,000,000 | 1,637,067,153 | 2,932,847 | 100 |
| | 22 | 2502 | 11 | බටහිර රන් අරුණ | 3,050,000,000 | 2,714,930,108 | 335,069,892 | 89 |

වගු අංක 6.1.8

| ව්‍යාපෘතිය | වැඩසටහන | ශීර්ෂය | | වියදමේ ස්වභාවය | අනුමත ප්‍රතිපාදන රු. | වියදම රු. | ඉතිරිය රු. | වියදම් ප්‍රතිශතය % |
|---|---|---|---|---|---|---|---|---|
| | 24 | 2502 | 11 | රුහුණු උදානය | 2,285,000,000 | 2,046,978,790 | 238,021,210 | 90 |
| | 28 | 2104 | 13 | ගොඩනැගිලි හා ඉදිකිරීම් (අක්ෂා සලම්බායිකුලම් පාසල) | 11,700,000 | 10,800,000 | 900,000 | 92 |
| | 29 | 2502 | 13 | සෙමාඋල් උන්ඩොන්ග් ව්‍යාපෘතිය | 6,600,000 | 5,374,865 | 1,225,135 | 81 |
| | | | | **එකතුව** | **23,518,424,000** | **21,855,291,753** | **1,663,132,247** | **93** |



## ශීර්ෂ 105 වැඩසටහන් 02 සංවර්ධන ක්‍රියාකාරකම්

**ව්‍යාපෘති 4**

අන්තර් ප්‍රදේශ සංවර්ධනය

වගු අංක 6.1.9

| ව්‍යාපෘතිය | වැඩසටහන | ශීර්ෂය | | වියදමේ ස්වභාවය | අනුමත ප්‍රතිපාදන රු. | වියදම රු. | ඉතිරිය රු. | වියදම් ප්‍රතිශතය % |
|---|---|---|---|---|---|---|---|---|
| **2** | 4 | | | | | | | |
| | 1 | 2502 | 11 | ප්‍රාදේශීය තුලනාත්මක සංවර්ධන මූලාරම්භයන් | 2,780,000,000 | 2,758,821,634 | 21,178,366 | 99 |
| | 2 | 2103 | 11 | සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා උපකරණ | 4,075,000,000 | 3,976,652,827 | 98,347,173 | 98 |
| | 3 | 2001 | 1 | අත්හැර දමන ලද වැඩ නිම නොකළ පොදු දේපළ ප්‍රතිසංවර්ධනය | 300,000,000 | 80,558,663 | 219,441,337 | 27 |
| | 4 | 2502 | 11 | අන්තර් ප්‍රාදේශීය පොදු පහසුකම් | 250,000,000 | 249,656,918 | 343,082 | 100 |
| | | | | **එකතුව ( 105-02-04-2103-2502)** | **7,405,000,000** | **7,065,690,042** | **339,309,958** | **95** |



**ව්‍යාපෘති 5**
**ආයෝජන ප්‍රවර්ධනය**

වගු අංක 6.1.10

| ව්‍යාපෘතිය | වැඩසටහන | ශීර්ෂය | | වියදමේ ස්වභාවය | අනුමත ප්‍රතිපාදන රු. | වියදම රු. | ඉතිරිය රු. | වියදම් ප්‍රතිශතය % |
|---|---|---|---|---|---|---|---|---|
| | 1 | 2502 | 11 | සංචාරක ප්‍රවර්ධනය | 100,000,000 | 66,269,461 | 33,730,539 | 66 |
| | 2 | 2502 | 12 | තිරසාර සංචාරක සංවර්ධන ව්‍යාපෘතිය | 11,000,000 | 10,500,668 | 499,332 | 95 |
| | 3 | 2502 | | සංචාරක සම්පත් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය | | | | |
| | | | 12 | | 892,425,000 | 886,951,791 | 5,473,209 | 99 |
| | | | 17 | | 73,000,000 | 72,779,335 | 220,665 | 100 |
| | | | | **එකතුව ( 105-02-05-2502)** | **1,076,425,000** | **1,036,501,256** | **39,923,744** | **96** |



## 6.2 රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් '' බී'' ගිණුම

2013 වර්ෂයේදී අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යාලය හා දිස්ත්‍රික් කාර්යාල වලට අනුයුක්තව සේවය කරනු ලබන නිලධාරින්ගෙන් 3157 දෙනෙක් '' රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් '' බී'' ගිණුම '' යටතේ ණය ලබා ගෙන ඇත.

අංක 105011 අංක දරණ රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් '' බී'' ගිණුමේ වර්ෂයට අනුමත සීමා සහ සත්‍ය ශේෂයන් පහත පරිදිය.

| | අනුමත සීමාව (රු.) | සත්‍ය මුදල (රු.) |
|---|---|---|
| උපරිම හර සීමාව | 120,000,000 | 102,751,135 |
| අවම බැර සීමාව | 57,000,000 | 76,247,386 |
| උපරිම හර ශේෂ සීමාව | 460,000,000 | 309,940,617 |

2013 වර්ෂයේ ණය නිකුත් කිරීම් සාරාංශය පහත දැක්වේ

| ණය වර්ගය | නිලධාරින් සංඛ්‍යාව | මුදල (රු.) |
|---|---|---|
| ආපදා ණය | 918 | 75,470,372 |
| උත්සව අත්තිකාරම් | 1998 | 9,990,000 |
| අනෙකුත් ණය | 241 | 1,290,689 |
| මුළු මුදල | 3157 | 86,751,061 |

### වාර්ෂික ගිණුම් ඉදිරිපත් කිරීම

2013 වර්ෂය සඳහා රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් '' බී'' ගිණුම සඳහා වූ කේවල ශේෂ සැසඳීම් ප්‍රකාශය නියමිත ආකෘතියට අනුව සකස් කර 2014 අප්‍රේල් 10 වන දින විගණකාධිපති වෙත ඉදිරිපත් කරන ලදි.

2013 වර්ෂය තුළ සම්පූර්ණ කරන ලද විගණන හා විමර්ශන කටයුතු පහත පරිදි වේ.

වගු අංක 6.2.1

| අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව/ ආයතනය | නිකුත් කළ විගණන විමසුම් ගණන |
|---|---|
| ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 24 |
| උඩරට සංවර්ධන අධිකාරිය | 21 |
| දක්ෂිණ සංවර්ධන අධිකාරිය | 0 |
| ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය | 13 |
| ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය | 9 |
| ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යංශය | 13 |
| ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය | 5 |
| ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය | 17 |
| ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | 84 |
| සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව | 11 |
| උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුව | 4 |
| **එකතුව** | **201** |

## 6.3 අභ්‍යන්තර විගණන හා විමර්ශන අංශය

### කාර්ය සාධනය

මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ සුපරීක්ෂාව යටතේ වර්ෂය ආරම්භයේ දී සම්පාදනය කරනු ලබන විගණන වැඩසටහනට අනුකූලව අභ්‍යන්තර විගණන කටයුතු මෙහෙයවන ලදී. අභ්‍යන්තර විගණන අංශයක් නොමැති අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු හා ආයතනද ඇතුලත් වන පරිදි මෙම මෙහෙයුම් කටයුතු ක්‍රියාත්මක කර ඇත.

### විගණන හා විමර්ශන කටයුතු

**2013 වර්ෂය තුළ සම්පූර්ණ කරන ලද විගණන හා විමර්ශන කටයුතු පහත පරිදි වේ.**

වගු අංක 6.3.1

| අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව/ ආයතනය | නිකුත් කළ විගණන විමසුම් ගණන | මෙහෙය වන ලද විශේෂ විමර්ශන හා පෙත්සම් විමර්ශන ගණන |
|---|---|---|
| ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 17 | 5 |
| ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය | | 2 |
| ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය | 1 | - |
| ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය | - | 2 |
| මුළු එකතුව | 18 | 9 |

2013 අංක 1 දරන දිවිනැඟුම පනත යටතේ පිහිටුවීමට නියමිත දිවිනැඟුම සංවර්ධන දෙපාර්තමේන්තුවට පවරා ගැනීමට නියමිත ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය, ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය, සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව හා උඩරට ගැමි පුනරුත්තාපන දෙපාර්තමේන්තුවේ වත්කම් හා බැරකම් විමර්ශනය කිරීම සහ වාර්තා කිරීම සඳහා විශේෂ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී.

මීට අමතරව අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවල වාර්ෂික ගබඩා හා වත්කම් සමීක්ෂණ කටයුතුවලටද විශේෂ දායකත්වයක් ලබා දී ඇත.

## විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්

සාමාන්‍ය විගණන කටයුතුවලට අතිරේකව 2013 වර්ෂය තුළ පවත්වන ලද විගණන හා කළමනාකරන කමිටු රැස්වීම් පහත පරිදි වේ.

| දිනය | ආයතනය |
|---|---|
| 2013.04.30 | අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතට ගැනෙන සියලුම දෙපාර්තමේන්තු |
| 2013.09.05 | අමාත්‍යාංශය, අමාත්‍යාංශය යටතට ගැනෙන සියලුම දෙපාර්තමේන්තු හා ආයතන |
| 2013.12.19 | අමාත්‍යාංශය, අමාත්‍යාංශය යටතට ගැනෙන සියලුම දෙපාර්තමේන්තු හා ආයතන |

## අභ්‍යන්තර විගණන අංශයේ සංයුතිය

අභ්‍යන්තර විගණන අංශයේ කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත පරිදි වේ.

| තනතුර | අනුමත කාර්ය මණ්ඩලය | දැනට සිටින කාර්ය මණ්ඩලය |
|---|---|---|
| ප්‍රධාන අභ්‍යන්තර විගණක | 01 | 01 |
| අභ්‍යන්තර විගණක | 02 | 01 |
| විගණන සහකාර | 31 | 11 |
| කා.කා.ස. | 01 | 01 |
| එකතුව | 35 | 14 |

## 6.4 අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය පාලනය

පුළුල් විෂය පථයක් ඇති මෙම අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටුකිරීම සඳහා ගරු අමාත්‍යතුමා ප්‍රධාන කොට ගෙන ගරු නියෝජ්‍ය අමාත්‍යතුමන්ලා 04 දෙනෙකු යටතේ කලාප 05 කට බෙදා දිවයින පුරා දිවි නැගුම හා සමගාමී වෙනත් සංවර්ධන ක්‍රියාදාමයන් ක්‍රියාත්මක කරනු ලැබේ. එසේම අමාත්‍යාංශ ලේකම්තුමා යටතේ අතිරේක ලේකම්වරු හතර දෙනෙකු පත් කර ඇති අතර, අධ්‍යක්ෂ ජනරාල්වරුන් පස් දෙනෙක් වෙති. ඒ යටතේ අධ්‍යක්ෂවරු, නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ, ඉංජිනේරු, ප්‍රධාන ගණකාධිකාරී, ගණකාධිකාරී, සහකාර ලේකම් අමාත්‍යාංශයේ කාර්යභාරය මෙහෙයවීම සඳහා පත් කර ඇති අතර, ඔවුන් යටතේ අනෙකුත් සියළුම කාර්ය මණ්ඩලය පත් කර ඇත.

2013 දෙසැම්බර් අවසාන වන විට ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

වගු අංක 6.4.1

| සේවක කණ්ඩායම් | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|
| 1. ජ්‍යෙෂ්ඨ මට්ටම | 747 | 628 | 119 |
| 2. තෘතීය මට්ටම | 17 | 9 | 8 |
| 3. ද්විතීය මට්ටම | 18168 | 17091 | 1077 |
| 4. ප්‍රාථමික මට්ටම | 253 | 216 | 37 |
| **එකතුව** | **19185** | **17944** | **1241** |

## 6.5 මානව සම්පත් කළමනාකරණය

### විදේශීය පුහුණු වැඩසටහන්

2013 වර්ෂයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව මගින්, විවිධ ව්‍යාපෘති මගින් හා වෙනත් ආයතන මගින් අමාත්‍යාංශය වෙත ලබා දුන් විදේශ පුහුණු සඳහා අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශය යටතේ පවත්නා දෙපාර්තමේන්තු හා ආයතනවල නිලධාරීන් සහභාගී විය. මෙම පුහුණු ආර්ථික සංවර්ධනය, ප්‍රාදේශීය සංවර්ධනය, ග්‍රාමීය සංවර්ධනය, සංචාරක කර්මාන්තය, කෘෂි කර්මාන්තය, වාණිජ හා මූල්‍ය, හැකියා වර්ධනය, නායකත්ව සංවර්ධනය, ඉදිකිරීම් කළමනාකරණය හා දිළිඳුකම දුරලීම යන ක්ෂේත්‍ර යටතේ ලැබුණු අතර, ඒවා දීර්ඝ කාලීන හා කෙටි කාලීන පුහුණු වැඩසටහන් වේ.

විදේශ පුහුණු සඳහා 2013 වර්ෂයේ සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව පහත පරිදි වේ.

| | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|
| විදේශ සම්පත් දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලැබූ විදේශ පුහුණු | 43 |
| ව්‍යාපෘති හා වෙනත් ආයතන මගින් පවත්වනු ලැබූ විදේශ පුහුණු | 26 |

## දේශීය පුහුණු වැඩසටහන්

අමාත්‍යාංශය යටතේ සේවයේ නියුතු නිලධාරීන්ගේ සේවා ව්‍යවස්ථා අනුව හා සේවා අවශ්‍යතා මත පශ්චාත් උපාධි පාඨමාලා හැදෑරීමට වැය වූ පාඨමාලා ගාස්තු ලබා ගැනීම සඳහා කර ඇති ඉල්ලීම අනුව, ප්‍රතිපාදන සීමාව තුළ ඉල්ලුම් කළ මුදලින් 50% ක් මූලික වශයෙන් ද පාඨමාලාව අවසානයේ නිකුත් කළ උපාධි සහතික පත්‍රය ඉදිරිපත් කිරීමෙන් පසුව ඉතිරි 50% ද ලබාදෙනු ලැබේ. තවද ඩිප්ලෝමා හා සහතික පත්‍ර පාඨමාලාවන් සඳහා ද ඉල්ලීම් පරිදි හා ප්‍රතිපාදන සීමා තුළ ප්‍රතිපාදන ලබා දී ඇත. 2013 වර්ෂය තුළ ප්‍රතිපාදන ලබා දී ඇති එම පාඨමාලා පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

| | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|
| පශ්චාත් උපාධි පාඨමාලා/ඩිප්ලෝමා | 40 |
| වෙනත් දේශීය පුහුණු පාඨමාලා | 7 |

මෙම පාඨමාලාවලට අමතරව 2013 වර්ෂයේ දී අමාත්‍යාංශයේ සේවය කරන නිලධාරීන් 37 දෙනෙක් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මගින් පවත්වනු ලබන කෙටි කාලීන පුහණු පාඨමාලා සඳහා සහභාගී වී ඇති අතර, විවිධ ආයත මගින් නොමිලේ සංවිධානය කරනු ලබන පාඨමාලා හා දැනුවත් කිරීම් සඳහා නිලධාරීන් 14 දෙනෙකු සහභාගී වී ඇත.

## භාෂා හැකියාව පිළිබඳ පුහුණු වැඩසටහන්

2013 වර්ෂයේ අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයෙහි දෙවන භාෂා හැකියා වර්ධනය කිරීම සඳහා ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය මගින් පවත්වනු ලබන දෙමළ භාෂා III මට්ටම පුහුණු පාඨමාලාවක් නිලධාරීන් 63 කගේ සහභාගීත්වයෙන් ආරම්භ කරන ලදි. මෙම පාඨමාලාව 2014 වර්ෂයේ අප්‍රේල් මස අවසන් වීමට නියමිතව ඇත.

## මානව සම්පත් පිළිබඳ විශේෂ ව්‍යාපෘති

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය හා ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය මගින් අනුයුක්තව සේවය කරන කාන්තා කේන්ද්‍රීය නිලධාරිණියගේ සම්බන්ධීකරණ දායකත්වයෙන් 2013 වර්ෂයේ දී අමාත්‍යාංශය තුළ විවිධ වැඩ සටහන් ක්‍රියාත්මක කරන ලදි.

එහිදී සියළුම නිලධාරි මහත්ම මහත්මීන්ගෙන් කාර්යක්ෂම රාජ්‍ය සේවාවක් ලබාගැනීමේ මූලික අරමුණ ඇතිව එදිනෙදා ජීවිතයේ දී ප්‍රයෝජනවත් වන ආකාරයේ දැනුවත් කිරීමේ හා කායික මානසික

ආතතිය අවම කිරීම සඳහා පහත දක්වා ඇති වැඩසටහන් පවත්වන ලදි.

- ළමා රැකවරණය හා ආරක්ෂාව.
- සුබෝධ්‍යා.
- පෝෂණයේ ඇති වැදගත්කම.
- ධනාත්මක චින්තනය තුළින් මානසික ආතතිය අවම කිරීම හා ඵලදායිතාවය ඉහළ නැංවීම.
- ළමා අපයෝජනය වලක්වා ගනිමු.
- ප්‍රීතිමත් පවුල් ජීවිතයක රහස.
- ළමා පෞරුෂත්ව සංවර්ධන වැඩසටහන.

## 6.6 වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම

අමාත්‍යාංශයේ මාධ්‍ය අංශය මගින් අමාත්‍යාංශ වෙබ් අඩවිය යාවත්කාලීන කර ගෙන යනු ලැබේ. මේ වන විට අනුමත බඳවා ගැනීමේ පරිපාටි හා අනුමත උසස් කිරීමේ පරිපාටි 11 ක් අමාත්‍යාංශ වෙබ් අඩවියේ පළ කර ඇත.

## 6.7 සුභ සාධක සංගමයේ ක්‍රියාකාරීත්වය

2013 වර්ෂයේ ජුනි මස 01 දින අමාත්‍යාංශයේ සුභසාධක සංගමය ආරම්භ කරන ලද අතර, සාමාජිකයන්ගේ යැපෙන්නන් සඳහා මරණාධාර ලබාදීම, ප්‍රදර්ශණ හා අලෙවි සැල් පැවැත්වීම මගින් සහන මිලට සාමාජිකයන්ට භාණ්ඩ හා උපකරණ ලබාදීම මෙහි අරමුණ විය. සාමාජිකයන් 400 කින් යුක්ත වූ සංගමයේ සාමාජිකයන් හඳුනා ගැනීමට හා සුහදත්වය වර්ධනය කිරීමේ අරමුණින් සුහද හමුවක් සංවිධානය කිරීම, සාහිත්‍ය මාසය වෙනුවෙන් සාමාජිකයන්ගේ දක්ෂතා එලිදැක්වීම සඳහා සාහිත්‍ය තරඟයක් හා දේශනයක්, නත්තල් උත්සවය වෙනුවෙන් නත්තල් ප්‍රසංගයක් හා සාමාජික සුහදත්වය වර්ධනය කිරීම සඳහා ක්‍රිකට් තරඟාවලියක් පවත්වන ලදි. එසේම සාමාජිකයන්ගේ ආර්ථික දුෂ්කරතා මඟහරවා ගැනීම සඳහා සහන පොලියක් යටතේ රු. 10,000/- ක ණය මුදලක් ලබාදීමට ද කටයුතු සලසා ඇත.

# 7

# විගණකාධිපති විමසුම් හා නිරීක්ෂණ

## 7. විගණකාධිපති විමසුම් හා නිරීක්ෂණ

දිවයිනේ ආර්ථික සංවර්ධනයට ඉවහල් වන ගෘහ ආර්ථිකය ශක්තිමත් කිරීම, ග්‍රාමීය ප්‍රදේශවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම, අධ්‍යාපනයේ භෞතික මෙන්ම ගුණාත්මක සංවර්ධනය ඇතිකිරීම, පුද්ගලයන්ගේ ජීවන තත්වය සංවර්ධනය කිරීම, සුළු වාරිමාර්ග හා පුරන් කුඹුරු සංවර්ධනය තුලින් කෘෂි ආර්ථිකය ශක්තිමත් කිරීම හා මාතෘ සහ ළමා සායන මධ්‍යස්ථාන , සතිපොළ, බස්නැවතුම් පොළ, වාරිමාර්ග ප්‍රතිසංස්කරණය ආදී කාර්යයන් ඉටුකිරීම මෙම අමාත්‍යාංශයට පැවරී ඇත.අමාත්‍යාංශ ප්‍රධාන කාර්යාලය මගින් සංවර්ධන ව්‍යාපෘති වලට අදාල ප්‍රතිපත්ති පරිපාලනය, මූල්‍ය පාලනය සිදුකරනු ලබන අතර දෙපාර්තමේන්තු හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් එම සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සිදුකරනු ලබයි. මෙම සංවර්ධන කටයුතු පිළිබඳව විගණකාධිපති විසින් දෙපාර්තමේන්තු, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා අමාත්‍යාංශ මට්ටමින් විගණනය සිදු කෙරෙන අතර අමාත්‍යාංශයට අනුයුක්ත රජයේ විගණන ඒකකය විසින් අමාත්‍යාංශ කටයුතු විගණනය සිදුකරනු ලබයි.

2013 වර්ෂය සඳහා අමාත්‍යාංශ කාර්යාලය වෙනුවෙන් විගණන විමසුම් 26 ක් ඉදිරිපත් කර ඇත (ඇමුණුම 01). සියළුම විගණන විමසුම් සඳහා පිළිතුරු හා පැහැදිලි කිරීම් විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත.

අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රතිපාදන යොදාගනිමින් දිස්ත්‍රික් ලේකම්වරුන් හරහා සිදුකරනු ලබන සංවර්ධන ව්‍යාපෘති වලට අදාලව විගණන විමසුම් 111 ක සංඛ්‍යාවක් දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත ලැබී ඇති අතර අතර එම විගණන විමසුම් වලින් නිරීක්ෂණය කර ඇති කරුණු නිවැරදි කිරීමට හා ඉදිරියේදී එවැනි දෑ ඇති නොවීම සඳහා අවශ්‍ය ක්‍රමවේදයක් සකස් කර ක්‍රියාත්මක කිරීමට අප්‍රමාදව පියවර ගන්නා ලෙස දිස්ත්‍රික් ලේකම්වරුන් දැනුවත් කර ඇත.

ඇමුණුම 01

වගු අංක 7.1.1

| අනු අංකය | විගණන විමසුම් අංකය | විෂයය | ලැබුන දිනය | විගණකාධිපති වෙත පිළිතුරු යැවූ දිනය | පැහැදිලි කිරීම |
|---|---|---|---|---|---|
| 1 | වයිඑස්/සි/එම්ඊඩී/2012/වි.06 | ආරක්ෂක සේවාවන් ලබා ගැනීම පිළිබඳ පරීක්ෂාව | 2013.01.07 | 2013.03.11 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ 445 හි ඡේද 3ට අනුවකටයුතු කර ඇති බව දැනුවත් කර ඇත |
| 2 | වයිඑස්/සි/එම්ඊඩී/2012/වි.07 | ලෝක ආහාර වැඩ සටහන ගෙවීම් වවවර් පරීක්ෂාව 2012 ජනවාරි-ඔක්තෝබර් | 2013.02.21 | 2013.05.15 | පෙන්වා දුන් අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කරන ලදී |
| 3 | වයිඑස්/සි/එම්ඊඩී/2012/වි.09 | අග්‍රිම ගිණුම පරීක්ෂාව -2012 | 2013.02.28 | 2013.03.28 | මු.රෙ. අනුව කටයුතු කිරීමට නිළධාරීන් දැනුවත් කරන ලදී. |
| 4 | වයිඑස්/සි/එම්ඊඩී/2012/වි.10 | විදේශ ගමන් වියදම් පරීක්ෂාව 2012 | 2013.02.28 | 2013.03.28 | නිවැරදි කිරීම් සිදුකර ඇත. |
| 5 | වයිඑස්/සි/එම්ඊඩී/2012/වි.08 | දිවිනැගුම වැඩ සටහන යටතේ පශු සම්පත් සහ ධීවර කටයුතු සඳහා වෙනත් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු වෙත ලබා දෙන ලද ප්‍රතිපාදන පිළිබඳ පරීක්ෂාව-2012 | 2013.03.06 | 2013.04.30 | ප්‍රතිපාදන ඉතිරිවීම් සඳහා පැහැදිලි කිරීම් ඉදිරිපත් කර ඇත |
| 6 | වයිඑස්/සි/එම්ඊඩී/2012/වි.11 | ගම්පහ රන් අරුණ ග්‍රාමීය මාර්ග පැති බැමි ඇවිදින මංතීරු සහ ඇල වේලි ඉදි කිරීම හා නඩත්තුව පිළිබඳ පරීක්ෂාව | 2013.04.09 | 2013.05.22 | අදාල පැහැදිලි කිරීම් ඉදිරිපත් කර ඇත |
| 7 | වයිඑස්/සි/එම්ඊඩී/2012/වි.12 | ගැටුම්වලින් හානියට පත් ප්‍රදේශවල හදිසි අවශ්‍යතා ව්‍යාපෘතියේ ඉංජිනේරු සහකාර තාක්ෂණ නිළධාරී ලෙසකටයුතු කරන ආර්.එම්.ජේ.රත්නායක මහතාගේ අධ්‍යාපන සුදුසුකම් හා සේවා පලපුරුද්ද පිළිබඳ පරීක්ෂාව | 2013.04.26 | 2013.05.06 | පැහැදිලි කිරීම් ඉදිරිපත් කර ඇත |
| 8 | වයිඑස්/සි/එම්ඊඩී/2012/වි.ගිනුම | විසර්ජන ගිණුම 2012-වියදම් ශීර්ෂය 105 | 2014.04.26 | 2013.05.14 | ඇස්තමේන්තුවල ඉතිරිවීම් සඳහා පැහැදිලි කිරීම් ඉදිරිපත් කර ඇත. |
| 9 | වයිඑස්/සි/එම්ඊඩී/2012/ඒකෘ/13 | වාහන පරිපාලනය හා නඩත්තුව පිළිබඳ පරීක්ෂාව | 2013.05.03 | 2013.05.21 | අදාල නිලධාරීන් දැනුවත් කර නිවැරදි කිරීම් සිදුකරන ලදී. |
| 10 | වයිඑස්/සි/එම්ඊඩී/2012/වි.14 | කළුතර දිස්ත්‍රික්කයේ දිවි නැගුම ව්‍යාපෘතිය මූල්‍ය හා භෞතික පරීක්ෂාව-2012 | 2013.05.13 | 2013.09.26 | මූල්‍ය හා භෞතික පරීක්ෂාව පිළිබඳ විස්තරාත්මක පැහැදිලි කිරීම් ඉදිරිපත් කර ඇත |
| 11 | වයිඑස්/සි/එම්ඊඩී/2012/වි.15 | මාර්ග ඉදිකිරීම් සඳහා යන්ත්‍ර පිරියත සහ උපකරණ ආනයනය කිරීම-2012 | 2013.05.13 | 2013.09.25 | අදාල ආයතන දැනුවත් කර ඇත.නිවැරදි කිරීමට පියවර ගන්නා ලෙස උපදෙස් ලබාදී ඇත |
| 12 | වයිඑස්/සි/එම්ඊඩී/2012/වි.16 | වැටුප් රහිත මෙරට අධ්‍යන නිවාඩු අනුමත කිරීම (ජී.එල්.සි.ඩී.ද සිල්වා මහතා) | 2013.05.27 | 2013.06.20 | රාජකාරි අවශ්‍යතාවය මත පාඨමාලාව සම්පූර්ණ කර ගැනීම සඳහා නිවාඩු අනුමත කර ඇත |
| 13 | වයිඑස්/සි/එම්ඊඩී/2012/වි.17 | සංවර්ධන සහකාර එච්.එම්.එස්.ජයරත්න මහතාගේ සහ ඉංජිනේරු කේ.ඉලංගෝ මහතාගේ නිවාඩු පිළිබඳ පරීක්ෂාව | 2013.06.18 | 2013.08.01 | අදාල හිඟ වැටුප් අයකර ඇති අතර නීතිමය පියවර ගෙන ඇත |
| 14 | එම්ඊඩී/රනිඅගි/2012/ඒකෘ/18 | රජයේ නිළධාරීන්ට අත්තිකාරම් ගිණුම පරීක්ෂාව-2012 | 2013.07.01 | 2013.07.19 | අවශ්‍ය පැහැදිලි කිරීම් ඉදිරිපත් කර ඇත |
| 15 | වයිඑස්/සි/එම්ඊඩී/2012/වි.19 | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශ ගොඩනැගිල්ලේ 2013 වර්ෂයට කුලී ගෙවීම පරීක්ෂාව | 2013.07.12 | 2013.07.31/2013.09.17 | අවශ්‍ය පැහැදිලි කිරීම් ඉදිරිපත් කර ඇත |
| 16 | වයිඑස්/සි/එම්ඊඩී/2013/වි.01 | ග්‍රාමීය පාලම් ව්‍යාපෘතිය හා සම්බන්ධ ලිපිගොනු පරීක්ෂාව | 2013.10.01 | 2013.10.22 | අවශ්‍ය පැහැදිලි කිරීම් ඉදිරිපත් කර ඇත |
| 17 | වයිඑස්/සි/එම්ඊඩී/2013/වි.02 | ගරු ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය සුසන්ත පුංචිනිලමේ මැතිතුමාගේ නිලනිවසට වායුසමීකරණ යන්ත්‍ර සවිකිරීම | 2013.09.09 | 2013.10.09 | වායුසමීකරණ යන්ත්‍ර නියමිත පරිදි ඉන්වෙන්ට්‍රි ගත කර ඇති අතර අදාල පැහැදිලි කිරීම් ඉදිරිපත් කර ඇත |
| 18 | වයිඑස්/සි/එම්ඊඩී/2013/වි.03 | අමාත්‍යාංශ නිළධාරීන්ට සංනිවේදන පහසුකම් සැපයීම හා බිල්පත් නිරවුල් කිරීම පිළිබඳ පරීක්ෂාව | 2013.09.26 | 2013.10.15 | අදාල පැහැදිලි කිරීම් ලබාදී ඇති අතර නිවැරදි කිරීමටද පියවර ගෙන ඇත |
| 19 | වයිඑස්/සි/එම්ඊඩී/2013/තොරතුරු/04 | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් යන්ත්‍රෝපකරණ මිලදී ගැනීමට අදාල වාරික ගෙවීම පිළිබඳ පරීක්ෂාව | 2013.10.04 | 2013.10.28 | අවශ්‍ය පැහැදිලි කිරීම් ඉදිරිපත් කර ඇත |
| 20 | වයිඑස්/සි/එම්ඊඩී/2013/වි.05 | උතුරේ අවතැන් වූ පවුල් සඳහා නිවාස තැනීමට ලබාදීන් ආධාර මුදල් පිළිබඳ පරීක්ෂාව | 2013.10.30 | 2013.11.27 | අවශ්‍ය පැහැදිලි කිරීම් සහ නිවැරදි කිරීම් සඳහා ඉදිරි ක්‍රියාමාර්ග ඉදිරිපත් කර ඇත |
| 21 | යුවී/එමජි/02/2013/73 | වාහන සම්බන්ධ පරීක්ෂාව-දිස්ත්‍රික් ක්‍රමසම්පාදන කාර්යාලය-මොණරාගල | 2013.11.14 | 2014.04.08 | නිෂ්ක්‍රියව පවතින වාහන අළුත්වැඩියා කිරීමටත් හානි වූ හා පැරණි වාහන සඳහා අවශ්‍ය කටයුතු සිදුකිරීමටත් පියවර ගෙන ඇත |

| | | | | | |
|---|---|---|---|---|---|
| 22 | වයිඑස්/ඕ/එම්ටීඩී/2013/වි.07 | 2012- දැයට කිරුළ ජාතික ප්‍රදර්ශණයට සමගාමීව අණුරාධපුර දිස්ත්‍රික්කයේ ස්ථිර වහලක් නොමැති පවුල් සඳහා උළු බෙදා දීමේ වැඩ සටහන පිළිබඳ පරීක්ෂාව | 2013.09.26 | 2014.03.26 | අවශ්‍ය පැහැදිලි කිරීම් ඉදිරිපත් කර ඇත.අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් මගින් අදාල අනුමැතිය ලබාගෙන ඇත |
| 23 | වයිඑස්/ඕ/එම්ටීඩී/2013/වි.06 | අභිනවයෙන් නියෝජ්‍ය අමාත්‍ය ධුර ලැබූ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා අමාත්‍යාංශය වෙතින් ලබා දුන් වාහන පිළිබඳ පරීක්ෂාව | 2013.11.01 | 2013.12.18 | වාහන නැවත පවරානොගැනීමට හේතු පැහැදිලි කර ඇත |
| 24 | වයිඑස්/ඕ/එම්ටීඩී/2013/වි.08 | චීනයෙන් ගෙන්වා පවරා දෙනු ලැබූ මාර්ග සංවර්ධන යන්ත්‍ර පිරියත හා උපකරණ පිළිබඳ පරීක්ෂාව | 2013.12.10 | 2014.04.28 | විගණන විමසුමෙන් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කිරීමට පියවර ගෙන ඇති අතර පැහැදිලි කිරීම් අදාල ආයතන මගින් ලබාගෙන ඇත |
| 25 | වයිඑස්/ඕ/එම්ටීඩී/2013/වි.09 | ප්‍රාග්ධන ගෙවීම් ගිණුම්ගත කිරීම සම්බන්ධ පරීක්ෂාව | 2013.12.27 | 2014.02.28 | අතිරේක ප්‍රතිපාදන යටතේ මාරු පත්‍ර මගින් නිවැරදි කර ඇති අතර අනෙකුත් අවශ්‍ය පැහැදිලි කිරීම් ලබාදී ඇත |
| 26 | වයිඑස්/ඕ/එම්ටීඩී/එම්ඒපීටී/2012 | විසර්ජන ශීර්ෂය 105-ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය,කළමනාකරණ විගණන වාර්තාව-2012 | 2013.10.14 | 2013.12.18 | ප්‍රතිපාදන ඉතිරිවීම් පිළිබඳවද මු.රේ. 66 යටතේ ප්‍රතිපාදන මාරුකර ගැනීම පිළිබඳවද පාඩු පිළිබඳ ප්‍රකාශයේ හෙළිදරව කිරීම් සම්බන්ධවද පැහැදිලි කිරීම් කර ඇත |

*Prepared by – Planning and Monitoring Division*
*Ministry of Economic Development*
*No. 464/A, T. B. Jayah Mawatha, Colombo 10.*
*Tel : 011 2673568, 011 2676816*